# 2018

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்த செயற்திறன் அறிக்கை
# Annual Performance Report

කම්කරු දෙපාර්තමේන්තුව
தொழில் திணைக்களம்
**Department of Labour**



# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# කම්කරු දෙපාර්තමේන්තුව
# 2018

# පෙළ

පිටු අංකය


| | |
|---|---|
| **කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය** | i |
| **කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය** | ii |
| **කම්කරුකොමසාරිස්ජනරාල්තුමාගේපණිවුඩය** | iii |
| **1. කම්කරු දෙපාර්තමේන්තුව** | 1 |
| 1.1 හැඳින්වීම | 1 |
| 1.1.1 අරමුණු | 1 |
| 1.1.2 කාර්ය භාරය | 1 |
| 1.2 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය | 2 |
| 1.3 දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය | 3 |
| 1.4 සුවිශේෂ ක්‍රියාකාරකම් - 2018 | 6 |
| 1.5 ජාත්‍යන්තර සබඳතා | 9 |
| 1.5.1 ජාත්‍යන්තර කම්කරු සංවිධානය | 9 |
| **2 ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය සඳහා කාර්මික සාමය සුරක්ෂිත කිරීම** | 13 |
| 2.1 හැඳින්වීම | 13 |
| 2.2 කාර්යභාරය | 13 |
| **3. ශ්‍රමික අයිතීන් ප්‍රමිතිගත කිරීම** | 23 |
| 3.1 හැඳින්වීම | 23 |
| 3.2 බලාත්මක නෛතික විධිවිධාන | 23 |
| 3.3 නෛතික විධිවිධාන ක්‍රියාත්මක කිරීම | 23 |
| 3.4 ඉටුකරනු ලැබූ කාර්යයන් - 2018 | 25 |
| **4. ශ්‍රමිකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව හා අනතුරු රහිත වැඩ පරිසරය තහවුරු කිරීම** | 28 |
| 4.1 වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම | 28 |
| 4.1.1 හැඳින්වීම | 28 |
| 4.1.2 කාර්යභාරය | 28 |
| 4.1.3 වෘත්තීය ස්වස්ථතා අංශය මගින් ඉටුකරනු ලැබූ කාර්යයන් - 2018 | 29 |
| 4.2 අනතුරු රහිත වැඩ පරිසරය තහවුරු කිරීම | 30 |
| 4.2.1 හැඳින්වීම | 30 |
| 4.2.2 කාර්යභාරය | 30 |
| **5. ස්ත්‍රීන්, තරුණ ශ්‍රමිකයන්ගේ වෘත්තීය හිමිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම** | 35 |
| 5.1 හැඳින්වීම | 35 |
| 5.2 කාර්යභාරය | 35 |
| 5.3 බලාත්මක නෛතික විධිවිධාන | 35 |
| 5.4 කාර්යයන් ඉටුකිරීම - 2018 | 36 |
| 5.5 ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම - 2018 | 39 |
| 5.6 සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාත්මක කිරීම | 40 |
| **6. ශ්‍රමිකයාගේ සමාජ ආරක්ෂණය** | 41 |
| 6.1 හැඳින්වීම | 41 |
| 6.2 කාර්යභාරය | 41 |
| 6.3 අරමුදල ප්‍රවර්ධනය | 45 |
| 6.4 වෙනත් | 46 |
| **7. ශ්‍රමිකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා නෛතික රැකවරණය** | 47 |
| 7.1 හැඳින්වීම | 47 |
| 7.2 කාර්ය භාරය | 47 |

**8. පරිපාලනය** **48**

8.1 හැඳින්වීම 48

8.2 කාර්යභාරය 48

**9. මූල්‍ය කළමනාකරණය** **53**

9.1 හැඳින්වීම 53

9.2 කාර්යභාරය 53

**10 සංඛ්‍යා ලේඛන කටයුතු** **55**

10.1 හැඳින්වීම 55

10.2 කාර්යභාරය 55

**11 දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මගින් ඉලක්කයන් වෙත මෙහෙයවීම හා මානව සම්පත් සංවර්ධනය** **57**

11.1 හැඳින්වීම 57

11.2 දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මගින් ඉලක්කයන් වෙත මෙහෙයවීම 57

11.3 මානව සම්පත් සංවර්ධනය 59

**12. සේවා සැපයීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිත කිරීම** **65**

**13. අභ්‍යන්තර විගණනය** **66**

# වගු

පිටු අංකය


| | | |
|---|---|---|
| වගුව 1.1 | දෙපාර්තමේන්තු කාර්යමණ්ඩල වෙනස් වීම් - 2018 | 3 |
| වගුව 1.2 | දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය ජ්‍යෙෂ්ඨතා මට්ටම් අනුව - 2018 | 3 |
| වගුව 1.3 | ප්‍රධාන කාර්යාලයේ කාර්යමණ්ඩලය ජ්‍යෙෂ්ඨතා මට්ටම් අනුව - 2018 | 3 |
| වගුව 1.4 | ප්‍රධාන කාර්යාලයේ කාර්යමණ්ඩලය ජ්‍යෙෂ්ඨතා මට්ටම් අනුව - 2018 | 3 |
| වගුව 1.5 | කලාප කම්කරු කාර්යාල කාර්යමණ්ඩලය ජ්‍යෙෂ්ඨතා මට්ටම් අනුව - 2018 | 4 |
| වගුව 1.6 | දිස්ත්‍රික් කම්කරු කාර්යාල කාර්යමණ්ඩලය ජ්‍යෙෂ්ඨතා මට්ටම් අනුව - 2018 | 4 |
| වගුව 1.7 | උප කම්කරු කාර්යාල කාර්යමණ්ඩලය ජ්‍යෙෂ්ඨතා මට්ටම් අනුව - 2018 | 4 |
| වගුව 1.8 | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල කාර්යමණ්ඩලය ජ්‍යෙෂ්ඨතා මට්ටම් අනුව - 2018 | 4 |
| වගුව 1.9 | කම්කරු දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානීන් - 2018 | 5 |
| වගුව 1.10 | ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය යටතේ පැවැත්වූ වැඩසටහන් | 11 |
| වගුව 1.11 | ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය යටතේ දෙපාර්තමේන්තු නිලධරයන් සඳහා පැවැත්වූ වැඩසටහන් | 12 |
| වගුව 2.1 | මානව සම්පත් සංවර්ධන අංශය මගින් ඉටුකරනු ලැබූ කාර්යයන් - 2018 | 14 |
| වගුව 2.2 | වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත - 2018 | 18 |
| වගුව 3.1 | රු. 10,000/= ට අඩු අවම වැටුප් පවතින පඩි පාලක සභාවල අවම වැටුප් යාවත්කාලීන කිරීම - 2018 | 26 |
| වගුව 3.2 | අනුමැතිය / නීතිමය අර්ථකථන / නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම - 2018 | 26 |
| වගුව 3.3 | පඩිපාලක සභා තීරණ දමිළ මාධ්‍යයට පරිවර්තනය කිරීම - 2018 | 27 |
| වගුව 3.4 | නව පත්වීම් ලත් කම්කරු නිලධාරීන්හට ප්‍රගති සමාලෝචන හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම - 2018 | 27 |
| වගුව 4.1 | ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය - 2018 | 29 |
| වගුව 4.2 | අනතුරු විමර්ශනය - 2018 | 31 |
| වගුව 4.3 | දැනුවත් කිරීමේ වැඩසටහන් - නිෂ්පාදන ක්ෂේත්‍රය අනුව | 32 |
| වගුව 4.4 | දැනුවත් කිරීමේ වැඩසටහන් - වෙනත් | 33 |
| වගුව 4.5 | නිලධාරි පුහුණු වැඩසටහන් | 33 |
| වගුව 4.6 | කර්මාන්තමය සුරක්ෂිතතා අංශයේ කාර්ය ඉටු කිරීමේ ප්‍රගතිය - 2018 | 34 |
| වගුව 5.1 | රැකියාවක නියුතු කාන්තාවන් තරුණ අය හා ළමුන් පිළිබඳ පවතින නීති ක්‍රියාත්මක කිරීම - 2018 | 37 |
| වගුව 5.2 | අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම - 2018 | 37 |
| වගුව 5.3 | ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය - 2018 | 39 |
| වගුව 5.4 | සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය - 2018 | 40 |
| වගුව 6.1 | දායක මුදල් අයකර ගැනීම සඳහා ලියාපදිංචි කිරීම් - 2018 | 42 |
| වගුව 6.2 | දායක මුදල් නිසි පරිදි නොගෙවන සේවා යෝජකයන් වෙත කරන ලද දැනුම් දීම් - 2018 | 42 |
| වගුව 6.3 | සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 2016 සිට 2018 දක්වා | 44 |
| වගුව 6.4 | අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය ප්‍රගතිය - 2018 | 45 |
| වගුව 6.5 | සේවක අර්ථසාධක අරමුදල පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා පැවැත්වූ ජංගම සේවා වැඩසටහන් හා නිලධාරීන් දැනුවත් කිරීම සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන් | 46 |
| වගුව 7.1 | අධිකරණ අනුව නඩු වල කාර්යසාධනය - 2018 | 48 |
| වගුව 7.2 | මහේස්ත්‍රාත් අධිකරණ නඩු - 2018 | 48 |
| වගුව 9.1 | 2018 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සමස්ත මූල්‍ය ප්‍රගතිය | 53 |
| වගුව 9.2 | 2018 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් වර්ගීකරණය | 53 |
| වගුව 9.3 | 2018 වර්ෂයේ පුනරාවර්තන වියදම් වර්ගීකරණය | 54 |
| වගුව 10.1 | ඉටු කරනු ලැබූ කාර්යයන් - 2018 | 56 |
| වගුව 11.1 | පැවැත්වූ පුහුණු වැඩසටහන් - 2018 | 64 |
| වගුව 11.2 | ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් සඳහා 2018.12.31 දිනට සමස්ත වියදම - 2018 | 64 |
| වගුව 11.3 | වෙබ් අඩවිය හරහා දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සේවා - 2018 | 65 |

# ප්‍රස්තාර


| | | පිටු අංකය |
|---|---|---|
| ප්‍රස්තාරය 2.1 | සේවා ස්ථාන (ශ්‍රමික) පරීක්ෂණ - 2018 | 15 |
| ප්‍රස්තාරය 2.2 | කම්කරු නිලධරයෙකු මාසිකව සිදු කල සේවා ස්ථාන (ශ්‍රමික) පරීක්ෂණ සංඛ්‍යාවේ සාමාන්‍යය - 2018 | 16 |
| ප්‍රස්තාරය 2.3 | සේවක අයිතීන් කඩවීම පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් - 2018 | 17 |
| ප්‍රස්තාරය 2.4 | කාර්මික ආරවුල් පිලිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් - 2018 | 18 |
| ප්‍රස්තාරය 2.5 | සාමූහික ගිවිසුම් ලියාපදිංචි කිරීම - 2018 | 19 |
| ප්‍රස්තාරය 2.6 | කාර්මික අධිකරණ කටයුතු - 2016, 2017, 2018 | 19 |
| ප්‍රස්තාරය 2.7 | පාරිතෝෂික නොගෙවීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් - 2018 | 20 |
| ප්‍රස්තාරය 2.8 | වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම හා අවලංගු කිරීම - 2018 | 21 |
| ප්‍රස්තාරය 2.9 | විශේෂ විමර්ෂණ කටයුතු - 2018 | 22 |
| ප්‍රස්තාරය 4.1 | කර්මාන්තශාලා ආඥා පනත යටතේ ගන්නා ලද අධිකරණ ක්‍රියාමාර්ග - 2018 | 31 |
| ප්‍රස්ථාරය 6.1 | දායක මුදල් අයකර ගැනීම ප්‍රගතිය | 43 |
| ප්‍රස්ථාරය 6.2 | ප්‍රතිලාභ අයදුම්පත් ලැබීම් හා තීරණ ලිපි ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යැවීම් - 2018 | 45 |
| ප්‍රස්ථාරය 7.1 | සියලුම දිස්ත්‍රික් කාර්යාල මගින් පවරන ලද සහ විසඳී ඇති නඩු - 2018 | 48 |


# ඡායාරූප


| | | පිටු අංකය |
|---|---|---|
| ඡායාරූපය 2.1 | අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන වල සේවායෝජක - සේවක කතිකාව - 2018 දෙපාර්තමේන්තු නිලධරයන් | 13 |
| ඡායාරූපය 2.2 | අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන වල සේවායෝජක - සේවක කතිකාව - 2018 සේවායෝජක සේවක සහභාගීත්වය | 13 |
| ඡායාරූපය 2.3 | කම්කරු කොමසාරිස් ජනරාල්තුමා සභාව ඇමතීම | 14 |
| ඡායාරූපය 2.4 | අමාත්‍යාංශ ලේකම්තුමා සහ කම්කරු කොමසාරිස් ජනරාල්තුමා තරඟයට ඉදිරිපත් කල චිත්‍ර නරඹමින් | 14 |
| ඡායාරූපය 4.1 | 2018-11-16 දින තේ කර්මාන්තශාලා සේවකයින් සඳහා නුවරඑළිය දිස්ත්‍රික් කම්කරු කාර්යාල ශ්‍රවනාගාරයේ පැවැත්වූ වැඩමුළුව | 32 |
| ඡායාරූපය 4.2 | 2018-05-24 දින කුරුණෑගල කාර්මික විද්‍යාලයේ පැවැත්වූ වැඩමුළුව | 32 |
| ඡායාරූපය 5.1 | දකුණු අප්‍රිකාවේ කම්කරු අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිතුමන් සහ කම්කරු කොමසාරිස් ජනරාල් හමුව | 38 |
| ඡායාරූපය 8.1 | පොළොන්නරුව දිස්ත්‍රික් කම්කරු කාර්යාල ගොඩනැගිල්ල අතිගරු ජනාධිපතිතුමාගේ සුරතින් 2018.03.30 දින විවෘත කල අවස්ථාව | 50 |
| ඡායාරූපය 8.2 | කම්කරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ප්‍රදර්ශන කුටියේ ඡායාරූප කිහිපයක් | 50 |
| ඡායාරූපය 8.3 | සේවා ලාභීන් ලියාපදිංචි කටයුතු සිදුකිරීම | 51 |
| ඡායාරූපය 8.4 | කම්කරු කෞතුකාගාරය | 52 |
| ඡායාරූපය 11.1 | සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් කිහිපයක් | 60 |



## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය

කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය තුළ සැලසුම් කර සාර්ථකව ඉටු කරන ලද සේවාවන් ඇතුලත් කාර්යසාධන වාර්තාව සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම ඉමහත් සතුටට කරුණකි.

ජාතික ආර්ථිකය ප්‍රවර්ධනය උදෙසා යහපත් වැඩබිම් පරිසරයක් ස්ථාපිත කිරීම උදෙසා වග කියනු ලබන ප්‍රධානතම රාජ්‍ය ආයතනය වන කම්කරු දෙපාර්තමේන්තුව මේ වන විට, ක්‍රමික වර්ධනයක් සහිත දිගු ගමන් මගක් සනිටුහන් කර ඇත.

පෙර වර්ෂවල මෙන්ම 2018 වර්ෂය තුලද කම්කරු දෙපාර්තමේන්තුව සිය සේවා ලාභීන් වෙත වඩාත් කාර්යක්ෂමව සේවා ලබා දීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. සේවක සේවා යෝජක පාර්ශව අතර සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීමට දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන තිබීම ප්‍රශංසනිය වේ. එම ක්‍රියා මාර්ගයන් කාර්මික ආරවුල් සහ වැඩ වර්ජන අවම කරමින් රට තුල කාර්මික සාමය සුරක්ෂිත වීම පිණිස හේතු සාධක වී ඇත.

මේවන විට භාවිතයේ පවතින, කාලීන නොවන කම්කරු නීති සංශෝධනය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කිරීම අගය කලයුතු වේ. සාප්පු හා කාර්යාල සේවක පනත, ප්‍රසූතිකාධාර ආඥා පනත සහ ස්ත්‍රීන්, තරුණ අය සහ ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ පනත සඳහා හඳුන්වා දෙනු ලැබූ සංශෝධන, සේවා නියුක්ත ස්ත්‍රීන් සඳහා වඩාත් යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කර දීමටත් ස්ත්‍රීන්ගේ හා තරුණ අයගේ අයිතිවාසිකම් තව දුරටත් සුරක්ෂිත කිරීමටත් ඉවහල් වීඇත. මේ අනුව, ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය ශක්තිමත් කොට ආර්ථික සංවර්ධනයේලා තෘප්තිමත් කොටස්කරුවන් බවට පත්කර ගැනීම සඳහා සේවා කොන්දේසි ඇතුලත් කර එක් පනතක් හඳුන්වා දීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. එමගින් මෙරට සේවක ප්‍රජාවට දැනට වඩා වැඩි ප්‍රතිලාභ භුක්ති විඳීමට හැකිවනු ඇත.

මෙම සියලු කාර්යයන් සපුරාලීම සඳහා කැපවී ක්‍රියා කල කම්කරු කොමසාරිස් ජනරාල්තුමා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ සේවය අතිශයින් අගය කරන අතර ඔවුන් වෙත මාගේ හෘදයාංගම කෘතඥතාවය පිරිනමමි.

**රවීන්ද්‍ර සමරවීර**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය



## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධානතම ආයතනය වන කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සම්බන්ධයෙන් මා අතිශයින් සතුටු වෙමි.

පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයට බලපාන කම්කරු නීති හා අණපනත් ක්‍රියාත්මක කරනු ලබන කම්කරු දෙපාර්තමේන්තුව 2018 වර්ෂයේදීද සමාජ කතිකාවත ප්‍රවර්ධනය, කාර්මික ආරවුල් විසඳීම, වැඩවර්ජන අවස්ථා වලදී මැදිහත්ව සේවක සේවා යෝජක දෙපාර්ශවය සමථකරණය, සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රවර්ධන කටයුතු, සේවකයන්ගේ වෘත්තීය හා සෞඛ්‍ය සුරක්ෂිතතාවය ඇති කිරීම ඇතුළු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති සියලු කාර්යයන් සඵලදායී ලෙස ඉටු කර තිබීම ප්‍රශංසනීය වේ.

2016 වර්ෂයේදී දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගතකරණ කටයුතු ආරම්භ කරන ලද අතර, 2018 වර්ෂයේදීද එහි ඉදිරි කටයුතු අඛණ්ඩව කරගෙන යාමට හැකියාව ලැබී ඇත. ඒ අනුව ඉදිරි වර්ෂ කිහිපය තුල දෙපාර්තමේන්තුව විසින් මහජනයා වෙත ලබා දෙන සේවා තවදුරටත් වර්ධනය වීම අපේක්ෂා කලහැක.

දෙපාර්තමේන්තුව සතු භූමියෙහි ඉදි කෙරෙමින් පවතින 'මෙහෙවර පියෙස' ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර, අභ්‍යන්තර සැකසුම් කටයුතු නිම කිරීමෙන් අනතුරුව ඉදිරි වර්ෂයේදී විවෘත කිරීමට නියමිතය. ඒ අනුව, සේවාලාභීන් වෙත එකම සේවා පියසක් තුලදී සේවා ලබා ගැනීමේ පහසුකම වර්ධනය වනු ඇත.

කම්කරු දෙපාර්තමේන්තු ඉලක්කයන් කරා ළඟා වීම සඳහා කැපවීමෙන් කටයුතු කල කම්කරු කොමසාරිස් ජනරාල්තුමා ඇතුළු දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය වෙත සිය ඉදිරි කටයුතුද සාර්ථකව කර ගෙන යාම සඳහා සියලු ශක්තිය හා ධෛර්යය ප්‍රාර්ථනා කරමි.

**එස්. ඒ. එන්. සරණතිස්ස**
ලේකම්
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය



## කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය

2018 වර්ෂයේදී කම්කරු දෙපාර්තමේන්තුව ලද සුවිශේෂී ජයග්‍රහනයන්ගේ සම්පිණ්ඩනයක් වන මෙම කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි.

2018 වර්ෂයේදී සිදු කරන ලද කම්කරු පරීක්ෂණයන් සංඛ්‍යාත්මක භාවයෙන් හා ගුණාත්මක භාවයෙන් ප්‍රගතියක් අත් කර ගෙන ඇති අතර, ලැබෙන පැමිණිලි විසඳීමේ කටයුතු සහ නෛතික කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කිරීමට හැකිවී ඇත.

2018 වර්ෂයේදී දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන් අධීක්ෂණය කිරීමේ කටයුතු වඩාත් විධිමත් ක්‍රියාවලියක් ලෙස ක්‍රියාත්මක කරන ලද අතර, එමගින් සියලු කම්කරු කාර්යාල දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ඉලක්ක කරා විධිමත්ව යොමු කරන ලදී. 2017 වර්ෂයේදී බඳවා ගන්නා ලද නවක කම්කරු නිලධරයන් ද ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ සේවය වඩාත් ඵලදායිව හා කාර්යක්ෂමව යොදා ගැනීම මේ සඳහා හේතු සාධක වී ඇත.

සේවක සේවායෝජක සබඳතාවයන් වර්ධනය කිරීම සඳහා සමාජ කතිකාවත ප්‍රවර්ධනය තුලින් හැකියාව ලැබී ඇත. එසේම කාලීන තත්ත්වයන්ට නොගැලපෙන, කම්කරු අණ පනත් කිහිපයක් සංශෝධනය කිරීමට සහ එමගින්, සේවකයන් ශ්‍රීලංකාවේ ආර්ථික සංවර්ධනයේලා තෘප්තිමත් කොටස් කරුවන් බවට පත්කර ගැනීම පිණිස එක් පනතක් හඳුන්වා දීම සඳහා ලැබී ඇති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත නව පනත සැකසීමේ කටයුතු ආරම්භ කිරීමට ලැබීම සේවක පාර්ශවය වෙනුවෙන් ගන්නා ලද සාධනීය පියවරකි.

2018 වර්ෂය තුල ඉහළ කාර්ය සාධනයක් සාක්ෂාත් කර ගැනීමට දායකවූ කම්කරු දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පිරිනමමි. එසේම, කම්කරු දෙපාර්තමේන්තුවට නිසි මඟ පෙන්වන සහ ධෛර්යය ලබා දෙන කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය වෙතද මාගේ හෘදයාංගම කෘතඥතාවය පුදකර සිටිමි. මෙම කාර්ය සාධන වාර්තාව පෙර වසරවලට වෙනස් නවමු මුහුණුවරකින් ඉදිරිපත් කිරීම සඳහා වෙහෙසවී කටයුතු කල සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය වෙතද මාගේ ස්තුතිය පිරිනමමි.

**ඒ. විමලවීර**
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව

# 1. කම්කරු දෙපාර්තමේන්තුව

## 1.1 හැඳින්වීම

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ පවත්නා කම්කරු දෙපාර්තමේන්තුව, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු ශ්‍රමිකයන්ගේ වෘත්තීය හිමිකම් තහවුරු කිරීම හා සමාජ ආරක්ෂණය ඇති කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනයයි. මෙම විෂය මධ්‍යම රජය යටතේ පාලනය වන්නක් හෙයින් දෙපාර්තමේන්තුව විසින් ඊට අදාල අණ පනත් ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය ප්‍රවර්ධනය කිරීම් සිදු කිරීම සඳහා, දීප ව්‍යාප්තව කම්කරු කාර්යාල පවත්වා ගනිමින් පැවරී ඇති වගකීම ඉටු කරනු ලබයි.

මෙම දෙපාර්තමේන්තුව අද වන විට පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවක ප්‍රජාවගේ රැකියා සුරක්ෂිතතාවය සහ සුභ සාධනය වෙනුවෙන් ක්‍රියාත්මක වන ප්‍රමුඛ ආයතනය වන අතර, 1923 අංක 01 දරන ඉන්දියානු ආගාමික කම්කරු ආඥා පනතට අනුව 1923 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ වතුවල සේවය කිරීම සඳහා බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ඉන්දියාවේ සිට මෙරටට ගෙන්වන ලද කම්කරුවන්ට සුබසාධනය සැපයීමේ අරමුණින් මෙම දෙපාර්තමේන්තුව මුල් වරට පිහිටුවා ඇත.

### දැක්ම

"අන්තර්ජාතිකව තරගකාරී ආර්ථිකයක් සඳහා කල්පවත්නා කාර්මික සාමයක් සහිත රටක්"

### මෙහෙවර

"කම්කරු අයිතීන් ආරක්ෂා කරමින්, තහවුරු කරන ලද කාර්මික සාමය සහිත සුනිසි වැඩ පරිසරයක් තුලින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම"

### 1.1.1 අරමුණු

- අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවා ආයතන තුල ස්ථිරසාර කාර්මික සාමය තහවුරු කිරීම
- සුනිසි වැඩ පරිසරයක් ඇති කිරීම හා ශ්‍රම ප්‍රමිතීන් සකස් කිරීම මගින් ශ්‍රමිකයාගේ සේවා තත්ත්වය වැඩි දියුණු කිරීම
- ශ්‍රමිකයාගේ සමාජ ආරක්ෂණය තහවුරු කිරීම
- ස්ත්‍රීන් හා තරුණ අයගේ වෘත්තීමය සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ළමා ශ්‍රමය තුරන් කිරීම
- ශ්‍රමිකයන්ගේ සෞඛ්‍ය තත්ත්වයන්ට හිතකර හා අනතුරු රහිත වැඩ පරිසරයක් නිර්මාණය කිරීම

### 1.1.2 කාර්ය භාරය

- ආයතන වල සේවා යෝජකයන් හා සේවකයන් අතර කතිකාවත ප්‍රවර්ධනයකිරීම
- කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම හා සමාජ කතිකාවත ප්‍රවර්ධනය මගින් කාර්මික ආරවුල් ඇතිවීම වැළැක්වීම හා ඇතිවූ ආරවුල් නිරවුල් කිරීම
- ඵලදායීව ආයතන පරීක්ෂණ (ශ්‍රමික පරීක්ෂණ) සිදු කිරීම සහ ඒ සඳහා දෙපාර්තමේන්තු නිලධරයන්ට ඇවැසි දැනුම නිරන්තරව යාවත්කාලීන කිරීම මගින් ශ්‍රමිකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් තහවුරු කිරීම.
- සේවක, සේවා යෝජක දෙපාර්ශවය තුල කම්කරු නීති පිළිබඳව පවතින දැනුම හා අවබෝධය පුළුල් කිරීම තුලින් කාර්මික සාමය තහවුරු කිරීම.
- ජාතික ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් අනුව උචිත වන්නා වූ ශ්‍රම ප්‍රමිතීන්, අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව යමින් සැකසීම හා ක්‍රියාවට නැංවීම.
- සේවක අර්ථසාධක අරමුදල මනා ලෙස පරිපාලනය කිරීම තුළින් හිමිකරුවන්ට ප්‍රතිලාභ නියමිත පරිදි ලබා දීම තහවුරු කිරීම සහ එපරිදිම අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල් හා විශ්‍රාම දීමනා ක්‍රම පිළිබඳ පරිපාලනය.
- ස්ත්‍රීන්, තරුණ අය හා ළමුන් පිළිබඳ කම්කරු නීති ඇතුලු සියලු කම්කරු නීති සාධනීය ලෙස ක්‍රියාවට නැංවීම
- වැඩ බිම තුළ සෞඛ්‍ය ආරක්ෂිත බව හා අනතුරු රහිත බව පිළිබඳව ශ්‍රමිකයන් දැනුවත් කිරීම, සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම හා අනතුරු රහිත බව තහවුරු කිරීම.
- ඉහත කාර්යයන් සඳහා තීරණ ගැනීමට අවශ්‍ය සංඛ්‍යාලේඛන දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය.
- ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් නීතියෙන් හා භාවිතයෙන් බලාත්මක කිරීමට කටයුතු කිරීම.
- ළමා ශ්‍රමය හා අනතුරුදායක ළමා ශ්‍රමය තුරන් කිරීමට කටයුතු කිරීම.

## 1.2 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



## 1.3 දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය

| | |
|---|---|
| වර්ෂය ආරම්භයේ සිටි මුළු සේවක සංඛ්‍යාව | 2495 |
| දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද නව බඳවා ගැනීම් | 50 |
| ඒකාබද්ධ සේවයේ නව පත්වීම් ලෙස දෙපාර්තමේන්තුවට පැමිණීම් | 275 |
| ස්ථාන මාරු වීම් (ශුද්ධ) | (15) |
| විවිධ හේතුන් මත දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට එකතු වීම් | 1 |
| විශ්‍රාම යාම් | (56) |
| වෙනත් හේතුන් මත දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයෙන් ඉවත් වීම් | (81) |
| වර්ෂය අවසානයේ මුළු සේවක සංඛ්‍යාව | 2669 |

වගුව 1.1 - දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල වෙනස් වීම් - 2018

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2018.12.31 දිනට සිටි සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 210 | 150 | 60 |
| තෘතීය  මට්ටම | 668 | 514 | 154 |
| ද්විතීය මට්ටම | 1762 | 1553 | 209 |
| ප්‍රාථමික මට්ටම | 489 | 452 | 37 |
| එකතුව | 3129 | 2669 | 460 |

වගුව 1.2 - දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ජ්‍යෙෂ්ඨතා මට්ටම් අනුව - 2018

දෙපාර්තමේන්තුවේ අනුමතසමස්ත කාර්ය මණ්ඩලය 3129 ක් වන අතර මින් 15%ක ප්‍රතිශතයක් පුරප්පාඩු වශයෙන් පවතී. එමෙන්ම, ජ්‍යෙෂ්ඨ හා තෘතීය මට්ටමේ පුරප්පාඩු සංඛ්‍යාව 25%කි. ඒ අනුව, අධීක්ෂන හා මෙහෙයුම් මට්ටමේ විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතීම දෙපාර්තමේන්තුවේ නව්‍යතා ඇති කිරීම හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපානු ලබයි.

අංශයන් අනුව සහ කම්කරු කාර්යාලයන් අනුව කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2018.12.31 දිනට සිටි සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| කම්කරු කොමසාරිස් ජනරාල් | 1 | 1 | 0 |
| අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (ශ්‍රී.ලං.ප.සේ) | 1 | 1 | 0 |
| අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (දෙපාර්තමේන්තු) | 1 | 0 | 1 |
| අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (ඉංජිනේරු) | 1 | 0 | 1 |

වගුව 1.3 -  ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය ජ්‍යෙෂ්ඨතා මට්ටම් අනුව- 2018

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2018.12.31 දිනට සිටි සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 33 | 16 | 17 |
| තෘතීය මට්ටම | 44 | 23 | 21 |
| ද්විතීය මට්ටම | 138 | 119 | 19 |
| ප්‍රාථමික මට්ටම | 42 | 37 | 7 |
| එකතුව | 257 | 195 | 64 |

වගුව 1.4 -  ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය ජ්‍යෙෂ්ඨතා මට්ටම් අනුව-2018

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2018.12.31 දිනට සිටි සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම * | 109 | 64 | 47 |
| තෘතීය මට්ටම ** | 118 | 50 | 68 |
| ද්විතීය මට්ටම *** | 496 | 332 | 164 |
| ප්‍රාථමික මට්ටම **** | 139 | 133 | 6 |
| එකතුව | 862 | 579 | 285 |

වගුව 1.5 - කලාප කම්කරු කාර්යාල කාර්ය මණ්ඩලය ජ්‍යෙෂ්ඨතා මට්ටම් අනුව - 2018

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2018.12.31 දිනට සිටි සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම * | 40 | 35 | 5 |
| තෘතීය මට්ටම ** | 413 | 354 | 59 |
| ද්විතීය මට්ටම *** | 944 | 914 | 33 |
| ප්‍රාථමික මට්ටම **** | 245 | 219 | 25 |
| එකතුව | 1642 | 1522 | 122 |

වගුව 1.6 - දිස්ත්‍රික් කම්කරු කාර්යාල කාර්ය මණ්ඩලය ජ්‍යෙෂ්ඨතා මට්ටම් අනුව - 2018

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2018.12.31 දිනට සිටි සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| තෘතීය මට්ටම ** | 77 | 67 | 10 |
| ද්විතීය මට්ටම *** | 131 | 133 | -2 |
| ප්‍රාථමික මට්ටම **** | 34 | 40 | -6 |
| එකතුව | 242 | 240 | 2 |

වගුව 1.7 - උප කම්කරු කාර්යාල කාර්ය මණ්ඩලය ජ්‍යෙෂ්ඨතා මට්ටම් අනුව - 2018

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2018.12.31 දිනට සිටි සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම * | 20 | 20 | 0 |
| තෘතීය මට්ටම ** | 20 | 2 | 18 |
| ද්විතීය මට්ටම *** | 40 | 34 | 6 |
| ප්‍රාථමික මට්ටම **** | 30 | 22 | 8 |
| එකතුව | 110 | 78 | 32 |

වගුව 1.8 - දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල කාර්ය මණ්ඩලය ජ්‍යෙෂ්ඨතා මට්ටම් අනුව - 2018

## සටහන

*** ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් නිලධරයන්**

කම්කරු කොමසාරිස් ජනරාල්, අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (ශ්‍රී. ලං. ප. සේ), අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (දෙපා.), අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (ඉංජිනේරු), වෛද්‍ය නිලධාරී : වෛද්‍ය නිලධාරී / වෛද්‍ය නිලධාරී (පර්යේෂණ), කම්කරු කොමසාරිස් (ශ්‍රී.ලං.ප.සේ.), කම්කරු කොමසාරිස් (දෙපා.), කම්කරු කොමසාරිස් (කර්මාන්තමය සුරක්ෂිතතා) හා ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (ශ්‍රී.ලං.ඉ.සේ), කම්කරු කොමසාරිස් (ශ්‍රී.ලං.වි.සේ. / ශ්‍රී.ලං.වෛ.සේ) , ප්‍රධාන ගණකාධිකාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන නීති නිලධාරී සහ කම්කරු කොමසාරිස් (නීති ක්‍රියා), නියෝජ්‍ය කම්කරු කොමසාරිස් / නියෝජ්‍ය ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (ශ්‍රී.ලං.ඉ.සේ), නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (ශ්‍රී.ලං.ප.සේ.), නියෝජ්‍ය

කම්කරු කොමසාරිස් (දෙපා), නි. කම්. කො. හා විශේෂඥ පර්යේෂණ නිලධාරී (ශ්‍රී.ලං.වි.සේ.), ගණකාධිකාරී, සහකාර කම්කරු කොමසාරිස් (ශ්‍රී.ලං.ප.සේ.), සහකාර කම්කරු කොමසාරිස් (දෙපා), නීති නිලධාරී, සහකාර අධ්‍යක්ෂ - සැලසුම්, විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (විදුලි සුරක්ෂිතතා), විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (අධි අවධානම් යන්ත්‍ර සුරක්ෂිතතා), විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (ඉදිකිරීම් සුරක්ෂිතතා), විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු (රසායනික / යාන්ත්‍රික සුරක්ෂිතතා), විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු, සිවිල් ඉංජිනේරු - (ශ්‍රී.ලං.ඉං.සේ.), කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු - (ශ්‍රී.ලං.ඉං.සේ.), රසායන ඉංජිනේරු, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී - (ශ්‍රී.ලං.වි.සේ.), පර්යේෂණ නිලධාරී - (ශ්‍රී.ලං.වි.සේ.), සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.තො.ස.තා.සේ.)

**** තෘතීය මට්ටමට අයත් නිලධරයන්**

පුස්තකාලයාධිපති (අධිශ්‍රේණිය), තාක්ෂණ නිලධාරී (ශ්‍රී.ලං.තා.සේ. විශේෂ පන්තිය), ඇඟිලි සටහන් පරීක්ෂණ නිලධාරී. (විශේෂ පන්තිය ශ්‍රී.ලං.තා.සේ), කම්කරු නිලධාරී (අධිශ්‍රේණිය), ලේඛකාධිකාරී, තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නිලධාරී, භාෂා පරිවර්තක (සිංහල- ඉංග්‍රීසි), භාෂා පරිවර්තක (දෙමළ- ඉංග්‍රීසි), භාෂා පරිවර්තක (සිංහල - දෙමළ), පරිපාලන නිලධාරී, කම්කරු නිලධාරී

***** ද්විතීය මට්ටමට අයත් නිලධරයන්**

ක්ෂේත්‍ර නිලධාරී, මානව සම්පත් සංවර්ධන නිලධාරී, සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරී (සිවිල්), තාක්ෂණ නිලධාරී (විදුලි), ඇඟිලි සටහන් පරීක්ෂණ නිලධාරී, පර්යේෂණ සහකාර, ගොඩනැගිලි පරීක්ෂක, සැලසුම් ශිල්පී, පුස්තකාලයාධිපති, කළමනාකරණ සහකාර සේවය, ලඝුලේඛක, ස්ථානභාර නිලධාරී, නේවාසිකාගාර පාලිකා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර, ප්‍රවාහන නිලධාරී

****** ප්‍රාථමික මට්ටමට අයත් නිලධරයන්**

රියදුරු, විදුලි කාර්මික, වඩු කාර්මික, පයිප්ප වැද්දුම්කරු, සංචාරක බංගලා භාරකරු, කාර්යාල සේවක සේවය, මුරකරු, ලොරි පවිත්‍රකරු

| | අංශය | තනතුර | නම |
|---|---|---|---|
| 1 | කම්කරු කොමසාරිස් ජනරාල් | | ඒ. විමලවීර මයා |
| 2 | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (පරිපාලන) | | සී. එන්. විතානාච්චි මයා |
| 3 | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (දෙපාර්තමේන්තු) (වැ.බ.) | | ජනක පරණමාන මයා |
| 4 | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (ඉංජිනේරු) (වැ.බ.) | | ඩබ්ලිව්.අයි.සී.ඩී.ආර්.ප්‍රනාන්දු මයා |
| 5 | කාර්මික සම්බන්ධතා අංශය | කම්කරු කොමසාරිස් | කේ. ඩී. මනෝජ් ප්‍රියන්ත මයා |
| 6 | මානව සම්පත් සංවර්ධන අංශය (සමාජ කතිකා හා වැඩපොල සහයෝගිතා ඒකකය) | කම්කරු කොමසාරිස් | එල්. ඩී. සී. ජයසීලි මිය |
| 7 | විශේෂ විමර්ශන අංශය | කම්කරු කොමසාරිස් | එන්. ජෙගදීශ්වරන් මිය |
| 8 | ශ්‍රම ප්‍රමිති අංශය | කම්කරු කොමසාරිස් | ජනක පරණමාන මයා |
| 9 | කර්මාන්තමය සුරක්ෂිතතා අංශය | කම්කරු කොමසාරිස් | එල්. ජී. ජැන්ස් මයා |
| 10 | වෘත්තීය ස්වස්ථතා අංශය | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | වෛද්‍ය වජිර එම්. පලීපාන මයා |
| 11 | කාන්තා හා ළමා කටයුතු අංශය | කම්කරු කොමසාරිස් | මාධවී එන්. ගුණවර්ධන මිය |
| 12 | සේවක අර්ථසාධක අරමුදල් අංශය | කම්කරු කොමසාරිස් | ඩී. පී. කේ. ආර්. වීරකෝන් මයා |
| 13 | නීති ක්‍රියා අංශය | කම්කරු කොමසාරිස් | ඩබ්ලිව්. ඒ. ඩී. කේ. මිලංග මයා |
| 14 | පාලන අංශය | කම්කරු කොමසාරිස් | ජී. ඩබ්ලිව්. එන්. විරාජි මිය |
| 15 | මුදල් අංශය | ප්‍රධාන ගණකාධිකාරී | ඩී. කේ. ඩී. ජී. ලක්මාලි මෙය |
| 16 | සංඛ්‍යාලේඛන අංශය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) | ඩී. බී. වීරවර්ණ මයා |
| 17 | සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය | කම්කරු කොමසාරිස් | එම්. ඩී. එම්. ඩී. කරුණාතිලක මිය |

| | | | |
|---|---|---|---|
| 18 | අභ්‍යන්තර විගණන අංශය | ප්‍රධාන අභ්‍යන්තර විගණක | අයි. එල්. සෝමසිරි මයා |
| 19 | ඉදිකිරීම් හා ගොඩනැගිලි නඩත්තු අංශය | ඉංජිනේරු (සිවිල්) | ජී. එච්. ආර්. එස්. ඊ. සිල්වා මිය |
| 20 | පුස්තකාලය | පුස්තකාලයාධිපති | එච්. රේණුකා කුමාරි ජයවර්ධන මිය |

වගුව 1.9. කම්කරු දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානීන් - 2018

## 1.4 සුවිශේෂ ක්‍රියාකාරකම් - 2018

ශ්‍රමික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, ශ්‍රමික අයිතිවාසිකම් ඉල්ලුම් කිරීමේදී සංකීර්ණ හා ගැටලු සහගත තත්ත්ව ඇතිවීමෙන් අයිතිවාසිකම් ලබා ගැනීමට බාධා ඇතිවීම පාලනය කිරීම පිණිස එම කරුණු කෙරෙහි බලපවත්වනු ලබන නීති රීති සරල කිරීම හා යම් අයිතියක් ලබා ගැනීම සඳහා පවතින නීති ශක්තිමත් නොමැති විට,අවශ්‍ය පදනම ලබා දීම සඳහා නිසි සංශෝධන සිදු කිරීම හෝ නව නීති සම්පාදනය මගින් ශ්‍රමිකයාගේ ව්‍යවස්ථාපිත අයිතීන් තහවුරු කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව නිරන්තරව උත්සහ දරනු ලබයි. නෛතික අවකාශය පුළුල් කිරීම සඳහා, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම මගින් 2018 වසරේ දී කම්කරු දෙපාර්තමේන්තුව අරඹන ලද හෝ අවසන් ප්‍රතිඵලයට ලඟාවූ එබඳු ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

### 1.4.1 විදේශ රටවල සේවය කරන ශ්‍රමිකයන්හට සමාජ ආරක්ෂණ අරමුදලට (Social Security Fund) මුදල් දායක කිරීමේදීත් ප්‍රතිලාභ අයදුම් කිරීමේදීත් මතු වන නීතිමය සහ ප්‍රායෝගික ගැටළු විසඳුම් ලබාදීම

ශ්‍රී ලංකාවේ සේවය කරන විදේශිකයන්ට සහ විදේශ රටවල සේවය කරන ශ්‍රී ලාංකිකයන්ට තමා සේවය කරන රටේ නීතිරීති වලට අනුව එම රටෙහි පවතින සමාජ ආරක්ෂණ අරමුදලට (Social Security Fund) මුදල් දායක කිරීමේදීත් ප්‍රතිලාභ අයදුම් කිරීමේදීත් නීතිමය සහ ප්‍රායෝගික ගැටළු ඇතිවේ. එනම්, විදේශ රටක රැකියාව කරන කාලය තුල තම රටේ සමාජ ආරක්ෂණ අරමුදලට අඛණ්ඩව දායක කිරීමට නොහැකි වීම මත සාමාජිකත්වය අහිමි වීම, විදේශ රටට අයත් සමාජ ආරක්ෂණ අරමුදලට (Social Security Fund) දායක කර ඇති මුදල් නැවත මව් රටට පැමිණෙන විට ප්‍රතිලාභ ලෙස ලබා ගැනීමට නොහැකිවීම වේ.

මෙම ගැටළුව විසඳීමට දැනට ලෝකයේ පවතින ක්‍රමවේදය වන්නේ කිසියම් රටක් විසින් අනෙක් රටවල් සමඟ සමාජ ආරක්ෂණ ගිවිසුම් වලට එළඹීමයි. ඒ සඳහා සේවක අර්ථසාධක අරමුදලට අදාලව විදේශ රටවල් සමඟ සමාජ ආරක්ෂණ ගිවිසුම් (Social Security Agreements) අත්සන් කිරීමට හැකිවන පරිදි සේවක අර්ථසාධක අරමුදල් පනත සහ රෙගුලාසි සංශෝධනයට අදාලව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර මේ වන විට අනුමැතිය ලබා ගෙන ඇත.

### 1.4.2 සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි නොකිරීම මත, ශ්‍රමිකයා මුහුණදෙන දුෂ්කරතා තුරන් කිරීම

මේ වනවිටත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ අයදුම් කිරීමට පැමිණෙන සාමාජිකයන් ප්‍රමාණයෙන්, තුනෙන් එකකට පමණ සේවායෝජකයා විසින් එම සේවකයන් කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොමැති වීම මත ශ්‍රී ලංකා මහ බැංකුවේ ඔවුන් නමින් තැන්පත් වී ඇති ශේෂය ලබා ගැනීමේදී ප්‍රමාද වීම් ඇතුළු විවිධ දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වේ. එයට හේතු වී ඇත්තේ සේවක අර්ථසාධක අරමුදල් පනතේ රෙගුලාසි මගින් සාමාජික ලියාපදිංචිය සඳහා නිශ්චිත දින වකවානු නියම කර නොමැති වීමත්, ලියාපදිංචි නොකිරීම පිළිබඳව එවැනි සේවායෝජකයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක නොකිරීමත් වේ.

මෙම ගැටළුව විසඳීම සඳහා සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් ලියාපදිංචි කිරීමට සේවායෝජකයන් වෙත නිශ්චිත කාලයක් නියම කිරීමටත්, එම කාල සීමාව තුලදී සාමාජිකයන් ලියාපදිංචිය පැහැර හරින්නේ නම් නීති මගින් එය බලාත්මක කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකර මේවන විට අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කර ඇත.

### 1.4.3 ප්‍රසූත නිවාඩු හිමිකම ශක්තිමත් කිරීම

ප්‍රසූත නිවාඩු ලබා ගත් පූර්ව දරු උපත් සංඛ්‍යාව සැලකිල්ලට නොගෙන සෑම දරු උපතකදීම ශ්‍රමික කාන්තාවනට

දින 84ක වැටුප් සහිත ප්‍රසූත නිවාඩු හිමිකම ලබා දෙන ලදී. ඒ සඳහා ප්‍රසූතිකාධාර ආඥා පනතේ තුන්වන වගන්තිය සහ සාප්පු හා කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) ආඥා පනතේ 18 වන වගන්තිය සංශෝධනය කරන ලදී.

### 1.4.4 මව්කිරි ලබා දීම සඳහා සේවා කාලය තුල ලබාදී තිබූ නිවාඩු කාල සීමාව දීර්ඝ කිරීම

2018 තෙක් අලුත උපන් ළදරුවන්ට මව්කිරි දීම සඳහා සේවා කාලය තුල කාල සීමාවන් ලබා දීම සඳහා හිමිකම හිමිව තිබුනේ ප්‍රසූතිකාධාර ආඥා පනත යටතේ ආවරණයවන කාන්තා ශ්‍රමිකයන්ට පමණි. 2018 වසරේදී, සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ පනත යටතේ ආවරණයවූ කාන්තාවන් හටද එම හිමිකම ප්‍රදානය කරන ලදී. මේ සඳහා සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ පනතේ 18(1) වගන්තිය ඇතුලත් කිරීම සිදු කරන ලදී. කාන්තාවන් හා ළදරුවන්ගේ සෞඛ්‍යය හා වෘත්තීය හිමිකම ආරක්ෂා කිරීම සිදු කිරීම මගින් ශ්‍රම බලකායට එක්වීම සඳහා කාන්තා ශ්‍රමිකයන්හට වඩාත් හිතකර තත්ත්වයක් නිර්මාණය විය. රටෙහි සමාජ ආර්ථික සංවර්ධනය කෙරෙහි මෙම පියවර මගින් පැහැදිලි දායකත්වයක් ලබා දී ඇත.

### 1.4.5 සේවයේ නියුතු ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම

ස්ත්‍රීන්, තරුණ අය සහ ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ පනත යටතේ එන අනතුරුදායක රැකියා පිළිබඳ රෙගුලාසි පුළුල් ලෙස සමාලෝචනය කර පනත යටතේ නිකුත්කර ඇති අනතුරුදායක රැකියා රෙගුලාසි සංශෝධනය කිරීමට යෝජනා ඉදිරිපත් කරන ලදී. ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත, සාප්පු හා කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) ආඥා පනත සහ කර්මාන්තශාලා ආඥා පනත සංශෝධනය කරමින් ළමුන් සේවයේ යෙදවිය හැකි අවම වයස තව දුරටත් අවුරුදු 14 සිට 16 තෙක් ඉහළ දැමීම මගින් ළමුන්ගේ ආරක්ෂාව තව දුරටත් වැඩි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

### 1.4.6 කම්කරු නීතීන්හි පැහැදිලි, නිරවුල් හා සරල බව වැඩි දියුණුකිරීම හා සම වගකීම සඳහා සම අයිතීන් තහවුරු කිරීම

පවත්නා විවිධ පනත් ඔස්සේ කම්කරු අයිතිවාසිකම් තහවුරු කිරීමේදී සමාන අයිතීන් ලැබියයුතු අවස්ථා වලදී ඒවා නොලැබෙන තත්ත්වයක් පහත කරුණු මත ඇතිව පවත්නා බව පැහැදිලිවන කරුණකි.

කාර්යාල, සාප්පු හා කර්මාන්තශාලාවන්හි සේවකයන් සඳහා එකිනෙකට වෙනස්වූ නීතීන් පැවතීම තුළ, සමාන සේවයක් සමාන කාලයන් තුළ ලබා දෙනසේවකයන් හට සමාන සැලකීමක් නොලැබීම හා සේවකයන් හා සේවායෝජකයන් හට ක්‍රියාත්මක කල යුතු නිවැරදි නීතිය පිළිබඳව නිරවුල් භාවයක් නොමැතිවීම, සේවකයන් වැඩකල යුතු කාලසීමාව, අර්ධ කාලීන වෘතීන්හි නියැලීමට ඇති අවකාශය, කාන්තාවන් රාත්‍රියෙහි සේවයේ යෙදවීම පිළිබඳ නීතීන් හි පවතින අනම්‍යශීලී භාවය හාඅතිකාල සේවයෙහි යෙදවිය හැකි කාල සීමා පිළිබඳ නිෂ්පාදන ක්ෂේත්‍රය තුල පවත්නා නොගැලපීම්, ශ්‍රම සැපයුම් ආයතනවල සේවායෝජකයා යන්න පිළිබඳ පවත්නා එකිනෙකට වෙනස් අර්ථ දැක්වීම් මත ඇතිවන නෛතික ගැටළු, පෞද්ගලික අංශයේ පවත්නා සේවකයන් හට වෙනස්කොට සැලකීම් හා ලිංගික හිංසනයන් පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් නීති නොපැවතීම ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගීත්වය අඩුවීම යන කරුණු මත සේවකයන් හට සිදුවන අගතිය පාලනය කිරීම සඳහාසේවා කොන්දේසි ඇතුලත් කර එක් පනතක් හඳුන්වා දීම පිනිස අමාත්‍ය මණ්ඩලය විසින් 2018.07.10 දිනැතිව අනුමැතිය ලබා දෙන ලදී. නව පනත මගින් පහත අරමුණු කරා ලඟා වීම අපේක්ෂා කෙරේ;

කර්මාන්තශාලා, කාර්යාල, කෘෂි ආදී ක්ෂේත්‍රයන් පිළිබඳවෙන්වසැලකීමකින් තොරව තනිකම්කරු නීතියක් ඇති කිරීම මගින් යෙදී සිටින වෘත්තියේ තරාතිරම අනුව වෙනස්ව සැලකීමකින් තොරව, නිවාඩු, අතිකාල හිමිකම, රාජකාරි පැය ගණන, නිල ඇඳුම් ආදී හිමිකම් තහවුරු කිරීම.

නූතන සේවා පියසක පවත්නා තත්ත්වයන්ට අනුකූල නම්‍යශීලී කම්කරු නීතියක් හා නිරන්තරයෙන් අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවන නිශ්චිත නීති ස්ථාපිත කිරීම.

ඒ අනුව, සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ පනත, ස්ත්‍රීන්, තරුණ අය හා ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ පනත, ප්‍රසූතිකාධාර ආඥා පනත හා පඩිපාලක සභා ආඥා පනත යන පනත් හතර වෙනුවට තනි පනතක් හඳුන්වා දීම පිණිස මූලික කෙටුම්පත සැකසීම සඳහා සේවක, සේවායෝජක හා වෘත්තීය සමිති අදහස් ලබා ගැනීම සඳහා දීප ව්‍යාප්තව සාකච්ඡා වාර අටක් පවත්වන ලද අතර, මෙම පනත සැකසීමේදී සැලකිල්ලට ගත

යුතුව ඇති පනත ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී ඇතිවිය හැකි අභියෝග හා ගැටළු පිළිබඳව පුළුල්ව සාකච්ඡා කරන ලදී.

### 1.4.7 අනතුරු වලින් ශ්‍රමිකයන් ආරක්ෂා කිරීම

කර්මාන්තශාලා වල සේවය කරන ශ්‍රමිකයන්යන්ත්‍රවල යම් කොටස් හේතුවෙන්ද විදුලිය, තාපය, වායු පීඩන ආදී භෞතික කරුණු මතද අනතුරට ලක්වීමේ අවධානමක් පවතී. මෙම අනතුරු වලින් වලක්වා ගැනීම සඳහා කර්මාන්තශාලා හිමියන් විසින් යම් පූර්ව පියවරයන් අනුගමනය කොට තිබිය යුතු නමුත් ඒවා නිසි පරිදි අනුගමනය කරන බවට කරුණු අනාවරණය වී නැත.

මෙම තත්ත්වය පාලනය කිරීම කල හැකිවන්නේ අවශ්‍ය නීති හඳුන්වා දීම හා ක්‍රියාවට නැංවීම මගිනි. එහෙයින් මෙම අනතුරුදායක තත්ත්වයන් පාලනය කිරීම අරමුණු කොට;

- කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම හා ගොඩනැගිලි පිඹුරුපත් අනුමත කිරීම පිළිබඳ රෙගුලාසි
- හුමාල බොයිලේරු ලියාපදිංචි කිරීම පිළිබඳ රෙගුලාසි
- හුමාල බොයිලේරු හා අනෙකුත් පීඩන උපකරණ පරීක්ෂා කිරීම හා සහතික නිකුත් කිරීම පිළිබඳ රෙගුලාසි
- අධික ශබ්දයෙන් සේවකයන් ආරක්ෂා කර ගැනීමේ රෙගුලාසි
- ආලෝක සම්මතයන් සඳහා වන රෙගුලාසි

සකස් කොට ත්‍රෛපාර්ශවීය සාකච්ඡා පවත්වා කර්මාන්තශාලා ආඥා පනත සංශෝධනය කර පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. මෙම සංශෝධිත පනත සම්මතවී ක්‍රියාත්මක වීමේදී ඉහත පැහැදිලි කල අනතුරුවලින් ශ්‍රමිකයන්ගේ පැවැත්මට හා සෞඛ්‍යයට ක්ෂණිකව හෝ දීර්ඝ කාලීනව බලපවත්නා පරිදි සිදුවිය හැකි හානි වලින් වලක්වා ගැනීම හෝ සිදුවන හානිවලදී වන්දි ලබා ගැනීම පහසු වන නීතිමය තත්ත්වයන් ගොඩනැගෙනු ඇත.

### 1.4.8 කම්කරු දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගතකරණය

කම්කරු දෙපාර්තමේන්තුවේ ආයතනික ව්‍යුහය, 2016 වසර වන විට සකස්ව තිබුණේ 2012 වර්ෂයේ අවසන් වරට කරන ලද ප්‍රතිව්‍යුහගතකරණය අනුව සකසා තිබූ සංවිධාන ව්‍යුහය හා කාර්ය මණ්ඩලය අනුවය. එසේ වුවත් එම කාලය තුල අප විසින් සේවය සැපයිය යුතු ආයතන සංඛ්‍යාව ඉහළ ගොස් තිබූ හෙයින් හා තාක්ෂණයේ දියුණුව මත සේවා සැපයීමේ පහසුකම් වල ඇතිවී තිබූ ගුණාත්මක වර්ධනය යන කරුණු සැලකිල්ලට ගෙන වඩා හොඳ සේවාවන් ලබා දීම සඳහා ආයතනික ව්‍යුහය ප්‍රතිව්‍යුහගතකිරීමේ අවශ්‍යතාව 2016 වර්ෂය වන විට පැන නැගී තිබුණි. කම්කරු දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ලඟා කර ගැනීම සඳහා වර්තමානයේ දෙපාර්තමේන්තුවේ පවතින සංවිධාන ව්‍යුහය හා බලතල විමධ්‍යගත කිරීමේ ක්‍රමවේදයන් හි වෙනස්කම් සිදු කරමින් කම්කරු දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු, කම්කරු දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමේ කමිටු වාර්තාව හා අමප/17/1970/712/024 දරණ අමාත්‍යමණ්ඩල තීරණය අනුව ආරම්භ කරන ලදී.

එම කමිටුව විසින් කම්කරු දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු වලට අනුකූලව දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ, කලාප, දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල වලට පැවරෙන රාජකාරීන් හා එක් එක් කාර්යාල වල නිලධාරීන්ට පැවරෙන රාජකාරි පිළිබඳව සාධාරණීකරණයන් සකස් කොට, ප්‍රතිව්‍යුහගතකරණය කිරීම තුලින් ඇතිවන තනතුරු අනුමත කර ගැනීම සඳහා 2018.06.22 දිනැතිව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලද අතර, එම දෙපාර්තමේන්තුව මඟින් 2018.07.26 දිනැතිව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ ලබා ගැනීමට කටයුතු කර ඇති බව දන්වා එවා ඇත.2018.11.01 දිනැතිව ඊට අදාල සාධාරණීකරණයන් සහිත වාර්තාව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

ප්‍රතිව්‍යුහගතකරණයට අදාල නව තනතුරු අනුමත කර ගැනීම සඳහා ජාතික වැටුප්හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් යෝජනා සම්බන්ධ සාකච්ඡා වාර 03 ක් 2018 වසර තුල ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සමග පවත්වන ලදී.

මෙම ප්‍රතිව්‍යුහගතකරණය කිරීම මගින්, දෙපාර්තමේන්තුව විසින් මහජනයා හට ලබා දෙන සේවා, ලබා දීමේදී සේවා ලාභීන්ට ඇතිවන අපහසුතා අවම කර ගැනීමට හා උපරිම සේවා ප්‍රමාණයක් ප්‍රාදේශීයව සේවාලාභීන්

වෙතටම ගොස් ලබා දීමට ඇති හැකියාව ඉහළ යනු ඇතැයි අපේක්ෂා කල හැකිය. එමෙන්ම ප්‍රමාණවත් උසස්වීම් අවස්ථා නොමැති වීම මත තම වෘත්තීය පිළිබඳ ප්‍රමාණවත් ප්‍රබෝධයක් රහිතව සේවා සැපයීම සිදු කරන කාර්ය මණ්ඩලය වෙත යම් අපේක්ෂා සහගත බවක් ඇතිවීම තුල සේවා ලබාදීමේ කාර්යක්ෂම බවක් ඇතිවෙනු ඇතැයි බලාපොරොත්තු වේ.

## 1.5 ජාත්‍යන්තර සබඳතා

### 1.5.1 ජාත්‍යන්තර කම්කරු සංවිධානය

අන්තර්ජාතික කම්කරු ප්‍රඥප්තීන් ඇති කරමින් හා සියලු රටවල් තුල එය තහවුරු කිරීම මගින් සමාජ සාධාරණත්වය වැඩි දියුණු කිරීමත් ශ්‍රමිකයාගේ ගෞරවය, නිදහස, ආරක්ෂාව හා අයිතීන් ලබා දෙන, මනුෂ්‍යයාගේ අවශ්‍යතා පිළිබඳව සැලකිළිමත්වන සුනිසි වැඩ පරිසරයක් බිහි කිරීම සඳහා කැපව සිටින, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතායතනය ජාත්‍යන්තර කම්කරු සංවිධානයයි. ශ්‍රී ලංකාව තුල ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් තහවුරු කර දීම සඳහා උපදෙස්, තාක්ෂණික සහය හා පුහුණු කිරීම් සඳහා නිරන්තර මගපෙන්වීමක් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා ශාඛාව මගින් සිදු කරනු ලබයි.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය හා කම්කරු දෙපාර්තමේන්තුව සමග ඉතා සමීපව ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා ශාඛාව කටයුතු කරන අතර, දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලීන් එම සංවිධානයේ මග පෙන්වීම අනුව යාවත්කාලීන කිරීම හා අන්තර්ජාතික ප්‍රඥප්තීන් හා ගිවිසුම්ගත වීම මගින්, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහය වීම හා ශ්‍රී ලාංකීය ශ්‍රම බලකාය වෙත වඩා යහපත් සේවා තත්ත්වයන් හා සේවා පරිසරයක් ඇති කිරීමට එම සංවිධානය කටයුතු කිරීම යන ද්විත්ව කාරයයන් ඉටු කරගැනීමට කටයුතු කිරීම මගින් අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ලැබෙන හිතකර සබඳතාවක් කම්කරු දෙපාර්තමේන්තුව හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය කාලාන්තරයක් තිස්සේ පවත්වාගෙන යනු ලැබේ.

2018 වසර වන විට ශ්‍රී ලංකාව අන්තර්ජාතික සම්මුතීන් 43 ක් අපරානුමත කර තිබූ අතර P 29 ප්‍රොටොකෝලය සඳහා ඉදිරි වර්ෂයේදී අත්සන් තැබීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලදී.

ජාත්‍යන්තර කම්කරු සමුළුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රතිපත්ති සම්පාදනයේ මූලික සංවිධාන ව්‍යුහයයි. එම සමුළුවට වාර්ෂිකව ශ්‍රී ලංකාවේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ නියෝජිතයන්, කම්කරු දෙපාර්තමේන්තු නියෝජිතයන්, සේවක වෘත්තීය සංගම් හා සේවායෝජක සංගම් වලින් සමන්විත ත්‍රෛපාර්ශවීය කණ්ඩායමක් සහභාගී වන අතර, එහිදී ලැබෙන මග පෙන්වීම් හා අත්දැකීම් ශ්‍රී ලාංකීය කම්කරු නීති පද්ධතියේ ධනාත්මක වර්ධනයක් කෙරෙහි ඉවහල් වේ.

ශ්‍රී ලාංකීය ශ්‍රම බලකාය සඳහා හිතකර තත්ත්වයන් සම්පාදනය සඳහා තාක්ෂණික සහය ලබා දීම සඳහාත් නිලධරයන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහාත්ජාත්‍යන්තර කම්කරු සංවිධානය මැදිහත් වන අතර, ඒ සඳහා සම්පත් දායකත්වය සහ මූල්‍යමය දායකත්වය සපයනු ලබයි. 2018 වසරේ ශ්‍රී ලංකාව තුල පවත්වන ලද වැඩ සටහන් පහත පරිදි වේ. මේ හැරුණු කොට කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධරයන් 03 දෙනෙකු විදේශ රටවලදී කෙටි කාලීන පුහුණු වැඩසටහන් 03ක් සඳහා යොමු කිරීමට මූල්‍ය දායකත්වය ලබා දී ඇත.

| අනු අංකය | වැඩසටහන පැවැත්වූ දිනය / දින | වැඩසටහනේ නම | වැඩසටහන පැවැත්වූ ස්ථානය | සහභාගි වූ සංඛ්‍යාව | අපේක්ෂිත නිමවුම | අපේක්ෂිත ප්‍රතිඵලය |
|---|---|---|---|---|---|---|
| 01 | 18.01.19 | බලහත්කාරයෙන් සේවයේ යෙදවීම පිළිබඳව, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 29 වන සම්මුතියේ ප්‍රොටොකෝල 29 පිළිබඳ ත්‍රෛපාර්ශවීය උපදේශන වැඩමුළුව | රේණුකා සිටි හෝටලය, කොළඹ 03 | ජාතික කම්කරු උපදේශන සභාවේ සාමාජිකයන් 50ක් | පාර්ශවකරුවන්ගේ අදහස් ලබා ගැනීම | ප්‍රොටොකෝල 29 අපරානුමත කිරීම |
| 02 | 18.02.19 | ළමා ශ්‍රමය පිළිබඳ එක් දින වැඩමුළුව | හොටෙල් ජානකී, කොළඹ 03 | සමාජිකයන් 87 කි (සහකාර කම්කරු කොමසාරිස්වරු, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු සහ ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධරයන්) | ■ ළමා ශ්‍රමය පිළිබඳ විශේෂ ඒකකයක් පිහිටුවීම<br>■ සෑම දිස්ත්‍රික්කයක් සඳහාම ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සඳහා ළමා ශ්‍රමය පිළිබඳ මාර්ගෝපදේශ සහ ළමා ශ්‍රමය පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කම්කරු නිලධරයන්ගේ ධාරිතා සංවර්ධනය<br>■ ළමා ශ්‍රමය අවම කිරීම පිණිස විශේෂයෙන්ම ළමයින් සුරැකීමේ දිස්ත්‍රික් යාන්ත්‍රණය වන දිස්ත්‍රික් මට්ටමේ ළමා සංවර්ධන කමිටු තුළ කම්කරු නිලධරයන්ගේ සහභාගීත්වය වැඩි කිරීම සහ දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ප්‍රජා මට්ටමේ සමාජ ආරක්ෂන ජාල ප්‍රවර්ධනය කිරීම | ළමයින් සම්බන්ධ කාරණා පිළිබඳව කටයුතු කරන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම. |
| 03 | 18.04.09 | වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යය පනත සකස් කර අවසන් කිරීමේ වැඩමුළුව | හොටෙල් ජානකී, කොළඹ 03 | පාර්ශවකරුවන්-20 අනෙකුත් - 5 | පාර්ශවකරුවන්ගේ අදහස් ලබා ගැනීම | අවසන් කෙටුම්පත |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 04 | 18.08.20 | ශ්‍රී ලංකා නියෝජිතයන්ගේ දකුණු අප්‍රිකානු ත්‍රෛපාර්ශවීය අධ්‍යයන චාරිකාව | දකුණු අප්‍රිකාව | නියෝජිතයන් 09 කි (ගරු අමාත්‍යතුමා, උප සභාපති - ලංකා කම්කරු සම්මේලනය, සම ලේකම් - අපනයන සැකසුම් කලාප හා පොදු සේවා සේවකයින්ගේ සංගමය, මහ ලේකම් - ජාතික වෘත්තීය සමිති සම්මේලනය, අධ්‍යක්ෂ ජෙනරාල් - ලංකා සේව්‍ය සම්මේලනය, මානව සම්පත් අධ්‍යක්ෂ - එයිට්කන් ස්පෙන්ස් හොටෙල් මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්, Group Chief People Officer -බ්‍රැන්ඩික්ස් | දකුණු අප්‍රිකාවේ කම්කරු පද්ධතිය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම | ජාතික කම්කරු උපදේශන සභාව (NLAC) ප්‍රතිව්‍යුහගතකරණය |

වගුව 1.10 ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය යටතේ පැවැත්වූ වැඩසටහන්

| අනු අංකය | වැඩසටහනෙහි නම | වැඩසටහන පැවැත්වූ ස්ථානය | සහභාගී වූ නිලධාරී කාණ්ඩය | සහභාගී වූ නිලධාරී සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | තේ වැවිලි කර්මාන්තය තුල සුනිසි මෙහෙවර 1 | රේණුකා සිටි හෝටලය, කොළඹ 03 | කම්කරු නිලධාරී | 48 |
| 02 | තේ වැවිලි කර්මාන්තය තුල සුනිසි මෙහෙවර 2 | පොල්ගොල්ල පුහුණු මධ්‍යස්ථානය- නුවර | නි.කම්.කො / කම්.නි | 56 |
| 03 | තේ වැවිලි කර්මාන්තය තුල සුනිසි මෙහෙවර 3 | කලම්බො සිටි හොටෙල්, කොළඹ කොටුව | නි.කම්.කො / කම්.නි | 61 |
| 04 | තේ වැවිලි කර්මාන්තය තුල සුනිසි මෙහෙවර 4 | කලම්බො සිටි හොටෙල්, කොළඹ කොටුව | නි.කම්.කො / කම්.නි | 56 |
| 05 | වෘත්තීය ස්වස්ථතාව පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන - 05 | හොටෙල් විලා ඕෂන් වීව් වාද්දුව | කම්කරු නිලධාරී | 30 |
| 06 | කම්කරු දෙපාර්තමේන්තුව සඳහා උපායමාර්ගික සැලසුම් සකස් කිරීම පිළිබඳ වැඩමුළුව | රේණුකා සිටි හෝටලය, කොළඹ 03 | අති.කම්.කො.ජ / කම්.කො / ගණකාධිකාරී / ඉංජිනේරු / ප්‍රධාන අභ්‍යන්තර විගණක / නි.කම්.කො / ස.කම්.කො / ස.අ. (සැලසුම්) / නි.අධ්‍යක්ෂ / නීති නිලධාරී | 37 |

වගුව 1.11 ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය යටතේ දෙපාර්තමේන්තු නිලධරයන් සඳහා පැවැත්වූ වැඩසටහන්

# 2. ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය සඳහාකාර්මික සාමය සුරක්ෂිත කිරීම

## 2.1 හැඳින්වීම

අන්තර්ජාතිකව තරගකාරී ආර්ථිකයක් සඳහා කල්පවත්නා කාර්මික සාමයක් සහිත රටක් නිර්මාණය කිරීම සඳහා දායකත්වය සැපයීම දෙපාර්තමේන්තුවෙහි දැක්ම වන හෙයින් කාර්මික සාමය පවත්වා ගැනීම දෙපාර්තමේන්තුවේ මූලික හා අත්‍යවශ්‍ය කාර්යය වේ. මේ සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර 4 ක් යටතේ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. එනම්;

2.1.1 සේවායෝජක සේවක දෙපාර්ශවය අතර කතිකාවක් පවත්වාගෙන යාම
2.1.2 සේවා ස්ථාන (ශ්‍රමික පරීක්ෂණ) පරීක්ෂා කිරීම
2.1.3 ව්‍යවස්ථාපිත හිමිකම් අහිමිවීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල්නිරවුල් කිරීම
2.1.4 ශ්‍රමිකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා අධිකරණ ක්‍රියා මාර්ග ගැනීම

යන කාර්යයන් ඉටු කිරීම මගින් කාර්මික සාමය පවත්වා ගැනීමට හැකි සෑම ප්‍රයත්නයක්ම දෙපාර්තමේන්තුව විසින් දරනු ලැබේ.

## 2.2 කාර්යභාරය

### 2.2.1 සේවායෝජක සේවක දෙපාර්ශවය අතර කතිකාවතක් පවත්වා ගැනීම

දිවයින පුරා විසිරී ඇති අර්ධ රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතනවල උපරිම ඵලදායීතාව හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා සේවායෝජක සේවක දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන වැඩ පරිසරයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ඉටු කිරීම **මානව සම්පත් සංවර්ධන අංශය** මගින් සිදු කෙරේ.

මේ සඳහා;

2.2.1.1 සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම සඳහා වන ප්‍රතිපත්ති හා උපාය මාර්ග හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනික මට්ටමෙන් වැඩපොළ සහයෝගීතාව ගොඩනැගීම.

2.2.1.2 සාමූහික ගිවිසුම් ඇති කිරීම සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස ක්‍රියා කරමින් කාර්මික සාමය ගොඩනැගීම.

2.2.1.3 යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන දැනුවත් කිරීමේ වැඩ සටහන් තුළින් සේවායෝජක සේවක දෙපාර්ශවයට කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම. මේ සඳහා ආයතන මට්ටමේ වැඩසටහන් සහ කළමනාකරුවන් හා සේවායෝජකයින් සඳහා වන වැඩසටහන් සංවිධානය කොට පවත්වනු ලබයි.



2.1 ඡායාරූපය - අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන වල සේවායෝජක - සේවක කතිකාව - 2018 දෙපාර්තමේන්තු නිලධරයන්



2.2 ඡායාරූපය - අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන වල සේවායෝජක - සේවක කතිකාව - 2018 සේවායෝජක සේවක සහභාගීත්වය

2.2.1.4 එසේම සේවායෝජක සේවක දෙපාර්ශවය හා නියෝජ්‍ය/සහකාර කම්කරු කොමසාරිස්වරුන්ගේ සහභාගීත්වයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ පළාත් කාර්යාල හරහා ත්‍රෛපාර්ශවීය සබඳතාවය ගොඩනැගීම සහ ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය තොරතුරු රැස් කර ගැනීමට කලාප උපදේශන සභා පැවැත්වීම.

2.2.1.5 දැනුම බෙදා හදා ගැනීමටත් සේවායෝජක සේවක දෙපාර්ශවය අතර, කම්කරු නීති පිළිබඳව පවතින ගැටලු නිරාකරණය කිරීමටත් කලාප කතිකාවත පැවැත්වීම.

2.2.1.6 කාර්මික ආරවුල් ඇතිවීම වැළැක්වීම සඳහා දැනුම වර්ධනය කිරීමට කතිකාව සඟරාව එළි දැක්වීම.

2.2.1.7 සමාජ කතිකාව කොතරම් දුරට ආයතන තුළ තහවුරු වී තිබේද යන්න පිළිබඳව වාර්ෂිකව නිෂ්පාදන, සේවා, ඇඟලුම් හා වතු අංශය නියෝජනය වන පරිදි කුඩා, මධ්‍ය හා මහා පරිමාණ වශයෙන් දීප ව්‍යාප්තව සමාජ කතිකාව හා වැඩපොළ සහයෝගීතාවය පිළිබඳ තරඟාවලියක් පැවැත්වීමටත් කටයුතු කරනු ලබයි. ඊට සමගාමීව එහිදී සමාජ කතිකාවත හා වැඩපොළ සහයෝගීතාවය පිළිබඳ ගද්‍ය රචනා හා පද්‍ය රචනා (සිංහල / දෙමළ), චිත්‍ර, පෝස්ටර් හා කෙටි වීඩියෝ නිර්මාණ තරඟයක් පැවැත්වීම.




2.3 ඡායාරූපය - කම්කරු කොමසාරිස් ජනරාල්තුමා සභාව ඇමතීම



2.4 ඡායාරූපය - අමාත්‍යාංශ ලේකම්තුමා සහ කම්කරු කොමසාරිස් ජනරාල්තුමා තරඟයට ඉදිරිපත් කළ චිත්‍ර නරඹමින්

### සමාජ කතිකාව හා වැඩපොළ සහයෝගීතාවය පිළිබඳ තරඟාවලිය - 2018

| අනු අංකය | කාර්යය | වැඩසටහන් ගණන |
|---|---|---|
| 01 | සමාජ කතිකා අංශයෙන් සිදුකළ සේව්‍ය සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ ආයතන මට්ටමේ වැඩසටහන් | 72 |
| 02 | සමාජ කතිකා අංශයෙන් සිදුකළ කළමනාකරුවන් හා සේවායෝජකයින් සඳහා පවත්වන ලද වැඩසටහන් | 10 |
| 03 | දිස්ත්‍රික් කාර්යාල මගින් සිදුකළ සේවායෝජක සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ වැඩමුළු | 40 |
| 04 | උප කාර්යාල මගින් සිදුකළ සේවායෝජක සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ වැඩමුළු | 17 |
| 05 | කලාප සමාජ කතිකාවත වැඩ සටහන් | 11 |
| 06 | කතිකාව සඟරාව | 01 |
| 07 | සමාජ කතිකා විශිෂ්ටතා සම්මාන උළෙල (2018.12.04) | 01 |

වගුව 2.1 - මානව සම්පත් සංවර්ධන අංශය මගින් ඉටුකරනු ලැබූ කාර්යයන් - 2018

### 2.2.2 සේවා ස්ථාන (ශ්‍රමික) පරීක්ෂණ සිදු කිරීම

**සේවා ස්ථාන** (ශ්‍රමික) පරීක්ෂණ සිදුකිරීමේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ වැඩ පියසේදී ශ්‍රමිකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් ආරක්ෂා කිරීම සඳහා පනවා ඇති නීති හා රෙගුලාසි නිසි පරිදි ක්‍රියාත්මක වේද යන්න පරීක්ෂාවට ලක් කර, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සේවායෝජක සේවක දෙපාර්ශවය අතර ගැටළු ඇති වීම පාලනය කර සුහද සම්බන්ධතාවයක් ඇති කිරීමයි. මෙහිදී කම්කරු නීති උල්ලංඝනය වීම් ඇතිවිය හැකි තත්ත්ව නිරීක්ෂණය වූ වහාම එය වැළකීමට පියවර ගැනීම සාර්ථක ශ්‍රමික පරීක්ෂණ ක්‍රමවේදයකදී අපේක්ෂා කෙරේ. එමෙන්ම සේවායෝජක සේවක දෙපාර්ශවයන් අතර ඇතිවිය හැකි අර්බුදකාරී තත්ත්ව වැළැක්වීම ශ්‍රමික පරීක්ෂණ වල අනෙක් පරමාර්ථයයි.

කම්කරු නිලධරයෙකු විසින්;

- වැටුප් ඇතුළු සේවා ස්ථානයේ ක්‍රියාත්මක කොන්දේසි, වැඩ පැය, නිවාඩු හිමිකම, අතිකාල ගෙවීම්
- සේවකයාගේ සේවක අර්ථ සාධක අරමුදල් හිමිකම
- වැඩ බිමෙහි සෞඛ්‍ය ආරක්ෂණය හා ආරක්ෂාව පිළිබඳ තත්ත්ව
- ස්ත්‍රීන්, තරුණ අය හා ළමුන් වැනි අවදානමට ලක්විය හැකි ශ්‍රමිකයන්

යන කරුණු පිළිබඳ අවධානය සහිතව පහත කාර්යයන් ඉටුකල යුතුය.

2.2.2.1 ශ්‍රී ලංකාව තුළ බල පවත්නා කම්කරු නීති ක්‍රියාත්මක කිරීම හා අදාල නෛතික කටයුතු සිදු කිරීම.

2.2.2.2 බලපවත්නා කම්කරු නීතිය අනුව කටයුතු කිරීමේදී අනුගමනය කල යුතු ක්‍රියා මාර්ග පිළිබඳ සේවායෝජක දැනුවත් කිරීම.

2.2.2.3 පවත්නා නීතිය යටතේ විසඳිය නොහැකි බව හඳුනා ගන්නා ගැටළු පිළිබඳ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් දැනුවත් කිරීම.

2.2.2.4 සාමූහික ගිවිසුම් ක්‍රියාත්මක කිරීම.

2.2.2.5 පවත්නා නීතියේ සීමා යටතේ සමාජ ආරක්ෂණ ගැටළු නිරාකරණයට මැදිහත්වීම.

2.2.2.6 නිර්නාමික හා විශේෂයෙන් අවධානය යොමු කලයුතු පැමිණිලි පිළිබඳ විමර්ෂණය සහ සේවායෝජක සේවක දෙපාර්ශවය අතර සුහද සම්බන්ධතාවක් ගොඩනැංවීමට ක්‍රියාමාර්ග ගැනීම.




ප්‍රස්තාරය 2.1 - සේවා ස්ථාන (ශ්‍රමික) පරීක්ෂණ - 2018
(2018 වසර තුළ සමස්ත පරීක්ෂණ ගණන 83,333 )




ප්‍රස්තාරය- 2.2 කම්කරු නිලධරයෙකු මාසිකව සිදු කල සේවාස්ථාන (ශ්‍රමික) පරීක්ෂණ සංඛ්‍යාවේ සාමාන්‍යය - 2018

මෙම කාර්යය සඳහා කලාප කම්කරු කාර්යාල 11 ක්, ඒ යටතේ දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 ක් හා උප කම්කරු කාර්යාල 17 ක් ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි ස්ථාපනය කර ඇති අතර, කම්කරු නිලධරයන් 507 ක් සේවයේ යොදවා ඇත. මෙම කාර්යය ඉටු කිරීම දිස්ත්‍රික් කම්කරු හා උප කම්කරු කාර්යාල මගින් ඉටු කරන අතර, එම කාර්යාල අධීක්ෂණය පිළිවෙලින් සහකාර කොමසාරිස්වරයකු විසින් හා ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධරයෙකු විසින් සිදුකරනු ලබයි. මෙම කාර්යාල අධීක්ෂණය නියෝජ්‍ය කොමසාරිස්වරයකුගේ මෙහෙයවීම යටතේ වන කලාප කම්කරු කාර්යාලය මගින් ඉටුවන අතර, අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (දෙපාර්තමේන්තු) ගේ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ මෙම සමස්ත ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ.

එක් කම්කරු නිලධරයෙකු 2018 වසරේදී සාමාන්‍ය වශයෙන් ශ්‍රමික පරීක්ෂණ 204 ක් සිදුකර ඇති අතර, ඒ අනුව 2018 වසර තුළ සමස්ත පරීක්ෂණ 83,333 ක් සිදුකර ඇත.

## 2.2.3 ව්‍යවස්ථාපිත හිමිකම් අහිමිවීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම

ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් හා කාර්මික ආරාවුල් ඇතිවීමට ඉඩ ඇති අවස්ථා හා වැඩ වර්ජන පිළිබඳ පැමිණිලි ප්‍රධාන කාර්යාලයට දිස්ත්‍රික් කාර්යාල හා උප කාර්යාල වෙත යොමු කිරීම සේවකයන් හෝ වෙනත් විවිධ පාර්ශවයන් විසින් කරනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාල, කලාප කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ අදාල අංශ මගින්ද ඒවා විසඳීමට කටයුතු කරනු ලැබේ. එම උත්සහය අසාර්ථක වුවහොත් අදාල කාර්මික ආරවුල් විෂයභාර ගරු ඇමතිතුමන්ගේ නියෝග මත බේරුම්කරුවෙකු වෙත හෝ කාර්මික අධිකරණය වෙත යොමුකර විසඳුමක් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

එමගින් පෞද්ගලිකව එම සේවායෝජක සේවක දෙපාර්ශවයන්ට ප්‍රතිලාභ ද, පොදුවේ ජාතික ආර්ථිකය නංවාලීමට දායකවීම ද සිදුකෙරේ. පුළුල්ව ගත් කළ, සේවායෝජක සේවක අයිතීන් ද ආරක්ෂා කරමින් රට තුළ කාර්මික සාමය ඇතිකර රටේ ආර්ථික වර්ධනයට සහ සංවර්ධනයට දායක වීමේ වගකීම **කාර්මික සම්බන්ධතා අංශය** මගින් දරනු ලබයි. මේ සඳහා කාර්මික සම්බන්ධතා අංශය යටතේ එම අංශයට අමතරව තවත් උප අංශ 3 කි. ඒවානම්, **සේවය අවසන් කිරීමේ** අංශය, **වෘත්තීය සමිති** අංශය සහ **කාර්මික අධිකරණය** වේ.

### 2.2.3.1 බලාත්මක නෛතික විධිවිධාන

2.2.3.1.1 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් (සංශෝධිත) පනත
2.2.3.1.2 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ (සංශෝධිත) පනත
2.2.3.1.3 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනත
2.2.3.1.4 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥාපනත (සංශෝධිත)

### 2.2.3.2 කාර්මික ආරාවුල් පනත ක්‍රියාත්මක කිරීම

කාර්මික ආරවුල යන්නෙන් "යම් තැනැත්තෙකු සේවයේ යෙදවීම හෝ නොයෙදවීම හෝ යම් තැනැත්තෙකුගේ

සේවා නියුක්තියෙහි කොන්දේසි හෝ ශ්‍රමය යෙදවීමට අදාල තත්ත්වයන් හෝ යම් තැනැත්තෙකුගේ සේවය අවසන් කිරීමද හෝ යම් තැනැත්තෙකු සේවයේ යළි පිහිටුවීම සම්බන්ධයෙන් හෝ සේවායෝජකයෙකු හා සේවකයෙකු අතර නැතහොත් සේවකයන් හා සේවකයන් අතර යම් ආරවුලක් හෝ මතභේදයක්" අදහස් වේ. (කාර්මික ආරවුල් පනත 48 (අර්ථකථන) වගන්තිය).

කාර්මික ආරාවුලක් ඇතිවීම වැළැක්වීමෙන් සහ හෝ ඇතිවීමට ඉඩකඩ ඇති අවස්ථාවක මැදිහත්වීමෙන් ආරාවුලට අදාළ පාර්ශවයන්ට ඇති විය හැකිව තිබූ මූල්‍යමය හානි වැළැක්වෙනවා මෙන්ම පාර්ශවයන් අතර ඇතිවන අන්‍යෝන්‍ය අවබෝධය අදාළ සේවාස්ථානයන්හි දිගුකාලීන පැවැත්මටද ධනාත්මකව දායක වේ. යම් අවස්ථාවක කාර්මික ආරාවුලක් ඇතිවුවහොත් එය සාකච්ඡා මාර්ගයෙන් සමථ කර ගැනීමට අතරමැදියකු ලෙස දිස්ත්‍රික් කාර්යාල, උප කාර්යාල හා කාර්මික සම්බන්ධතා අංශය කටයුතු කරයි. එවැනි අවස්ථාවක ඇතිවන සමථයක්, කාර්මික ආරාවුල් පනතේ 12(1) වගන්තිය යටතේ ඇතිකරගනු ලබන ගිවිසුම් මගින් නීත්‍යානුකූල කරනු ලැබේ. මෙම කටයුත්ත දිස්ත්‍රික් කම්කරු කාර්යාල මගින්, කලාප කම්කරු කාර්යාල මගින් ද සිදු කරනු ලබන අතර, ඍජුවම කාර්මික සම්බන්ධතා අංශය විසින්ද සිදු කරයි. ඒ ආකාරයෙන් ද සමථ නොවන ආරාවුල් බේරුම්කරණයට හෝ කාර්මික අධිකරණයට යොමුකරනු ලබන අතර, බේරුම්කරු / කාර්මික අධිකරණය ස්වාධීන පාර්ශවයකි. පාර්ශවයන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු සාධාරණවත් අපක්ෂපාතීවත් සළකා බලා, බේරුම්කරණ / කාර්මික අධිකරණ ප්‍රදානයන් ලබාදෙනු ලබන අතර, එය මහේස්ත්‍රාත් අධිකරණයක් මගින් බලාත්මක කරවිය හැකි නෛතික තීන්දුවකි.

බේරුම්කරණයට යොමු කිරීම යන්නෙන් එක් බේරුම්කරුවකු වෙත ආරාවුලක් යොමු කිරීම අදහස් වන අතර, කාර්මික අධිකරණයට යොමු කිරීම යන්නෙන් බේරුම්කරණ මණ්ඩලයක් වෙත ආරාවුලක් යොමු කිරීම අදහස් වේ. එසේම එම නඩු කටයුතු සිදු කරන අංශය හැඳින්වීමට පොදුවේ "කාර්මික අධිකරණය" යන නම භාවිතා කෙරේ.




ප්‍රස්තාරය 2.3 - සේවක අයිතීන් කඩවීම පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් - 2018

වර්ෂය තුළ ලැබෙන පැමිණිලි ගණනට සාපේක්ෂව විසඳූ පැමිණිලි ගණන ඉහල අගයක් ගැනිමත් පැමිණිලි විසඳීමේ ප්‍රවනතාවය පැමිණිලි ලැබීමේ ප්‍රවනතාවයට සාපේක්ෂව වැඩි ආනතියක් දැරීමත්, පැමිණිලි විසඳීමට ගත වන කාලය ඉදිරියේදී අවම කර ගැනීමට ඇති විභවය පෙන්නුම් කරයි.




ප්‍රස්තාරය 2.4 - කාර්මික ආරවුල් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් - 2018

### 2.2.3.2.1 වැඩ වර්ජන ඇති වීම අවම කිරීම

ඉහත මාතෘකා යටතේ පැහැදිලි කල පරිදිම වැඩ වර්ජනයක් දක්වා වර්ධනය විය හැකි තත්ත්වයන් නිරීක්ෂණය වූ වහාම කම්කරු නිලධරයන් විසින් එම තත්ත්වය පාලනය කිරීමට කටයුතු කරන අතර, වැඩ වර්ජනයක් ඇති වුවහොත් ඒ සඳහා අදාල කම්කරු නිලධරයා, සහකාර කම්කරු කොමසාරිස් හා නියෝජ්‍ය කම්කරු කොමසාරිස් මැදිහත්ව විසඳීමට කටයුතු කරන අතර, අවශ්‍ය විටක අදාල කොමසාරිස්වරයාද මැදිහත් වේ. වැඩ වර්ජන ඇතිවීම පාලනය කර ගැනීම හෝ ඇතිවූ විට සේවායෝජක, සේවක දෙපාර්ශවයටම එකඟ විය හැකි විසඳුමකට එළඹීම අත්‍යවශ්‍යය. එසේ නොවුවහොත් පළමුව ආයතනයේ නිෂ්පාදනය පහත වැටීම, අකාර්යක්ෂම වීම, මිනිස් ශ්‍රම පැය අහිමි වීම ඇතැම් විට ආයතනය අකර්මණ්‍යව වසා දැමීමට සිදුවීම තෙක් ජාතික ආර්ථිකයට අහිතකර බලපෑම් ඉන් ඇතිවීමට ඉඩ ඇති බැවිනි. 2016 වසරට සාපේක්ෂව 2017 වසරේ වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස පහත වැටී තිබූ අතර, 2018 වසර තුළදී වාර්තා වූ සංඛ්‍යාව 2017 වසරට ආසන්න අගයක් වේ.

| අනු අංකය | සිදුවීම | වතු | ඉදිකිරීම් | නිෂ්පාදන | පතල් කැණීම් | අර්ධ රාජ්‍ය | වෙනත් සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | වැඩ වර්ජන වාර්තා වීම් | 21 | 01 | 14 | 01 | 02 | 02 | 41 |
| 02 | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 7402 | 110 | 4360 | 60 | 830 | 198 | 12,960 |
| 03 | අහිමි වූ මිනිස් දින සංඛ්‍යාව | 23654 | 110 | 9965 | 120 | 5815 | 344 | 40,008 |

වගුව 2.2 - වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත - 2018

### 2.2.3.2.2. සාමූහික ගිවිසුම් ලියාපදිංචි කිරීම

කාර්මික ආරාවුල් සමථ කරණයේදී සාමූහික ගිවිසුම් වලට එළඹීම මගින් සේවායෝජකයන් හා සේවකයන් දෙපාර්ශවය වෙත වඩා ස්ථිර විසඳුමක් ලැබේ. එමෙන්ම සේවකයන්ට කම්කරු නීති රීතිවලින් ලබාදී ඇති අයිතිවාසිකම් සහ වරප්‍රසාදවලට වඩා වැඩි වරප්‍රසාද ලබා ගැනීමට සාමූහික ගිවිසුම් නිසා හැකි වේ. පසුගිය වසර කිහිපය තුළ ලියාපදිංචි කරන ලද සාමූහික ගිවිසුම් සංඛ්‍යාවේ ක්‍රමික අඩුවීමක් පෙන්නුම් කෙරෙන බැවින් සාමූහික ගිවිසුම් සඳහා සමාජ කතිකාවත තුළින් පෙළඹවීමක් සිදු කිරීමට දෙපාර්තමේන්තුව විසින් උත්සාහ ගනු ලැබේ.




ප්‍රස්තාරය 2.5 - සාමූහික ගිවිසුම් ලියාපදිංචි කිරීම - 2018

### 2.2.3.2.3 බේරුම්කරණය හා කාර්මික අධිකරණ කටයුතු

බේරුම්කරණය හා කාර්මික අධිකරණයෙහි ප්‍රධාන අරමුණ වනුයේ කාර්මික ආරවුල් නිරවුල් කිරීම වන අතර, බේරුම්කරුවකු / කාර්මික අධිකරණය විසින් ආරවුලක් විභාග කර ප්‍රදානයන් ලබා දෙන අතර ඊට අදාලව අවශ්‍ය වුවහොත් අර්ථ නිරූපණ ඉල්ලා සිටීම හා බේරුම්කරණ ප්‍රදානයන්ට විරුද්ධව රිට් ආඥා නිකුත්වූවිට නීති ක්‍රියා අංශය සහ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම කාර්මික සම්බන්ධතා අංශය විසින් සිදු කරනු ලැබේ.

2018 වර්ෂයේදී කාර්මික අධිකරණ කටයුතු සඳහා සාමාජිකයන් 17 දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් පත්කර ඇති අතර, එමගින් කාර්මික ආරවුල් විසඳීමට පියවර ගන්නා ලදී.




ප්‍රස්තාරය 2.6 - කාර්මික අධිකරණ කටයුතු - 2016,2017,2018

### 2.2.3.1 පාරිතෝෂික ගෙවීමේ පනත ක්‍රියාත්මක කිරීම

පෞද්ගලික හෝ අර්ධ රාජ්‍ය අංශයේ යම් සේවායෝජකයෙකු විසින්, කම්කරුවා විසින් හෝ කම්කරුවා විශ්‍රාම ගැනීම මත හෝ මරණය සිදුවීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් හෝ අන්‍ය ආකාරයෙන්, සේවකයෙකුගේ සේවය අවසන් කරනු ලැබූ විට ඔහුට හෝ යැපෙන්නන්හට, එම සේවකයාගේ සේවා කාලය හා ලැබූ වැටුප මත පදනම්ව ලබා දෙනු ලබන දීමනාව පාරිතෝෂිකය වන අතර, පාරිතෝෂික හිමිකම හා ගෙවීම් පිළිබඳ සියලු නීති රීති කොන්දේසි මෙම පනතට ඇතුලත් වේ.

පාරිතෝෂික ගෙවීමේදී සේවායෝජක හා සේවක දෙපාර්ශවයට ඇතිවන ගැටළු සඳහා ලිඛිත සහ වාචික උපදෙස් ලබාදීම සිදුකරනු ලබන අතර, එම පනතට අදාළව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ද අවශ්‍ය කටයුතු කාර්මික සම්බන්ධතා අංශය විසින්ද සිදු කරනු ලබයි.

පාරිතෝෂික නොගෙවීම සම්බන්ධ පැමිණිලි පරීක්ෂණ පැවැත්වීම දිස්ත්‍රික් කම්කරු කාර්යාල මගින් සිදුකරනු ලබන අතර, පාරිතෝෂික නොගෙවීම් සම්බන්ධ නිවේදන යොමු කිරීමද කරනු ලබයි. එම නිවේදන බලාත්මක කරවා ගැනීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම, අදාළ කලාප කම්කරු කාර්යාලයේ නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයා විසින් සිදු කරනු ලබන අතර, එම නඩු පවත්වාගෙන යාම දිස්ත්‍රික් සහකාර කම්කරු කොමසාරිස්වරයා විසින් සිදු කරනු ලබයි. මෙම ක්‍රියාවලිය තුළ දිස්ත්‍රික් සහකාර කම්කරු කොමසාරිස්වරුන්ට සහ කළාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්ට අවශ්‍ය උපදෙස් ලබාදීම ද කාර්මික සම්බන්ධතා අංශය විසින් සිදු කරනු ලබයි.




ප්‍රස්තාරය 2.7 - පාරිතෝෂික නොගෙවීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් - 2018

### 2.2.3.3 කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම

සේවකයෙකුගේ සේවය අවසන් කිරීම පිළිබඳ නීති රීති හා විධිවිධාන මෙම පනතෙහි ඇතුලත් වේ. අන්තනෝමතිකව හා අනීතික ලෙස සේවය අවසන් කිරීම අවම කිරීම, පාරිසරික වෙනස්වීම් වල ප්‍රතිවිපාක ලෙස සේවය අහිමිවන සේවකයින්හට සාධාරණ හා යුක්ති සහගත අයුරින් සහන සැලසීම, ආර්ථික වර්ධනයේ විචලතා සමඟ සිය ව්‍යාපාර ශක්තිමත් කිරීමට ගන්නා උපාය මාර්ග වලදී අතිරික්ත සේවකයින් කඩිනමින් ඉවත්කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ව්‍යාපාරික ප්‍රජාවට සැලසීම ආදී කාර්යයන් කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

පෞද්ගලික අංශයේ සේවකයින් සම්බන්ධයෙන්, සේවකයෙකුගේ කැමැත්ත හෝ කම්කරු කොමසාරිස්ගේ පූර්ව ලිඛිත අනුමැතිය රහිතව සිදුකරනු ලබන සේවය අවසන් කිරීමක් අනීතික සේවය අවසන් කිරීමක් වේ. (ව්‍යතිරේකයන්ට යටත්ව), අනීතික සේවය අවසන් කිරීමක් සම්බන්ධයෙන් සහන ඉල්ලා කම්කරු කොමසාරිස් වෙත පැමිණිලි කිරීමට සේවකයකුට අයිතියක් ඇති අතර, එවැනි පැමිණිලි සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සේවය අවසන් කිරීමේ අංශය විසින් සිදු කරනු ලබයි.

කිසියම් සාධාරණ හේතුවක් මත සේවකයෙකුගේ හෝ සේවක පිරිසකගේ සේවය අවසන් කිරීමට සේවායෝජකයකුට අවශ්‍ය වූ විට, උක්ත පනත යටතේ කම්කරු කොමසාරිස් වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ හැකි අතර, එවැනි සේවායෝජක අයැදුම්පත් සම්බන්ධයෙන් ද ඉදිරි කටයුතු සේවය අවසන් කිරීමේ අංශය විසින් සිදු කරනු ලබයි. සේවක පැමිණිලි සහ සේවායෝජක අයැදුම්පත් සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් කැඳවා පරීක්ෂණයක් සිදුකර නියෝගයක් ලබාදීමද මෙම අංශය මගින් සිදු කරනු ලබන අතර, එම නියෝගයද මහේස්ත්‍රාත් අධිකරණය මගින් බලාත්මක කරවා ගත හැකි නියෝගයකි.

### 2.2.3.4 වෘත්තීය සමිති ආඥා පනත ක්‍රියාත්මක කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iii පරිච්ඡේදයේ විස්තර කෙරෙන මූලික අයිතිවාසිකම් යටතේ ඡේද අංක 14 ඈ හි "සෑම පුරවැසියෙකුටම වෘත්තීය සමිති පිහිටුවීමේ සහ වෘත්තීය සමිති වලට බැඳීමේ නිදහසට හිමිකම් ඇත්තේය" යනුවෙන් ඇතුලත් කොට පුරවැසියන්ගේ භාෂණයේ, රැස්වීමේ, සමාගමයේ නිදහස තහවුරු කොට ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති හිමිකම භුක්ති විඳීමේ අයිතිය තහවුරු කරමින් වෘත්තීය සමිති ඇති කර ගැනීමට, පවත්වාගෙන යාමට හා ඒ අනුව සිය අයිතිවාසිකම් පිළිබඳ කටයුතු කිරීමට ශ්‍රමිකයන් හට අවස්ථාව ලබා දී ඇත.

කාර්මික සාමය කඩවීමකදී සේවායෝජක, සේවක දෙපාර්ශවය වෙතින් ඉදිරිපත්වන කරුණු සාධාරණ හා යුක්ති සහගතව සම අවධානයන් සහිතව සැලකිල්ලට ගැනීමට අවස්ථාව සැලසීම සඳහා තනි තනි සේවකයන් වශයෙන් නොවූ සමූහයන් වශයෙන් කරුණු දැක්වීමට අවස්ථාව සලසා දීම වෘත්තීය සමිති පිහිටුවීමට අවස්ථාව සලසා දීම මගින් සිදු වේ.




ප්‍රස්තාරය 2.8 - වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම හා අවලංගු කිරීම - 2018
(2018.12.31 වන විට ක්‍රියාත්මක වෘත්තීය සමිති ගණන 1909කි.)

### 2.2.3.5 විශේෂ විමර්ශන කටයුතු

සාමාන්‍ය පරිදි සිදු කෙරෙන කම්කරු පරීක්ෂණ සහ පැමිණිලි පරීක්ෂණවලට අමතරව, යම් පැමිණිලි විමර්ශනයක් හෝ ආයතන (ශ්‍රමික) පරීක්ෂණයක් සිදුවූ ආකාරය පිළිබඳ සෑහීමට පත්නොවන අයකු විසින් ස්වාධීන පරීක්ෂණයක් නැවත ලබාගනු පිණිස කම්කරු කොමසාරිස් ජනරාල් වෙත කරනු ලබන ඉල්ලීම් අවශ්‍යතාවය පරිදි විශේෂ විමර්ශණ අංශය වෙත යොමු කරනු ලැබේ. කම්කරු කොමසාරිස් ජනරාල්ගේ නියෝග සහිතව ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක විමර්ශන කිරීමේ බලය මෙම අංශයට පවතී. එමෙන්ම හදිසි හා ක්ෂණික පරීක්ෂණ හා විශේෂ විමර්ශන රාජකාරී කටයුතු වල යෙදෙන හෙයින් මෙම අංශය දෙපාර්තමේන්තුවේ විශේෂ අංශයකි.

ජනාධිපති කාර්යාලය, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව, පොදු පැමිණිලි කාරක සභාව, මානව හිමිකම් කොමිසම, ඔම්බුඩ්ස්මන් කාර්යාලය, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය මගින් එවන ලද පැමිණිලි පරීක්ෂණ, අර්ධ රාජ්‍ය ආයතන වලට අදාල පැමිණිලි පරීක්ෂණ හා කාර්යාලයීය හා ස්ථානීය පැමිණිලි පරීක්ෂණ සිදු කිරීම හා කම්කරු කොමසාරිස් ජනරාල් වෙත වාර්තා කිරීම විශේෂ විමර්ෂණ අංශයේ කාර්ය භාරය වේ.

ඒ අනුව, 2018 වර්ෂයේදී පැමිණිලි පරීක්ෂණ 501 ක් සිදුකර ඇති අතර, ගණනය කරනලද හිඟ මුදල් වටිනාකම රු. 141,776,811.58 ක් වේ.




ප්‍රස්තාරය 2.9 - විශේෂ විමර්ෂන කටයුතු - 2018

# 3. ශ්‍රමික අයිතීන් ප්‍රමිතිගත කිරීම

## 3.1 හැඳින්වීම

පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ රැකියා සුරක්ෂිතභාවය හා සුභසාධනය කෙරෙහි බලපාන්නා වූ වැටුප්, සේවා තත්ත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සකස් කිරීම, යාවත්කාලීන කිරීම හා ඒවාට නෛතික තත්ත්වය ලබාදීම දෙපාර්තමේන්තුවේ අනවරත ක්‍රියාවලියකි. සේවා තත්ත්වයන් හා කොන්දේසිවලට අදාළව පැන නගින ගැටළු සහගත තත්ත්වයන් නිරාකරණය කර ගැනීමේහිලා ඊට අදාළ පැහැදිලි කිරීම් ලබා දීමද ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමේලා ඇති ප්‍රගතිය මෙන්ම අධීක්ෂණ කාර්යය ද ඉටු කිරීම මගින් සේවක අයිතීන් සුරක්ෂිත කිරීම මෙම කාර්යාවලියේ අත්‍යවශ්‍ය කොටසක් වන අතර, මෙම සමස්ත වගකීම ඉටු කිරීම දෙපාර්තමේන්තුවේ **ශ්‍රම ප්‍රමිති අංශය** විසින් සිදු කරනු ලැබේ.

## 3.2 බලාත්මක නෛතික විධිවිධාන

3.2.1 1941 අංක 27 දරණ පඩිපාලක සභා ආඥා පනත

3.2.2 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත

3.2.3 2005 අංක 36 දරණ සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත

3.2.4 2016 අංක 03 දරණ ජාතික අවම වේතන පනත

3.2.5 2016 අංක 04 දරණ සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත

## 3.3 නෛතික විධිවිධාන ක්‍රියාත්මක කිරීම

දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලවලවල කම්කරු නිලධරයන් විසින් සිදු කරනු ලබන ආයතන පරීක්ෂාවන්හිදී (ශ්‍රමික පරීක්ෂණ) උක්ත නෛතික විධිවිධාන හා අනෙකුත් කම්කරු නීති ක්‍රියාත්මක කිරීම පිළිබඳ පරීක්ෂා කරන අතර විධිවිධාන කඩවූ බවට පැමිණිලි ඉදිරිපත් වූ විටකදී එය විභාග කර සේවක අයිතීන් ආරක්ෂා කිරීමට පියවර ගනු ලැබේ.

### 3.2.1 පඩිපාලක සභා ආඥා පනත

#### 3.2.1.1 පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳ ශ්‍රම ප්‍රමිති අංශයේ කාර්යභාරය

3.2.1.1.1 සේවායෝජක සේවක නියෝජිතයන් පත්කිරීම හා පඩිපාලක සභා පිහිටුවීම, තීරණ වාර්තා කිරීම හා එම වාර්තා ප්‍රසිද්ධ කිරීම යනාදී කාර්යයන්ට අදාළ විධිවිධාන සැකසීම;

පඩි පාලක සභා තීරණ පුවත්පත් / ගැසට් පත්‍රයේ ත්‍රෛභාෂාවෙන් පල කර මහජන අදහස් සඳහා වැඩ කරන දින 14ක කාලයක් ලබාදෙනු ලබයි. යම් සංශෝධන ඉදිරිපත් වුවහොත් නැවත පඩිපාලක සභා රැස්වී වෙනස්කම් අවශ්‍ය වෙතොත් සිදුකර ගරු අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ගැසට් පත්‍රයේ පළකිරීම මගින් එම තීරණ නීත්‍යානුකූල බවට පත් කරනු ලැබේ.

3.2.1.1.2 ක්‍රියාත්මකවන සභා වල තනතුරු වර්ධනය කරමින් අවිධිමත් අංශයේ සේවකයින් හට ආවරණය ලබාදීම.

3.2.1.1.3 වෙනස් වන ආර්ථික සමාජ පරිසරයේ ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් සිටින කර්මාන්ත හඳුනාගැනීම හා ඒවාට අදාළ තොරතුරු දිස්ත්‍රික් කම්කරු කාර්යාල මගින් රැස්කිරීම හා නව සභා පිහිටුවීමට පියවර ගැනීම.

3.2.1.1.4 දැනට පිහිටුවා ඇති කර්මාන්ත වල භාවිතා නොවන සේවා කාණ්ඩ ඇති බැවින් ඒවා හඳුනා ගෙන නව සේවා කාණ්ඩ වලට අදාළව යාවත්කාලීන තීන්දු ගැනීම. (උදා: රබර් වැවීමේ හා තැනීමේ කර්මාන්තය, වරාය නැව් හා තොටුපලවල් හි ප්‍රවාහන කර්මාන්තය)

3.2.1.1.5 අදාළ පඩිපාලක සභා වලට අයත් අවම වැටුප් යාවත්කාලීන කිරීම

**3.2.1.2 පනතේ විධිවිධාන**

කර්මාන්තවල සේවයේ නියුක්තව සිටින්නන්ගේ පඩි සහ වෙනත් පාරිශ්‍රමික විධිමත් කිරීම සඳහා ද පඩි පාලක සභා පිහිටුවීම හා සංස්ථාපනය කිරීම සඳහා ද එකී කරුණුවල සම්බන්ධවූ හෝ අනුෂාංගික වූ වෙනත් කාර්යය සඳහාද විධිවිධාන සැලසීම මෙම ආඥා පනතේ නියමයන් අනුව සිදු කරනු ලැබේ. එහෙයින් යම් සේවයක් සඳහා ගෙවිය යුතු අවම පඩි ප්‍රමාණය, වැඩ කල යුතු පැය ගණන, නිවාඩු ලබා දිය යුතු කාල සීමාවන් හා ඊට අදාල කරුණු පිළිබඳ නියමයන් හා එම නියමයන් පැනවීමට අදාල නෛතික තත්ත්වයන් පිළිබඳ විධිවිධාන මෙම පනතේ ඇතුලත් වේ.

පඩිපාලක සභා ආඥා පනත කොටස් 02 කි.

1. සෑම කර්මාන්තයකටම අදාළ පොදු විධිවිධාන
2. නිශ්චිත කර්මාන්ත 44 කට අදාළ විධිවිධාන (පඩිපාලක සභා 44)

**1 කොටස - සෑම කර්මාන්තයකටම අදාළ පොදු විධිවිධාන**

වැටුප් ගෙවීම, වැටුපෙන් සිදුකරන බලය ලත් අඩුකිරීම්, වැටුප් ගෙවිය යුතු දිනයන්, පෝය නිවාඩු දිනය හා පෝය දින සේවයේ යෙදවීමට අදාළ ගෙවීම් ප්‍රමිති කර වැටුප් වාර්තාවලට අන්තර්ගත කරුණු යනාදී විධිවිධාන සෑම කර්මාන්තයකටම අදාළ වන පරිදි පඩිපාලක සභා ආඥා පනතේ 1 කොටස යටතේ සකසා තිබේ.

**2 කොටස - නිශ්චිත කර්මාන්ත 44 කට අදාළ විධිවිධාන. (පඩිපාලක සභා 44)**

පඩි පාලක සභා ආඥා පනත යටතේ යම් කර්මාන්තයක්, එවැනි කර්මාන්තයක ශාඛාවක් හෝ එවැනි කර්මාන්තයක යම් කාර්යයන් නැතහොත් ක්‍රියාවලියක් සඳහා පඩිපාලක සභාවක් පිහිටුවීමට කම්කරු අමාත්‍යවරයාට බලතල ඇත. පඩි පාලක සභාවක් සේවායෝජක, සේවක හා අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබූ නියෝජිතයන් යන ත්‍රෛපාර්ශවයෙන් සමන්විත යාන්ත්‍රණයක් වේ.

මෙහිදී කර්මාන්තයක් යනු යම් සේවායෝජකයෙකු විසින් හෝ කම්කරුවකු විසින් හෝ කරගෙන යන ඉටු කරන හෝ යම් සේවා යෝජකයකු හෝ කම්කරුවෙකු යෙදී සිටින යම් කර්මාන්තයක්, ව්‍යාපාරයක්, කාර්යයක්, රක්ෂාවක්, වෘත්තියක් හෝ නියුක්තියක් ද කර්මාන්තයක යම් ශාඛාවක්, කාර්යයක් හෝ යම් ක්‍රියාවලියක් ඇතුලත්වේ.

**3.2.1.3 පඩිපාලක සභාවක කාර්යභාරය**

ඒ ඒ පඩිපාලක සභාවලට අදාළ අවම වැටුප් තීරණය කිරීම, වැඩ කරන කාලසීමාව තීරණය කිරීම (දිනකට/සතියකට අදාළ පැය ගණන) වැඩ කල යුතු දින ගණන, අතිකාල, සතියේ නිවාඩු දින හා ඊට අදාළ විධිවිධාන, වාර්ෂික නිවාඩු හා එය ගණනය කරන ආකාරය, ප්‍රසිද්ධ නිවාඩු දින ගණන හා එම දිනවල සේවයේ යෙදීමේදී ගෙවීම් කළ යුතු ආකාරය යනාදී කරුණු සම්පිණ්ඩනය කර ඒ ඒ කර්මාන්තයට අදාළව තීරණ ගැනීම හා ඒවා නෛතික විධිවිධාන බවට පත් කිරීම.

මීට අමතරව, වැටුප්, සේවා තත්ත්වයන් හා කොන්දේසි ස්ථාපිත කිරීම සිදු කෙරේ.

## 3.2.2 සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත

සාප්පු වල හා කාර්යාල වල සේවය කිරීමේ වේලාවන් සහ ඒවායේ සේවකයින්ගේ සැප පහසුකම් විධිමත් කිරීම, වේතන විධිමත් කිරීම හා සාප්පු විවෘත කර තැබිය හැකි වේලාවන් තීරණය කිරීම පිළිබඳ විධිවිධාන මෙම පනතේ අඩංගු වේ.

සාප්පු සහ කාර්යාලවල සේවය කරනු ලබන සේවකයින්ගේ සේවා තත්ත්වයන් හා කොන්දේසි නියම කිරීම, වැඩිදියුණු කිරීම යටතේ වැඩ කරන වේලාවන් නියම කිරීම, සති නිවාඩු දිනය නියම කිරීම හා හිමි වන ආකාරය පෝය නිවාඩු දිනය, වාර්ෂික නිවාඩු දින ගණන හා හිමිවන ආකාරය, ප්‍රසිද්ධ නිවාඩු දින ගණන, අතිකාල ගණනය කරන ආකාරය හා සේවකයන් වෙනුවෙන් සැපයිය යුතු පහසුකම් පිළිබඳව නියමයන් පනවනු ඇත. එසේම සේවකයකු සේවයට බැඳීමේදී පත්වීම් ලිපියක් ලබාදීම මෙන්ම පත්වීම් ලිපියක ඇතුලත් විය යුතු කරුණු පිළිබඳව ද සඳහන් වේ. දෙපාර්ශවය අතර ඇති කරගන්නා සේවා ගිවිසුම අනුව තීරණය වන වැටුප් හා සේවා

කොන්දේසි යනාදී කරුණු සම්බන්ධයෙන් වූ විස්තර පත්වීම් ලිපියක ඇතුළත් විය යුතු බව දක්වා ඇත.

සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ පනත යටතේ, පැමිණීමේ හා පිටවීමේ ලේඛන, නිවාඩු ලේඛන, වැටුප් ලේඛන, සේවා වාර්තා, පත්වීම් ලිපි හා පෞද්ගලික ලිපි ගොනුපවත්වා ගෙන යා යුතු ලේඛනයන් වේ.

### 3.2.3 අයවැය සහන දීමනා පනත

2005 අංක 36 දරණ සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත

සේවායෝජකයන් විසින් සේවකයන්ට අයවැය සහන දීමනාවක් ගෙවීම සඳහා සහ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

යම් කර්මාන්තයක නියුක්තව සිටින රු. 20,000/- ට අඩු වැටුපක් ලබන සෑම සේවකයෙකුටම මාසිකව 2005.08.01 දින සිට රු. 1,000/- ක දීමනාවට හිමිකම් ලබයි. මෙම දීමනාව සියලුම ව්‍යවස්ථාපිත හිමිකම් වලට අදාල කරගත යුතුයි.

2016 අංක 04 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත

සේවායෝජකයන් විසින් සේවකයන්ට අයවැය සහන දීමනාවක් ගෙවීම සඳහා සහ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

යම් කර්මාන්තයක නියුක්තව සිටින රු. 40,000/- ට අඩු වැටුපක් ලබන සෑම සේවකයෙකුටම 2015.05.01 දින සිට රු. 1,500/- ක දීමනාවක් සහ 2016.01.01 දින සිට රු. 2,500/- වන පරිදි දීමනාවක් ලැබීමට හිමිකකම් ලබයි. මෙම දීමනාව සියලුම ව්‍යවස්ථාපික හිමිකම් වලට අදාල වේ.

### 3.2.4 ජාතික අවම වේතන පනත

සේවායෝජකයන් විසින් සේවකයන් හට ගෙවිය යුතු අවම වැටුප සහ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

යම් කර්මාන්තයක නියුක්තව සිටින සෑම සේවකයෙකුටම අවම මාසික වේතනය ලෙස රු. 10,000/- ට නොඅඩු වේතනයක් ගෙවිය යුතු බවට එම පනතින් තීරණය කර ඇත. 2016.01.01 දින සිට ගෙවීමට එම පනතින් තීරණය කර ඇත.

### 3.2.5 ශ්‍රම අයිතීන් ප්‍රමිතිගත කිරීම හැරුනු කොට ශ්‍රම ප්‍රමිති අංශය මගින් සිදු කෙරෙන අනෙකුත් කාර්යය

වැටුපෙන් අඩු කිරීම් සඳහා අනුමැතිය ලබාදීම
ප්‍රසිද්ධ නිවාඩු දිනවල සේවයේ යෙදවීමට අදාළ අනුමැතිය ලබා දීම
දින 05 වැඩ සතිය සඳහා අනුමැතිය ලබා දීම
ක්‍රියාත්මක කරනු ලබන පනත් 05 ට අදාළව නෛතික පැහැදිලි කිරීම් ලබා දීම
සාමූහික ගිවිසුම් වල නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම
පඩිපාලක සභා තීරණ යාවත්කාලීන කිරීම
පඩිපාලක සභා තීරණ පොත සකස් කිරීම (සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාවලින්)

## 3.4 ඉටුකරනු ලැබූ කාර්යයන් - 2018

| අනු අංකය | පඩි පාලක සභාව | වැටුප් යාවත් කාලීන කිරීමට පෙර අවම මාසික වැටුප (මූලික වැටුප ) | වැටුප් යාවත් කාලීන කිරීමට පසු අවම මාසික වැටුප (මූලික වැටුප) |
|---|---|---|---|
| 1 | වැවිලි ක්ෂේත්‍රය | | |
| 1.1 | තේ පිටරට යැවීමේ කර්මාන්තය | 9,660.00 | 14,000.00 |
| 1.2 | රබර් පිටරට යැවීමේ කර්මාන්තය | 8,970.00 | 13,000.00 |
| 1.3 | පොල් වැවීමේ කර්මාන්තය | 9,520.00 | 12,520.00 |

| | | | |
|---|---|---|---|
| 2 | නිෂ්පාදන ක්ෂේත්‍රය | | |
| 2.1 | සම් පදම් කිරීම, පාවහන් හා සම්භාණ්ඩ සැදීමේ කර්මාන්තය | 9,660.00 | 14,500.00 |
| 2.2 | අයිස්, සිසිල් බීම, පළතුරු යුෂ හා ජෑම් සැදීමේ කර්මාන්තය | 9,315.00 | 13,000.00 |
| 2.3 | බිස්කෝතු හා රසකැවිලි සෑදීමේ කර්මාන්තය | 9,660.00 | 13,000.00 |
| 2.4 | ඇඳුම් සැදීමේ කර්මාන්තය | 8625.00 | 12,000.00 |
| 2.5 | පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය | 8,970.00 | 11,000.00 |
| 2.6 | බේකරි කර්මාන්තය | 8970.00 | 10,070.00 |
| 2.7 | රෙදි පිළි නිෂ්පාදන කර්මාන්තය | 9660.00 | 10,000.00 |
| 2.8 | රබර්, ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය | 9315.00 | 10,000.00 |
| 3 | සේවා ක්ෂේත්‍රය | | |
| 3.1 | සාත්තු නිවාස කර්මාන්තය | 9,315.00 | 12,500.00 |
| 3.2 | සිනමා කර්මාන්තය | 8,850.00 | 12,000.00 |
| 3.3 | සිල්ලර හා තොග වෙළඳ කර්මාන්තය | 8970.00 | 11,500.00 |
| 3.4 | හෝටල් හා භෝජන සැපයීමේ කර්මාන්තය | 9660.00 | 10,000.00 |
| 3.5 | මුද්‍රණ කර්මාන්තය | 8970.00 | 10,000.00 |
| 3.6 | ආරක්ෂක සේවා කර්මාන්තය | 8820.00 | 10,000.00 |
| 3.7 | මෝටර් රථ ගමනා ගමන කර්මාන්තය. | 8625.00 | 10,000.00 |
| 3.8 | පවිත්‍රතා සේවා කර්මාන්තය | 380.00 * | 600.00 * |

* දිනක වැටුප

වගුව 3.1 - රු.10,000/- ට අඩු අවම වැටුප් පවතින පඩිපාලක සභා වල අවම වැටුප් යාවත්කාලීන කිරීම -2018

| අනු අංකය | කාර්යය | ලද ඉල්ලීම් සංඛ්‍යාව | ප්‍රතික්ෂේපිත ඉල්ලීම් සංඛ්‍යාව | අනුමැතිය ලැබීමට නියමිත ඉල්ලීම් සංඛ්‍යාව | අනුමැතිය ලබා දුන් ඉල්ලීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | දිනපතහේ වැඩ සතිය සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම | 400 | 42 | 89 | 269 |
| 02 | සාමූහික ගිවිසුම්වල නීතිමය වලගුභාවය පරීක්ෂා කිරීම | 44 | 01 | 11 | 61 |
| 03 | 2016 අංක 04 දරණ අයවැය සහන දීමනාව පනත යටතේ පැහැදිලි කිරීම් හා නීතිමය අර්ථකතන ලබාදීම | 44 | 00 | 17 | 27 |
| 04 | 2016 අංක 03 දරණ ජාතික අවම වේතන පනත යටතේ පැහැදිලි කිරීම් හා නීතිමය අර්ථකතන ලබාදීම | 04 | 00 | 00 | 04 |
| 05 | පඩිපාලක සභා ආඥා පනත යටතේ පැහැදිලි කිරීම් හා නීතිමය අර්ථකතන ලබාදීම | 131 | 00 | 00 | 131 |
| 06 | සාප්පු හා කාර්යාලීය සේවකයින්ගේ (සේවක වේතන විධිමත් කිරීමේ) පනත යටතේ පැහැදිලි කිරීම් හා නීතිමය අර්ථකතන ලබා දීම | 79 | 00 | 00 | 79 |

වගුව 3.2 - අනුමැතිය / නීතිමය අර්ථකතන/ නීතිමය වලංගු භාවය පරීක්ෂා කිරීම - 2018

| පරිවර්තනය කිරීමට නියමිත සංඛ්‍යාව | දමිල මාධ්‍යයට පරිවර්තනය කළ සංඛ්‍යාව |
|---|---|
| 38 | 11 |

වගුව 3.3 - පඩිපාලක සභා තීරණ දමිල මාධ්‍යයට පරිවර්තනය කිරීම - 2018

| අනු අංකය | දිනය | සහභාගී වූ සංඛ්‍යාව | පැවැත් වූ ස්ථානය |
|---|---|---|---|
| 01 | 2018.03.08 | 03 | මහියංගනය |
| 02 | 2018.03.09 | 04 | නුවරඑළිය |
| 03 | 2018.05.17 | 10 | හැටන් |
| 04 | 2018.05.25 | 14 | කුරුණෑගල |
| 05 | 2018.05.28 | 03 | බෙලිඅත්ත |
| 06 | 2018.06.08 | 10 | කහවත්ත |
| 07 | 2018.07.06 | 06 | මතුගම |
| 08 | 2018.07.12 | 07 | අවිස්සාවේල්ල |
| 09 | 2018.07.20 | 09 | ගාල්ල |

වගුව 3.4 - නව පත්වීම්ලත් කම්කරු නිලධාරීන්හට ප්‍රගති සමාලෝචන හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම 2018

# 4. ශ්‍රමිකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව හා අනතුරු රහිත වැඩ පරිසරය තහවුරු කිරීම

## 4.1 වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම

### 4.1.1 හැඳින්වීම

බලපවත්නා කර්මාන්ත ශාලා ආඥා පනත අනුව සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂාවන පරිදි සේවාස්ථානයේ පරිසරය සැකසීම සේවායෝජකයාගේ අනිවාර්ය වගකීමක් වනඅතර, ආරක්ෂිත සේවා පරිසරයක සේවය කිරීමට ඇතිහිමිකම සේවකයන්ගේ මූලික අයිතිවාසිකමක් වේ.

වෘත්තියෙහි නිරතවීමේදී සේවා පරිසරයේ දුර්වලතා මත ශ්‍රමිකයන් රෝග තත්ත්වයනට ගොදුරුවීමේ අවධානම හා හදිසි අනතුරුවලට ගොදුරු වීම අවම කිරීම මගින් වෘත්තිකයන්ට ලබා දිය හැකි ඉහළම කායික, මානසික, සමාජීය හා ආධ්‍යාත්මික සුභ සාධනය සහිත පරිසරයක් සේවා පියස තුල ඇති කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපන දැනුම ලබා දීම හා සේවා පියස තුල ඇති තත්ත්ව පරීක්ෂාවට ලක් කිරීම **වෘත්තීය ස්වස්ථතා අංශයේ** මෙහෙයුම්ක්‍රියාවලියවේ.

මූලික වශයෙන්ම සේවා පරිසරයේ යම් දුර්වලතාමත ක්ෂණිකව හෝ දීර්ඝ කාලීන වශයෙන් ශ්‍රමිකයන් සෞඛ්‍ය ගැටළුවලට මුහුණදීමට සිදුවිය හැකි තත්ත්වයන් පවතින්නේද යන්න විද්‍යාත්මක ක්‍රමවේදයන් යටතේ සොයාබැලීම, එමගින් ඇතිවියහැකි සෞඛ්‍ය ගැටලු ප්‍රමානාත්මක හා ගුණාත්මක ප්‍රමාණනය කිරීම පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් යටතේ සිදුකිරීම, එම අනතුරු වැළැක්වීම සඳහා පියවර ගැනීම හා වලක්වාගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම ප්‍රායෝගිකව සිදුකරනු ලැබේ.

### 4.1.2 කාර්යභාරය

4.1.2.1 සේවා ස්ථාන වල සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂාවට ලක් කිරීම

4.1.2.2 සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව ආරක්ෂා කිරීමට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම

4.1.2.3 වෛද්‍ය මණ්ඩල තීරණ ලබා දීම

4.1.2.4 වෘත්තීය ස්වස්ථතා කරුණු මත වන්දි ඉල්ලුම්කරන අය පිළිබඳ, රෝගී තත්ත්වය ඇති වීම හා සේවා ස්ථානයේ තත්ත්වයන් පිලිබඳව අධිකරණයේදී සාක්ෂි ලබා දීම

4.1.2.5 සේවක භාර අරමුදල වෙතින් අරමුදල් අයදුම්කරන, සේවය කිරීමට නොහැකිවන පරිදි රෝගී තත්ත්වයනට පත්වූ සේවකයන්ගේ රෝග තත්ත්ව ප්‍රමාණනය කිරීම

#### 4.1.2.1 සේවා ස්ථාන වල සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂාවට ලක් කිරීම

සේවා ස්ථානයක විය හැකි සෞඛ්‍ය ගැටළු / අනතුරු මූලික කාණ්ඩ පහක් යටතේ හඳුනා ගැනේ; එනම් භෞතික අනතුරු, රසායන ද්‍රව්‍ය වලින් වන අනතුරු, ජෛව විද්‍යාත්මක හේතුමත සිදුවන අනතුරු, සේවා ස්ථානයේ ව්‍යුහයේ යම් කරුණු මත සිදුවන අනතුරු හා මානසික-සමාජීය අනතුරු වේ. මෙම අනතුරු සිදුවීමට ඇති අවස්ථා තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා මෙම අංශය මගින් පරීක්ෂණ වර්ග කිහිපයක් සිදු කරනු ලබයි. එනම්, පාරිසරික තත්ත්ව අධීක්ෂණ, ජෛව විද්‍යාත්මක අධීක්ෂණ, ශබ්ද මැනීමේ පරීක්ෂණ වේ. මෙම පරීක්ෂණ සිදු කිරීමට අවශ්‍ය නූතන තාක්ෂණික උපකරණ අංශය සතුවන අතර, මිලක් අයකිරීමෙන් තොරව මෙම පරීක්ෂණ සිදු කරනු ලබයි. ඇතැම් ආයතන මිල ගෙවා පෞද්ගලික ආයතනයන්ගෙන්ද මෙම පරීක්ෂණ සිදු කරවා ගනු ලබයි.

ශ්‍රී ලංකාව සේවා ස්ථාන වල සෞඛ්‍ය සුරක්ෂිතතාව පිළිබඳ සම්මතයන් වැඩි දියුණු කර නොමැති අතර, ඇමරිකා එක්සත් ජනපදය හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් භාවිත කරනු ලබන සම්මතයන් අනුව මෙම මැනීම් කරනු ලැබේ.

#### 4.1.2.2 සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව ආරක්ෂා කිරීමට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම

සේවා ස්ථානයක සේවකයන්ගේ සෞඛ්‍යමය ආරක්ෂාව සේව්‍යයන්ගේ වගකීමක් වශයෙන් බොහෝ සේවකයන් විසින් සලකනු ලබයි.මෙම සෘණාත්මක සිතුවිල්ල ආයතන තුල සෞඛ්‍යමය වශයෙන් හානිකර තත්ත්ව ඇතිවීම පාලනයට බාධාවකි. එහෙයින් එක් එක් පුද්ගලයනට මෙම කරුණ කෙරෙහි අවබෝධය ලබා දීම මගින් ඔවුන්ගේ චර්යාවන් නිවැරදි කිරීම සෞඛ්‍යමය අනතුරු අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය කරුණකි. එහෙයින් ඉහළම මට්ටමේ කළමනාකරු සිට පහළම මට්ටමේ සේවකයා දක්වා එක් එක් මට්ටම සඳහා උචිත පරිදි අධ්‍යාපන වැඩසටහන් මෙම අංශය මගින් පවත්වනු ලැබේ.

#### 4.1.2.3 වෛද්‍ය මණ්ඩල තීරණ ලබා දීම

වෛද්‍ය හේතු මත සේවක අර්ථසාධක අරමුදලේ මුදල් කල් පිරීමට පෙර ලබා ගන්නා සේවකයන් වෙනුවෙන් වෛද්‍ය මණ්ඩල පවත්වා තීරණ ලබා දීම සිදු කිරීම.

#### 4.1.2.4 අනෙකුත් ක්‍රියාකාරකම්

"ජාතික වෘත්තීය ස්වස්ථතා හා සෞඛ්‍ය සතිය" සැමරීම

සෑම වසරකම ඔක්තෝබර් දෙවන සතිය මේ සඳහා නම්කර ඇත. 2018 වසරේදී විවිධ ආයතන නියෝජනය කරමින් 150 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ජාතික වෘත්තීය ස්වස්ථතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණය කොළඹ ගලධාරි හෝටලයේදී පවත්වන ලදී. මෙහිදී සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලයේ මහාචාර්ය එස්.කිව්.කොහ් මහතා ආරාධිත ප්‍රධාන දේශනය පවත්වන ලදී. එසේම ආයතන මට්ටමින් මෙම සතිය සැමරීම සඳහා විවිධ ආයතනවලට අවශ්‍ය තාක්ෂණික සහය කර්මාන්තමය සුරක්ෂිතතා අංශය විසින් ලබා දෙන ලදී.

### 4.1.3 වෘත්තීය ස්වස්ථතා අංශය මගින් ඉටුකරනු ලැබූ කාර්යයන් - 2018

| අනු අංකය | වැඩසටහන / ක්‍රියාකාරකම | 2017 වසර සඳහා පරීක්ෂාවට ඉලක්ක ගත ආයතන සංඛ්‍යාව | 2017 වසර තුළ පරීක්ෂාකල ආයතන සංඛ්‍යාව | 2018 වසර සඳහා පරීක්ෂාවට ඉලක්ක ගත ආයතන සංඛ්‍යාව | 2018 වසර තුළ පරීක්ෂාකල ආයතන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | පාරිසරික මිනුම් සංඛ්‍යාව | 110 | 45 | 150 | 170 |
| 02 | ජීව විද්‍යාත්මක පරීක්ෂණ සංඛ්‍යාව | 375 | 1235 | 1000 | 1905 |
| 03 | වෘත්තීය සෞඛ්‍යය හා සුරක්ෂිතතා විගණනයන් සංඛ්‍යාව | 158 | 271 | 250 | 237 |
| 04 | දැනුවත් කිරීම් වැඩසටහන් සංඛ්‍යාව | 220 | 210 | 230 | 222 |
| 05 | සේ.අ.අ (EPF) හා සේ.නි.භා.අ (ETF) වෛද්‍ය මණ්ඩල සංඛ්‍යාව | 24 | 24 | 24 | 24 |
| 06 | ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සතිය | 01 | 01 | 01 | 01 |
| 07 | කර්මාන්තශාලා පරීක්ෂණ සංඛ්‍යාව | - | 316 | - | 407 |

වගුව 4.1 ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය - 2018

## 4.2 අනතුරු රහිත වැඩ පරිසරය තහවුරු කිරීම

### 4.2.1 හැඳින්වීම

කර්මාන්තශාලා තුල සේවයෙහි යෙදෙන ශ්‍රමිකයන් හට භෞතිකමය වශයෙන් යම් ශාරීරික හානි සිදුවීම්, විදුලිය, තාපය, වායු පීඩනය, අධික ආලෝකය හා ශබ්දය මගින් ශාරීරික හානි හෝ මරණය පවා සිදුවීමේ අවධානමක් පවතී. ඒ තුළින් අනතුරු ඇති වීම අවම කිරීම **කර්මාන්තමය සුරක්ෂිතතා අංශයේ** වගකීම වේ. ශ්‍රී ලංකාවේ කර්මාන්තශාලාවල සේවය කරන සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා සුභසාධනයට අදාල නීති පද්ධතිය වනුයේ වර්ෂ 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනත හා එයට අනුකූලව සම්මතකර ඇති රෙගුලාසින්ය. උපද්‍රව රහිත සේවා පරිසරයක් ඇති කිරීම මගින් හානිවීම් පිළිබඳ බියකින් තොර ආරක්ෂිත ශ්‍රම බලකායක් බිහි කිරීම මගින් සේවා ස්ථාන වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත් එමගින් දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමත් ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය ඉහළ නැංවීමත් අපේක්ෂා කෙරේ.

### 4.2.2 කාර්යභාරය

ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි පිහිටුවා ඇති දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10හි සේවයේ නියුතු ඉංජිනේරුවරු 31 දෙනා විසින් කර්මාන්තශාලා පරීක්ෂා කර මෙම කාර්ය ඉටු කරනු ලබන අතර, කම්කරු නිලධරයන් විසින් කරනු ලබන කම්කරු පරීක්ෂණ වලදී හඳුනා ගැනෙන අනතුරුදායක තත්ත්වයන් දිස්ත්‍රික් කර්මාන්තශාලාපරීක්ෂක ඉංජිනේරු කාර්යාල වෙත වාර්තා කරනු ලබන හෙයින් එම තොරතුරුද භාවිත කොට සේවක ආරක්ෂාව සැලසීම කරනු ලබයි. මූලික වශයෙන් කර්මාන්තමය සුරක්ෂිතතාව සැලසීම සඳහා පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

4.2.2.1 නව කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම.
4.2.2.2 ගොඩනැගිලි පිඹුරුපත් පරීක්ෂා කිරීම හා අනුමත කිරීම
4.2.2.3 කර්මාන්තශාලා පරීක්ෂා කිරීම
4.2.2.4 අනතුරු විමර්ශනය සහ අන්තරාදායී සිදුවීම් විමර්ශනය
4.2.2.5 නීතිමය පියවර ගැනීම
4.2.2.6 අධි අන්තරාදායී යන්ත්‍ර පරීක්ෂාව නියාමනය කිරීම
4.2.2.7 පැමිණිලි විමර්ශනය
4.2.2.8 දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම
4.2.2.9 වෘත්තීය අනතුරු හා ලෙඩ රෝග වලට ගොදුරු වන්නන් කම්කරු වන්දි කොමසාරිස් හා ශ්‍රම වාසනා අරමුදල වෙත යොමු කිරීම
4.2.2.10 වෙනත් වැඩසටහන්
4.2.2.11 කම්කරු දෙපාර්තමේන්තුවේ හා අමාත්‍යාංශයේ ඉංජිනේරුමය කටයුතු ඉටු කිරීම

#### 4.2.2.1 නව කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම

නව කර්මාන්තශාලා ආරම්භ කිරීමේදී හෝ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කල අවස්ථා වලදී එම කර්මාන්තශාලා වල අනාරක්ෂිත බව වැළකෙන නියමිත ප්‍රමිතීන් අනුගමනය කර තිබේද යන්න පරීක්ෂා කර බලා එසේ නොමැති නම් ඒවා නිවැරදි කර ගැනීමට උපදෙස් දීම හා නියමිත ප්‍රමිතින් හා සම්මතයන් අනුගමනය කර තිබේ නම් ලියාපදිංචි කිරීම.

2018 වසර අවසන් වන විට මෙම අංශයේ ලියාපදිංචි වී ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව 30,050ක් පමණ වේ. වසර තුල ලියාපදිංචි කරන ලද නව කර්මාන්තශාලා සංඛ්‍යාව 1,429 කි. මෙම කර්මාන්තශාලා වල සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා සුභසාධනය ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීමත් නව කර්මාන්තශාලා ලියාපදිංචි කිරීමත් අංශය මඟින් අඛණ්ඩව සිදු කෙරේ.

#### 4.2.2.2 ගොඩනැගිලි පිඹුරුපත් පරීක්ෂා කිරීම හා අනුමත කිරීම

කර්මාන්තශාලා සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේදී ඒවා කර්මාන්තශාලා ආඥා පනතට අනුකූල වන්නේ ද යන්න පරීක්ෂා කිරීම හා ඒ බව සහතික කිරීම සිදු කෙරේ. 2018 වර්ෂය තුලදී ගොඩනැගිලි පිඹුරුපත් 123ක් පරීක්ෂා කර සහතික කර ඇත..

#### 4.2.2.3 කර්මාන්තශාලා පරීක්ෂා කිරීම

තම කාර්යාල බල ප්‍රදේශය තුල පවත්නා කර්මාන්තශාලා පරීක්ෂා කර, අනතුරු ඇතිවීමේ තත්ත්ව පවතීද යන්න පරීක්ෂා කර ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම කටයුතු කරනු ලබයි.

සෑම වසරකම කර්මාන්තශාලා පරීක්ෂණ ඉලක්කයන් අනුව කටයුතු කරනු ලබන අතර, මෙම ඉලක්කයන් සපුරාලීම සඳහා සෑම නිළධාරියෙකුම කටයුතු කරනු ලබයි. 2018 වසර තුල කර්මාන්තශාලා 4,424 ක ප්‍රමාණයක් පරීක්ෂා කර ඇත.

#### 4.2.2.4 අනතුරු විමර්ශනය සහ අන්තරාදායී සිදුවීම් විමර්ශනය

2018 වර්ෂය තුල මරණීය අනතුරු 103ක් හා මරණීයනොවනඅනතුරු 1,492ක ප්‍රමාණයක් අංශයට වාර්තා වී ඇත. මෙම මරණීය අනතුරු සියල්ලම හා මරණීය නොවන බරපතල අනතුරු විමර්ශනය කර අනතුරට හේතු සොයා ගැනීම තුලින් එවැනි අනතුරු නැවත සිදු නොවන ආකාරයට කටයුතු කිරීමට ආයතන දැනුවත් කිරීමත් කර්මාන්තශාලා ආඥා පනත උල්ලංඝණය වන පරිදි කටයුතු කිරීම තුලින් අනතුරු සිදුවී ඇති අවස්ථාවන්හි දී එම ආයතනයන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත.

| අනු අංකය | අනතුරු කාණ්ඩය | විමර්ශනය කරන ලද සංඛ්‍යාව |
|---|---|---|
| 01 | මරණීය | 103 |
| 02 | මරණීය නොවන | 106 |

වගුව 4.2 - අනතුරු විමර්ශනය - 2018

#### 4.2.2.5 නීතිමය පියවර ගැනීම

කර්මාන්තශාලා පරීක්ෂණයන් හා අනතුරු විමර්ශනයන් වලදී කර්මාන්තශාලා ආඥා පනත උල්ලංඝණය වී ඇති බවට තහවුරු වූ විටදී එම ආයතනයන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීමට කටයුතු කෙරේ. 2018 වර්ෂය තුලදී පනත උල්ලංඝණය කිරීමට අදාලව කර්මාන්තශාලාවන්ට විරුද්ධව නඩු 35ක් පවරා ඇත.

කර්මාන්තශාලා ආඥා පනත යටතේ ගන්නා ලද අධිකරණ ක්‍රියා මාර්ග




ප්‍රස්තාරය 4.1 - කර්මාන්තශාලා ආඥා පනත යටතේ ගන්නා ලද අධිකරණ ක්‍රියා මාර්ග - 2018

#### 4.2.2.6 අධි අන්තරායදායී යන්ත්‍ර පරීක්ෂාව නියාමනය කිරීම

කර්මාන්තශාලා ආඥා පනත යටතේ පරීක්ෂාවට භාජනය කර පරීක්ෂණ වාර්තා ලබා ගත යුතු, කර්මාන්තශාලා වල භාවිතා කරන යන්ත්‍ර පරීක්ෂා කරවීමට කටයුතු කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ. එලෙස 2018 වර්ෂය තුලදී පරීක්ෂාවට භාජනය කරන ලද යන්ත්‍ර සූත්‍ර සංඛ්‍යාව 8,407 කි. මෙම පරීක්ෂණයන්හි වාර්තාවන් අනුව එම යන්ත්‍රයන්හි සිදුකල යුතු අළුත්වැඩියාවන් සිදුකරන්නේද යන්න සොයා බලා සුරක්ෂිත සේවා ස්ථානයක් ඇතිකරලීමට කටයුතු කිරීම මෙම අංශය යටතේ සිදු කෙරේ.

#### 4.2.2.7 පැමිණිලි විමර්ශනය

කර්මාන්තශාලා සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යයට අදාලව ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම හා පවතින ගැටළු නිරාකරනය කිරීමද මෙම අංශයේ කාර්යයකි. 2018 වර්ෂය තුල පැමිණිලි 135ක විමර්ශනය සිදු කර ඇත.

#### 4.2.2.8 දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය ඉහළ නැංවීම් කටයුතු වලදී නීති රීති ක්‍රියාත්මක කිරීම මෙන්ම සේවක, සේව්‍ය දෙපාර්ශවයේම දැනුම වර්ධනය කිරීම ඉතා වැදගත් වේ. එබැවින්, මෙම අංශය මඟින් සේවක, සේව්‍ය දෙපාර්ශවයම සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වෙන අතර මීට අමතරව කාර්මික විද්‍යාලවල ඉගෙනුම ලබන සිසු සිසුවියන් සඳහාද දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වේ. 2018 වර්ෂය තුලදී වැඩමුළු 173 ක් පවත්වා ඇති අතර, එම වැඩමුළු සඳහා සහභාගී වූ පුද්ගලයින් සංඛ්‍යාව 14,132කි. මෙයට අමතරව අත්පත්‍රිකා බෙදාහැරීම මඟින්ද වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමද සිදුකෙරේ. 2018 වසර තුලදී අත්පත්‍රිකා 12,000 ක ප්‍රමාණයක් මුද්‍රණය කර බෙදාහැර ඇත.



ඡායාරූපය 4.1 - 2018-11-16 දින තේ කර්මාන්තශාලා සේවකයින් සඳහා නුවරඑලිය දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවනාගාරයේ පැවැත්වූ වැඩමුළුව



ඡායාරූපය 4.2 - 2018-05-24 දින කුරුණෑගල කාර්මික විද්‍යලයේ පැවැත්වූ වැඩමුළුව

| අනු අංකය | අදාල අංශය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම්වූ මුදල (රු) |
|---|---|---|---|---|
| 01 | ඉදිකිරීම් | 78 | 4690 | 470,000.00 |
| 02 | ඇඟළුම් | 30 | 2690 | 300,000.00 |
| 03 | වෙනත් නිෂ්පාදන | 37 | 2820 | 250,000.00 |
| 04 | වෙනත් | 9 | 1200 | 180,000.00 |
| 05 | එකතුව | 154 | 11400 | 1,200,000.00 |

වගුව 4.3 දැනුවත් කිරීමේ වැඩසටහන් - නිෂ්පාදන ක්ෂේත්‍රය අනුව

| පැවැත්වූ දිනය | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීවූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම්වූ මුදල (රු) |
|---|---|---|---|
| 2018.03.13 - 2018.11.29 | 19 | 2732 | 1,212,014.00 |

වගුව 4.4 දැනුවත් කිරීමේ වැඩසටහන් - වෙනත්

| වර්ෂය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීවූ නිලධාරීන් සංඛ්‍යාව | වැය වූ මුදල රු. |
|---|---|---|---|
| 2018 | 02 | 75 | 59,700.00 |

වගුව 4.5 නිලධාරි පුහුණු වැඩසටහන්

**4.2.2.9 වෘත්තීය අනතුරු හා ලෙඩ රෝග වලට ගොදුරු වන්නන් කම්කරු වන්දි කොමසාරිස් හා ශ්‍රම වාසනා අරමුදල වෙත යොමු කිරීම**

2018 වර්ෂය තුලදී වාර්තා වූ මරණීය අනතුරු 103ක් ස්ථිර දුබලතාවයන්ට පත්වූ අනතුරු 102 ක් හා වෘත්තීය රෝග 11ක් කම්කරු වන්දි කොමසාරිස් වෙත යොමු කර වින්දිතයන්ගේ යැපෙන්නන්ට හා වින්දිතයන්ට වන්දි ලබා ගැනීමට කටයුතු සලසා ඇත.

මීට අමතරව වින්දිත පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීමට අදාල තොරතුරු ශ්‍රම වාසනා අරමුදල වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.

**4.2.2.10 වෙනත් වැඩසටහන්**

**ලෝක සුරක්ෂිතතා දිනය සැමරුම**

2018.04.27 දින ලෝක සුරක්ෂිතතා දිනය වෙනුවෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්තමය සුරක්ෂිතතා අංශය විසින් ජාතික සම්මන්ත්‍රණයක් ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. එය කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයීය 10වන මහලේ ශ්‍රවනාගාරයේදී සේව්‍ය සේවක 250 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය සැමරුම**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය සම්බන්ධයෙන් පැවැත්වූ ජාතික සම්මන්ත්‍රණය 2018.10.11 දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ 07 සච්සිරිපාය ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී. සේව්‍ය සේවක 250 දෙනෙකු සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය පිළිබඳ දේශන සහ වැඩසටහන් පවත්වන ලදී.

**4.2.2.11 කම්කරු දෙපාර්තමේන්තුවේ හා අමාත්‍යාංශයේ ඉංජිනේරුමය කටයුතු ඉටු කිරීම**

දෙපාර්තමේන්තුවේ හා අමාත්‍යාංශයේ ඇතැම් ඉංජිනේරුමය කටයුතු ඉටු කිරීමද මෙම අංශය මඟින් ඉටු කෙරේ. මේ යටතේ දෙපාර්තමේන්තුවේ හා අමාත්‍යාංශයේ වාහන නඩත්තු කටයුතු අධීක්ෂණය කිරීමත් ප්‍රසම්පාදන කමිටු සඳහා තාක්ෂණික ඇගයීම් වාර්තා ලබා දීමත් සිදු කෙරේ.

| ක්‍රියාකාරකම | ඉටුකල ප්‍රමාණය | | |
|---|---|---|---|
| | 2016 වසර | 2017 වසර | 2018 වසර |
| 4.3.1 නව කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම | 1372 | 1464 | 1,429 |
| 4.3.2 ගොඩනැගිලි පිඹුරුපත් පරීක්ෂා කිරීම හා සහතික කිරීම | 149 | 151 | 123 |
| 4.3.3 කර්මාන්තශාලා පරීක්ෂා කිරීම | 4975 | 4943 | 4,424 |
| 4.3.4 අනතුරු විමර්ශනය සහ අන්තරායදායී සිදුවීම් විමර්ශනය | 151 | 165 | 209 |

| | | | |
|---|---|---|---|
| 4.3.5 නීතිමය පියවර ගැනීම | 13 | 15 | 35 |
| 4.3.6 අධි අන්තරාදායී යන්ත්‍ර පරීක්ෂාව නියාමනය කිරීම | 9007 | 7530 | 8,407 |
| 4.3.7 පැමිණිලි විමර්ශනය | 103 | 98 | 135 |
| 4.3.8 දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම | 177 | 189 | 199 |
| 4.3.1 වෘත්තීය අනතුරු හා ලෙඩරෝග වලට ගොදුරුවන්-නන් කම්කරු වන්දි කොමසාරිස් හා ශ්‍රම වාසනා අරමුදල වෙත යොමු කිරීම | 140 | 151 | 216 |

වගුව 4.6 කර්මාන්තමය සුරක්ෂිතතා අංශයේ කාර්යය ඉටුකිරීමේ ප්‍රගතිය - 2018

# 5. ස්ත්‍රීන්, තරුණ ශ්‍රමිකයන්ගේ වෘත්තීය හිමිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම

## 5.1 හැඳින්වීම

ශ්‍රී ලාංකීය ශ්‍රම බලකාය තුල කාන්තා දායකත්වය 35.0%ක් වන අතර, අනෙකුත් සංවර්ධන දර්ශකයන්ට සාපේක්ෂව මෙම අගය පිළිගත හැකි මට්ටමකින් ඉහළ නැංවීම හා ළමා ශ්‍රමය මුළුමනින් තුරන් කිරීම ශ්‍රී ලංකා රජයේ අත්‍යවශ්‍ය වගකීමක්ව පවතී. එහෙයින් මෙම වගකීම කාන්තා හා ළමා කටයුතු අංශයේ කාර්යයන්හි මූලික දෙවැදෑරුම් වගකීම බවට පත්ව තිබේ.

පසුගිය දශක දෙකක් තිස්සේ ශ්‍රම බලකාය තුල කාන්තා දායකත්වය අගය වරින්වර යම් ඉහළ පහළ යාම් සහිතව 39.05% අගයෙහි ආසන්නව රැඳී පවතී. පවුල් ඒකකය තුල හා සාමාජීය වශයෙන් කාන්තාවට පැවරී ඇති වගකීම් භාරය පිළිබඳවද අවධානය සහිතව කාන්තා ශ්‍රමිකයා හට සිය වැඩබිමෙහි අයිතීන් තහවුරු කිරීම මෙම අගය ඉහළ නැංවීමේ අභියෝගය ජය ගැනීමේ අත්‍යවශ්‍ය අංගයක් විය යුතුව ඇත. එහෙයින්, වැඩ බිමෙහි කාන්තාවන් ආවරණය වන කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම, එම නීති කාලීනව සමාලෝචනය කරමින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ කිරීම මගින් ඵලදායී කාන්තා ශ්‍රම දායකත්වයක් රටට ලබාදීම මෙම අංශයේ එක් ප්‍රමුඛ වගකීමක් වේ.

ළමා ශ්‍රමය තුරන් කිරීමෙහිලා ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය අතිශය කැපී පෙනෙන එකකි. 1999 වසරේදී 21.35% ව පැවති ආර්ථිකමය වටිනාකමක් සහිත කාර්යයන්ගේ නිරතවූ ළමා ශ්‍රමික ප්‍රතිශතය 2016 වන විට 2.3% දක්වා අඩුවී තිබිණ. වයස 05-17 අතර ළමා ජනගහනයෙන්, ළමා ශ්‍රමය හෝ අනතුරුදායක ළමා ශ්‍රමය පවතින බවට හඳුනාගෙන ඇති ප්‍රමාණය එම ළමා ජනගහනයෙන් 01% කි. 2020 දී ළමා ශ්‍රමය මුළුමනින්ම තුරන් කිරීම අරමුණු කොටගෙන ඇති හෙයින් සියලු පාර්ශවකරුවන්ගේ දායකත්වය සහිතව ළමා ශ්‍රමය තුරන් කිරීම, වයස අවුරුදු 18 ට අඩු ළමුන් සඳහාවන කම්කරු නීති ක්‍රියාත්මක කිරීම, පවත්නා නීතිය සංශෝධනය කොට වර්තමාන සමාජ ගැටළු වලට අදාලව, පවත්නා නීතියෙහි කලයුතු සංශෝධනයන් නිර්දේශ කිරීම මෙම අංශයේ ප්‍රමුඛ වගකීම වේ.

## 5.2 කාර්යභාරය

5.2.1 රැකියාවන්හි නිරත කාන්තාවන් හා ළමුන් කෙරෙහි අදාල වන්නාවූ පනත්හි විධිවිධාන ක්‍රියාවට නැගීම හා ඒ සඳහා කලාප හා දිස්ත්‍රික් කම්කරු කාර්යාල මෙහෙයවීම

5.2.2 කාන්තාවන් හා ළමුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දීප ව්‍යාප්තව සිදු කිරීම

5.2.3 රැකියාවන්හි නියුතු කාන්තාවන්ට හා ළමුන්ට අදාලව පවත්නා නීතිය අධ්‍යයනය කොට දුර්වලතා හා ඌනතා හඳුනාගෙන නීතිය ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම

5.2.4 ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය යන මට්ටම් වලින් පවත්වනු ලබන ළමා සංවර්ධන කමිටු වලදී සබල දායකත්වයක් ලබා දීම.

5.2.5 රැකියාවල නියුතු කාන්තාවන් සඳහා නිදහස් වෙළඳ කලාපයන්හි පිහිටුවා ඇති කම්කරු දෙපාර්තමේන්තුවට අයත් කාන්තා නේවාසිකාගාර නඩත්තුව

5.2.6 කාන්තා හා ළමා අංශයේ කාර්ය මණ්ඩල සංවර්ධන කාර්යයන්

## 5.3 බලාත්මක නෛතික විධිවිධාන

### 5.3.1 ස්ත්‍රීන් තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත (1956 අංක 47)

සේවයේ යෙදෙන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සම්බන්ධයෙන් 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලීය

සේවකයන් පිළිබඳ පනත මගින් ආවරණය නොවන කරුණු මෙම පනත මගින් ආවරණය කෙරේ. මෙම පනත මගින් ආවරණය වන ප්‍රධාන කරුණු වශයෙන්, සේවයේ යෙදිය හැකි අවම වයස, සේවයේ යෙදවීමේ සාමාන්‍ය කොන්දේසි, කාන්තාවන් රාත්‍රී සේවයෙහි යෙදවීම පිලිබඳ කොන්දේසි, තරුණ අය අනතුරුදායක රැකියාවල යෙදවීම පිළිබඳ කොන්දේසි හා ප්‍රධාන ව්‍යාතිරේකයන් ඇතුලත් වේ.

### 5.3.2 ප්‍රසූතිකාධාර පනත

ගර්භනී කාලය හා මව්කිරි දීමේ කාල සීමාව තුල රැකියාව සම්බන්ධයෙන් පවත්නා කොන්දේසි ආවරණය වේ. සෑම සජීවී උපතකදීම දින 84 ක වැටුප් සහිත ප්‍රසූත නිවාඩු හිමිකම හා ළදරුවාට වසර 01 ක් වන තෙක් මව්කිරි ලබා දීම සඳහා සේවා කාලය තුල කාලාන්තරයන් ලබා දීම, මල දරු උපතකදී වැටුප් සහිත නිවාඩු ලබා ගැනීමේ අයිතිය හා රැකියා සුරක්ෂිතතාව ලබා දීම මෙම පනත මගින් ආවරණය කෙරේ.

ඉහත පනත් දෙකට අමතරව පතල්වල සේවය කරන කාන්තාවන් පිළිබඳ පනත (1973 අංක 13 දරණ පනත) හා කාර්මාන්තශාලා ආඥා පනත (1942 අංක 45) හිද සේවයේ නියුතු කාන්තාවන් තරුණ අය හා ළමුන් පිළිබඳ කොන්දේසි හා සීමා දක්වා ඇත.

## 5.4 කාර්යයන් ඉටුකිරීම - 2018

රැකියාවන්හි නියුතු කාන්තාවන් තරුණ අය හා ළමුන්ගේ වෘත්තියමය ආරක්ෂාව උදෙසා ඉටුකරන ලද කාර්යය ප්‍රධාන කරුණු තුනක් යටතට ගැනේ.

5.4.1 රැකියාවක නියුතු කාන්තාවන් තරුණ අය හා ළමුන් පිළිබඳ පවතින නීති ක්‍රියාත්මක කිරීම

5.4.2 රැකියාවක නියුතු කාන්තාවන් තරුණ අය හා ළමුන්ගේ වෘත්තිමය ආරක්ෂාව සඳහා වන නීති ක්‍රියාත්මක තත්ත්වයේ පවත්වා ගැනීම ප්‍රවර්ධනය සහ නීති කඩ කිරීම වැළැක්වීම සඳහා අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

5.4.3 පවතින නීති පද්ධතිය සමාලෝචනය කර අවශ්‍ය සංශෝධන සිදු කිරීම

5.4.1 රැකියාවක නියුතු කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ පවතින නීති ක්‍රියාත්මක කිරීම.

### 5.4.1.1 කාලීන පරීක්ෂා කිරීම්

වැඩ බිමෙහි සේවය කරන කාන්තාවන් හට කම්කරු නීතිය මගින් තහවුරු කර ඇති සේවා කොන්දේසි සහ තත්ත්වයන් ඒ ආකාරයෙන්ම භුක්ති විදීමට අවශ්‍ය වාතාවරණය සකසා ඇතිදැයි පරීක්ෂා කිරීම මෙම පරීක්ෂණ මගින් සිදුවේ. කාන්තාවන්හට විධිමත්ව ප්‍රසූති නිවාඩු සහ ප්‍රසූතිකාධාර ගෙවන්නේද යන්න, ගර්භණී තත්ත්වයේ සිටින කාන්තාවන් හට නියමිත පහසුකම් සලසන්නේද යන්න, තරුණ අය සේවයේ යොදවා ඇත්නම් අනතුරුදායක රැකියාවන්හි යෙදවීමෙන් වළකින්නේද යන්න හා බාලවයස්කාර දරුවන් සේවයේ යොදවා ගන්නේද යන්න පරීක්ෂා කිරීමත් අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා උපදෙස් දීම මෙන්ම, අනාවරණය වන උල්ලංඝනය කිරීම් පිළිබදව නීති මගින් කටයුතු කිරීම නිර්දේශ කිරීමත් මෙම පරීක්ෂණ මගින් සිදු කෙරේ.

### 5.4.1.2 පරීක්ෂණ පැවැත්වීම්

කම්කරු දෙපාර්තමේන්තුවට යොමු කෙරෙන ළමා ශ්‍රමය සහ අනතුරුදායක ළමා ශ්‍රමය පිළිබඳ පැමිණිලි සහ කාන්තාවන් සේවයේ යෙදවීම පිළිබඳ පැමිණිලි අවශ්‍ය පරිදි විමර්ෂණය කිරීමත් ජනාධිපති කාර්යාලය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, සහ අනෙකුත් ආයතන වෙත වාර්තා කිරීමත් සිදුකෙරේ. මෙයට අමතරව විශේෂ හදිසි පරීක්ෂණ හා නීති කඩකිරීම් පිළිබඳ සිදුවීම් පිළිබඳ අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම් මගින් නීතිය ක්‍රියාවට නැංවීම සිදු කෙරේ.

| අනු අංකය | කාණ්ඩය | සංඛ්‍යාව | නිරීක්ෂණ |
|---|---|---|---|
| 01 | දෛනික පරීක්ෂණ | 824 | කාන්තා හා ළමා කටයුතු අංශය මගින් සිදුකර ඇති මෙම පරීක්ෂණ වලදී අනාවරණය වූ අඩුපාඩු නිවැරදී කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලද අතර නිසි උප-දෙස් පිළි නොපදින අවස්ථාවන්හිදී නීති මගින් කටයුතු කරන ලදී. |
| 02 | ළමා ශ්‍රමය පිළිබඳ පරීක්ෂණ | 127 | 2016 වර්ෂයේ ලද පැමිණිලි 13ක්ද, 2017 වර්ෂයේ ලද පැමිණිලි 40ක් සහ 2018 වසරේ ලද පැමිණිලි 76 ක්ද සම්බන්ධ පරීක්ෂණ අවසන් කරන ලදී. ළමා ශ්‍රමය තහවුරු වූ අවස්ථා 3 ක් සම්බන්ධයෙන් අධිකරණ කටයුතු ආරම්භ කරන ලදී.<br>අවසන් කරන ලද නඩු ගණන - 01 |
| 03 | කාන්තාවන්ගේ සේවා කොන්දේසි පිළිබඳව ලැබුණු පැමිණිලි පරීක්ෂණ | 25 | ප්‍රසූතිකාධාර සම්බන්ධ පැමිණිලි 09ක් හා වෙනත් පැමිණිලි 16 ක් පිළිබඳ පරීක්ෂණ කටයුතු අවසන් කරන ලදී. |
| 04 | කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම | 579 | මෙම අනුමැතීන් මගින් කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමේදී ඔවුනට ලබා දිය යුතු අවම පහසුකම් තහවුරු කරයි. |
| 05 | අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිළිබඳ විශේෂ කාණ්ඩායම් පරීක්ෂණ | 100 | අයතන 472ක් පරීක්ෂා කරන ලදී. මෙම ආයතනයන්හි අනතුරුදායක රැකියාවන්හි තරුණ අය සේවයේ යොදවා නොමැති බව අනාවරණය විය. |
| 06 | කාන්තා ශ්‍රමිකයන් පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ | 71 | ආවරණය වූ කාන්තා ශ්‍රමිකයන් ගණන 5943කි.<br>ආවරණය වූ නීති කඩකිරීමේ අවස්ථා ගණන 57<br>(මේ සඳහා නීත්‍යානුකූල පියවර ගන්නා ලදී.) |

වගුව 5.1 - රැකියාවක නියුතු කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ පවතින නීති ක්‍රියාත්මක කිරීම - 2018

| අනු අංකය | උල්ලංඝනය කළ නීතිය | වාර්තා වූ උල්ලංඝනය වීම් අවස්ථා ගණන | අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා ලද සංඛ්‍යාව | පවත්නා අධිකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වෙමින් පවතින ගණන | අවසන් කළ ගණන |
|---|---|---|---|---|---|
| 01 | ස්ත්‍රීන් තරුණ අය හා ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ පනත | 10 | 05 | 03 | 02 |
| 02 | ප්‍රසූතිකාධාර පනත | 00 | 00 | 00 | 00 |

වගුව 5.2 - අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම් - 2018

5.4.2 රැකියාවක නියුතු කාන්තාවන් තරුණ අය සහ ළමුන්ගේ වෘත්තීයමය ආරක්ෂාව සඳහා වන නීති ක්‍රියාත්මක තත්ත්වයේ පවත්වා ගැනීම ප්‍රවර්ධනය සහ නීති කඩකිරීම් වැළැක්වීම සඳහා අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

**5.4.2.1 අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

5.4.2.1.1 සේවකයන්, සේවාදායකයන් හා වෙනත් අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

5.4.2.1.2 අදාළ ප්‍රධාන සැමරුම් දිනයන් පැවැත්වීම මගින් දැනුවත් කිරීම

■ **ජාත්‍යන්තර කාන්තා දිනය**

වැවිලි ක්ෂේත්‍රයට කාන්තා ශ්‍රමිකයන් විසින් ලබාදෙන ලද ශ්‍රම දායකත්වය ඇගයුමට ලක් කරමින් එම අංශයේ ශ්‍රමික කාන්තාවන් 105 දෙනෙකු හට "දිරිය රන් ලිය" සම්මානය, 2018 කාන්තා දින සැමරුමේදී ප්‍රදානය කරන ලදී.

■ **ජාත්‍යන්තර කම්කරු දිනය**

හඳුනාගත් දුර්වල කණ්ඩායම් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් 5ක් පවත්වන ලදී. අධ්‍යාපනය අඛණ්ඩව ලබා ගැනීමේ වැදගත්කම හා වෘත්තීන්හි නිරතවීමේදී ළමුන්ට බල පවත්වන සීමාවන් මෙහිදී දැනුවත් කරන ලදී.

"කාන්තා ශ්‍රමිකයන් හා රාත්‍රී සේවය" පිළිබඳව එක්සත් රාජධානියේ වර්වික් සරසවිය මගින් සිදු කරන ලද ගුණාත්මක පර්යේෂණය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර, එම පර්යේෂණයේ සොයාගැනීම් ජාතික කම්කරු උපදේශක සභාවට ඉදිරිපත් කිරීමට තීරණය විය.

■ **ළමා ශ්‍රමයට එරෙහි ජාත්‍යන්තර දිනය**

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සුනිසි මෙහෙවර හා ධරණීය සංවර්ධනය සඳහා 2030 සැලැස්ම වැඩ සටහනේ අංක 8.7 යටතේ වන ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳව නියමු රටක් වශයෙන් පිළිගැනීමට ලක්වීම ශ්‍රී ලංකාව ලද අති විශිෂ්ඨ ජයග්‍රහනයකි. මෙය ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳව ශ්‍රී ලංකාව ගන්නා ලද ඵලදායී, සාධනීය පියවරයන් වෙනුවෙන් ලද මාහැඟි පිළිගැනීමකි. දකුණු අප්‍රිකාවේ කම්කරු අමාත්‍යාංශය නියෝජ්‍ය ඇමතිතුමන් ඇතුළු දූත පිරිසක් 2018 ඔක්තෝබර් මාසයේදී, ළමා ශ්‍රමය තුරන් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කළ රත්නපුර දිස්ත්‍රික්කයේ අදාළ නිලධරයන් හමුවීම හා සංචාරය කිරීම මෙම පිළිගැනීමට ලක්වීමේ ප්‍රතිඵලයකි.



ඡායාරූපය 5.1 - දකුණු අප්‍රිකාවේ කම්කරු අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිතුමන් සහ කම්කරු කොමසාරිස් ජනරාල් හමුව

ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාත්‍යන්තර දිනය වෙනුවෙන් ඒ පිළිබඳව රූපවාහිනී වැඩසටහන් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහයෝගිතාව සහිතව සිදු කරන ලදී.

■ **ජාත්‍යන්තර ළමා දිනය**

මෙම සැමරුමේදී ප්‍රවර්ධනය හා වැලැක්වීමේ කාර්ය මූලික අරමුණක් වශයෙන් සලකා කටයුතු කරනු ලැබේ.

5.4.2.1.3. හිංසනයට ලක්විය හැකි පුද්ගලයන් හා මෙම කරුණේදී පාර්ශවකරුවන් වන අය සඳහා දැනුවත් කිරීමේ හා අධ්‍යාපනය ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම

5.4.2.1.4. ලිංගිකභාවය පදනම්ව සේවා ස්ථාන තුල හිංසනය සිදුවීම සම්බන්ධයෙන් මේ වන විට තොරතුරු අනාවරණය කර ගැනීමේ හා පවත්නා තත්ත්වය පිළිබඳ තක්සේරු කර ගැනීම සඳහා වැඩමුළුවක් පවත්වන ලදී.

**5.4.2.2. පවතින නීති පද්ධතිය සමාලෝචනය කර අවශ්‍ය සංශෝධන සිදු කිරීම. (2018 සුවිශේෂ ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇත.)**

5.4.2.3. සහන සේවා

කටුනායක හා කොග්ගල පිහිටි අපනයන සැකසුම් කලාපයන්හි කාන්තා නේවාසිකාගාර දෙකක් පවත්වාගෙන යන අතර, සහන මිලක් යටතේ කාන්තා ශ්‍රමිකයන් ඒවායේ පහසුකම් ලබා ගනිති.

**5.4.2.4. වෙනත් දෙපාර්තමේන්තු මගින් කාන්තාවන් තරුණ අය ළමුන්ගේ වෘත්තිය සුරක්ෂිතතාව වෙනුවෙන් සිදු කෙරෙන කාර්යයන්හිදී සහය වීම්**

5.4.2.4.1. ලිංගික හා ලිංගිකභාවය මත පදනම්ව සිදු කරන හිංසන වැලැක්වීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී දායක වීම

5.4.2.4.2. ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී දායක වීම

5.4.2.4.3. ළමුන් සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී දායක වීම

5.4.2.4.4. මිනිස් ජාවාරමට එරෙහි ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී දායක වීම

**5.4.3 පවතින නීති පද්ධතිය සමාලෝචනය කර අවශ්‍ය සංශෝධන සිදු කිරීම**

සුවිශේෂ ක්‍රියාකාරකම් යටතේ ඇතුලත් කර ඇත.

## 5.5 ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම - 2018

| අනු අංකය | වැඩසටහන / ක්‍රියාකාරකම | 2018 වසර සඳහා වූ ඉලක්ක | | 2018.01.01 දින සිට 2018.12.31 දක්වා ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය |
| 1 | ජාත්‍යන්තර කාන්තා දිනය | 1 | 500,000 | 1 | 216,992 |
| 2 | ලෝක ළමා දිනය | 1 | 400,000 | 1 | 511,488 |
| 3 | වැවිලි අංශයේ කාන්තා සේවිකාවන් දැනුවත් කිරීමට පවත්වනු ලබන වැඩසටහන් | 3 | 114,150 | 3 | 86,445 |
| 4 | කාන්තා සේවිකාවන් දැනුවත් කිරීමට සේවාස්ථ වැඩසටහන් | 5 | 35,000 | 5 | 18,820 |
| 5 | මනෝවිද්‍යා උපදේශන වැඩසටහන් පැවැත්වීම | 4 | 101,800 | 4 | 77,200 |
| 6 | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම | 4 | 24,000 | 4 | 14,850 |
| 7 | රාත්‍රී පරීක්ෂණ පැවැත්වීම | 64 | 270,400 | 71 | 246,500 |
| 8 | *කොග්ගල කාන්තා නේවාසිකාගාරයේ පවත්වනු ලැබූ මනෝවිද්‍යා උපදේශන වැඩමුළුව | 1 | 42,600 | 1 | 42,600 |
| 9 | *වැල්ලවත්ත ප්‍රදේශයේ පාසල් ළමුන් මුහුණ දෙන ගැටළු හා ඒවා වළක්වාලීම සම්බන්ධයෙන් දෙමව්පියන් දැනුවත් කිරීමේ වැඩසටහන | 1 | 96,600 | 1 | 93,600 |

වගුව 5.3 - ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය - 2018

*ජාත්‍යන්තර කාන්තා දිනය හා ලෝක ළමා දිනය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරි වී ඇති ප්‍රතිපාදන වලින් රු. 42,600/= ක ප්‍රතිපාදන යොදාගෙන කොග්ගල කාන්තා නේවාසිකාගාරයේ මනෝවිද්‍යා උපදේශන වැඩමුළුවක් ද රු. 93,600/= ක ප්‍රතිපාදන යොදා ගනිමින් වැල්ලවත්ත ප්‍රදේශයේ පාසල් ළමුන් මුහුණ දෙන ගැටළු හා ඒවා වළක්වාලීම සම්බන්ධයෙන් දෙමව්පියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලදී.

## 5.6 සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාත්මක කිරීම

| අනු අංකය | වැඩසටහන/ ක්‍රියාකාරකම | 2018 වසර සඳහා වූ ඉලක්ක | | 2018 වසර තුළ ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය |
| 1 | ලෝක ළමා ශ්‍රම විරෝධී දිනය | 1 | 675,000 | 1 | 532,323 |
| 2 | දකුණු අප්‍රිකානු ජනරජයේ නියෝජ්‍ය කම්කරු අමාත්‍යවරයා හා ධූත පිරිසේ ශ්‍රී ලංකා චාරිකාව | 1 | 223,800 | 1 | 206,950 |
| 3 | සේවා ස්ථාන වලදී සිදුවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් කාන්තා හිංසනය, පවත්නා තත්ත්වය සමාලෝචනය කිරීමේ වැඩමුළුව | 1 | ලෝක ළමා ශ්‍රම විරෝධී දිනය හා දකුණු අප්‍රිකානු ජනරජයේ නියෝජ්‍ය කම්කරු අමාත්‍යවරයා හා ධූත පිරිසේ ශ්‍රී ලංකා චාරිකාව සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් ඉතිරි වූ ප්‍රතිපාදන යොදා ගනිමින් මෙම වැඩසටහන් පවත්වන ලදී. | 1 | 31,200 |
| 4 | කාන්තාවන් හා තරුණ අය සේවයේ යෙදවීම සම්බන්ධ නීතීන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ප්‍රචාරණ කටයුතු සිදු කිරීම | 1 | | 1 | 208,995 |

වගුව 5.4 - සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය - 2018

* කාන්තාවන් හා තරුණ අය සේවයේ යෙදවීම සම්බන්ධ නීතීන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ප්‍රචාරණ කටයුතු සිදු කිරීමේ වැඩසටහන සඳහා ඉතිරි ප්‍රතිපාදන ඉහත වැය ශීර්ෂයෙන්ම පියවා ගන්නා ලදී.

# 6. ශ්‍රමිකයාගේ සමාජ ආරක්ෂණය

## 6.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ ශ්‍රමිකයන්හට යහපත් ආර්ථික තත්ත්වයක් සහිත විශ්‍රාම දිවියක් උරුම කරදීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදලෙහි පරිපාලනය කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, එහි මුදල්වල භාරය ශ්‍රී ලංකා මහබැංකුවේ මුදල් මණ්ඩලය විසින් දරණු ලැබේ. අරමුදලේ සමස්ත වටිනාකම රුපියල් බිලියන 2,294ක් වන අතර, අරමුදලේ සක්‍රීය හා අක්‍රීය ගිණුම් සංඛ්‍යාව මිලියන 18.5 ක් වේ. වරින් වර සංශෝධනය වූ මෙම පනත යටතේ මේ වන විට ඉටුකරනු ලබන කාර්යභාරය පහත සඳහන් පරිදි වේ. මෙම කාර්ය ඉටු කිරීම දෙපාර්තමේන්තුවේ **සේවක අර්ථ සාධක අරමුදල් අංශයේ** වගකීම වේ.

## 6.2 කාර්යභාරය

6.2.1 සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවා ආයතන ලියාපදිංචි කිරීම
6.2.2 සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම
6.2.3 දායක මුදල් නොගෙවන සේවා දායකයන්ගෙන් දායක මුදල් අයකර ගැනීම
6.2.4 සාමාජිකයන් වෙත ප්‍රතිලාභ මුදල් ගෙවීම් සිදුකිරීම සඳහා ගෙවීම් නියෝග ලබා දීම
6.2.5 අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය

### 6.2.1 සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවා ආයතන ලියාපදිංචි කිරීම

සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ආවරණය වන සියලුම අර්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන අරමුදලේ ලියාපදිංචි විය යුතුය. සේවායෝජකයාට ආයතනය පිහිටි ප්‍රදේශයේ ඇති කම්කරු කාර්යාලයට පැමිණ ලියාපදිංචි වීමට පහසුකම් සලසා ඇත. වාර්ෂිකව එක් එක් කාර්යාලයට ආයතන ලියාපදිංචි කර ගැනීමේ ඉලක්ක ලබා දෙන අතර, කම්කරු නිලධරයන් විසින් තම බල ප්‍රදේශයන්හි අළුතින් අරඹන ආයතන මේ යටතේ ලියාපදිංචි කරගනු ලැබේ. ඒ අනුව 2018 වර්ෂය තුළ ලියාපදිංචි වූ ආයතන සංඛ්‍යාව 9,267කි. 2018 වර්ෂය තුළ අරමුදල වෙත දායක මුදල් බැර කර ඇති ආයතන සංඛ්‍යාව 78,977කි.

### 6.2.2 සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම

සේවක අර්ථසාධක අරමුදල මගින් පහත සඳහන් සේවකයින් ආවරණය වේ.

- ස්ථිර, ආධුනික, තාවකාලික හෝ අනියම් සේවකයන්
- මාසික, අර්ධ මාසික, දවස් පඩි ලබන සේවකයන්
- මෙරට රැකියාවල නියුක්ත විදේශිකයන්
- සේවකයන් 10 දෙනෙකුට වඩා සිටින, පුණ්‍යායතන හා සමාජ සේවා කටයුතු සඳහා පවත්වාගෙන යන ආයතන වල සේවකයන්
- කම්කරු ශ්‍රේණිවල සිට කළමනාකරණ ශ්‍රේණි දක්වා ඕනෑම තරාතිරමක සේවය කරන සේවකයන්

ආයතනයක සේවක අර්ථසාධක අරමුදල් ලියාපදිංචි අංකය යටතේ එහි සේවකයන්ට අනුපිළිවෙලින් අංක ලබා දී ලියාපදිංචි කරවීමෙන් ඔවුහු අරමුදලේ සාමාජිකත්වය ලබති. ලියාපදිංචි වීම කම්කරු දෙපාර්තමේනතුව යටතේ සිදුවන අතර, ඔවුන් වෙනුවෙන් දායක මුදල් තැන්පත් කරගනිමින් ගිණුම් පවත්වාගෙන යාම ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම වේ. ඒ අනුව මෙම ආයතන දෙක වෙතම නිවැරදි තොරතුරු යොමු කිරීමෙන් සාමාජික ලියාපදිංචිය හා ගිණුම් සක්‍රීය කිරීම කළ හැකිය. 2018 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ සාමාජික සංඛ්‍යාව 648,054ක් වන අතර, මේ වන විට සක්‍රීය සාමාජික ගිණුම් මිලියන 2.55 ක් මහ බැංකුවේ පවතී.

| | 2016 වර්ෂය තුළ ලියාපදිංචි සංඛ්‍යාව | 2017 වර්ෂයතුළ ලියාපදිංචි සංඛ්‍යාව | 2018 වර්ෂය තුළ ලියාපදිංචි සංඛ්‍යාව | ලියාපදිංචිය වර්ධනය වූ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|
| | | | | 2016 - 17 | 2017 - 18 |
| සේවා ආයතන ලියාපදිංචි කිරීම | 6507 | 7,718 | 9267 | 1.1% | 1.2% |
| සාමාජිකයන් ලියාපදිංචි කිරීම | 620,806 | 454,971 | 648,054 | -0.73 % | 1.4% |

වගුව 6.1 දායක මුදල් අයකර ගැනීම සඳහා ලියාපදිංචි කිරීම් - 2018

### 6.2.3 දායක මුදල් නොගෙවන සේවා දායකයන්ගෙන් දායක මුදල් අයකර ගැනීම

අරමුදලේ පසුගිය වර්ෂ තුළ වාර්ෂික පොළී අනුපාතය 10%කට වඩා ඉහළ අගයක රඳවා ගැනීමට ශ්‍රීලංකා මහ බැංකුව සමත් වී ඇති අතර, 2018 වර්ෂය සඳහා එය 9.5%කි. එමෙන්ම මෙම පොළිය වැල් පොළිය වශයෙන් අඛණ්ඩව සාමාජිකයාගේ ශේෂයට එකතු වේ. සේවකයාගේ මාසික මුළු ඉපයීම්වලින් අවම වශයෙන් 12% ක් සේවායෝජකයා විසින් ද 8%ක්සේවකයා විසින්ද සේවක අර්ථසාධක අරමුදලට දායක කරන බැවින්, සෑම මසකම සේවකයාගේ මුළු ඉපයීම්වලින් 1/5ක් වැනි විශාලඅගයක් සාමාජිකයාගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත කිරීම සඳහා යෙදවේ.

පනතින් ආවරණය වන සියලුම සේවකයින් වෙනුවෙන් යම් මාසයක දායක මුදල් අදාල සේවා යෝජකයන් විසින් ඊළග මාසයේ අවසන් දිනයට හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කළ යුතුය.

ඒ අනුව 2018 වර්ෂය තුළ අරමුදලට බැර වූ දායක මුදල රුපියල් මිලියන 145,111ක් වන අතර, ඒ සඳහා 9.5% ක වාර්ෂික පොළී අනුපාතය මත වැල් පොළිය වශයෙන් ගණනය කර සාමාජිකයාගේ ගිණුමේ ශේෂයට එකතු වේ.

දායක මුදල් අරමුදලට බැර කිරීමේදී, චෙක්පත් හා ලේඛන ගෙනැවිත් භාරදීමෙන්, තැපෑලෙන් එවීමෙන්, රාජ්‍ය හා වාණිජ බැංකු හරහා මෙන්ම ඉලෙක්ට්‍රොනික ගෙවීම් ක්‍රමය හඳුන්වා දී තිබීම තුලින් සේවා යෝජකයින්ට වඩාත් පහසු හා සුරක්ෂිත ක්‍රමයක් තෝරා ගැනීමට අවස්ථාව සලසා ඇත.

දායක මුදල් නිසි පරිදි නොගෙවන සේවා යෝජකයන් සඳහා ප්‍රථම නිවේදන හා රතු නිවේදන නිකුත් කෙරෙන අතර ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන්නේ නම් නීති මගින් කටයුතු කර දායක මුදල් හා අධිභාර අයකර ගිණුම් ගත කරනු ලැබේ. 2018 වර්ෂයේ දී නිවේදන නිකුත් කිරීම් හා අධිකරණ ක්‍රියාවලි තුලින් අයකරගත් මුදල වගුව6.2 මගින් දැක්වේ.

| අනු අංකය | | නිවේදන ගණන | අයකරගත් මුදල (රු.මි.) |
|---|---|---|---|
| 01 | පළමු නිවේදනය | 14,903 | 4,999 |
| 02 | රතු නිවේදනය | 8,924 | 3,794 |
| 03 | අධිකරණ ක්‍රියාවලිය | 2831 (නඩු සංඛ්‍යාව) | 1,709 |

වගුව 6 .2 - දායක මුදල් නිසි පරිදි නොගෙවන සේවා යෝජකයන් වෙත කරන ලද දැනුම් දීම් - 2018

අධිකරණ කටයුතු මගින් අයකරගන්නා දායක මුදල් කම්කරු කොමසාරිස් ගිණුමට බැර කර, නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමෙන් පසු සාමාජික ගිණුම් වෙත බැර කරනු ලැබේ. වර්ෂය තුළ කම්කරු කොමසාරිස් ගිණුමට රුපියල් මිලියන 8,436 ක් බැර කර ඇති අතර නිරවුල් කළ ප්‍රමාණය රුපියල් මිලියන 8,910 කි.

දායක මුදල් ගෙවීමට සේවා යෝජකයන් අභිප්‍රේරණය කිරීමේ අරමුණින් දායක මුදල් ගෙවීමට නොහැකි වීම සම්බන්ධයෙන් සාධාරණ හේතු දක්වන සේවා යෝජකයන් වෙනුවෙන් වාරික 36 දක්වා වාරික යෝජනා ක්‍රම හඳුන්වා දී ඇත. වර්ෂය තුළ එසේ අනුමත කළ වාරික යෝජනා ක්‍රම ප්‍රමාණය 3604 ක් වන අතර, එයින් රුපියල් මිලියන 778 ක් අරමුදලට බැර කර ඇත. වාරික යෝජනා ක්‍රමය යටතේ හා අධිකරණ ක්‍රියාවලිය යටතේ බැරවන දායක මුදල් සමානුපාතිකව සාමාජික ගිණුම්වලට බැර කරනු ලැබේ.




දායක මුදල් අයකර ගැනීම ප්‍රගතිය

### 6.2.4 සාමාජිකයන් වෙත ප්‍රතිලාභ මුදල් ගෙවීම් සිදුකිරීම සඳහා ගෙවීම් නියෝග ලබා දීම

සාමාජිකයන් වෙත ප්‍රතිලාභ ගෙවන අවස්ථා තුනක් පනත මඟින් හඳුන්වා දී ඇති අතර, ඊට අනුරූපීව වරින් වර නිකුත් කර ඇති රෙගුලාසි මඟින් ඒ සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා සඳහන් කර ඇත.

6.2.4.1 මියගිය සාමාජිකයන් වෙනුවෙන් නාමිකයන්ට / හිමිකම් පාන්නන්ට ප්‍රතිලාභ ගෙවීම
6.2.4.2 සේවක අර්ථසාධක අරමුදලේ සක්‍රිය සාමාජිකයන් සඳහා 30% ක පූර්ව ප්‍රතිලාභ ගෙවීම
6.2.4.3 සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය අවසන් වීම මත සම්පූර්ණ ප්‍රතිලාභ ගෙවීම

#### 6.2.4.1 මියගිය සාමාජිකයන් වෙනුවෙන් නාමිකයන්ට / හිමිකම් පාන්නන්ට ප්‍රතිලාභ ගෙවීම

සේවයේ යෙදී සිටියදී හෝ ප්‍රතිලාභ ලබා ගැනීමට පෙර සාමාජිකයා මිය ගිය අවස්ථාවක ඔහු විසින් නම් කළ අයෙකුට / අයට එම ප්‍රතිලාභ මුදාහරිනු ලැබේ. යම් හෙයකින් වලංගු නම් කිරීමක් නොමැති අවස්ථාවකදී සාමජිකයා වෙනුවෙන් හිමිකම් පාන්නන් හඳුනාගෙන ප්‍රතිලාභ මුදාහරිනු ලැබේ. කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් හා කලාප කම්කරු කාර්යාල 10න් මෙම සේවය ලබා ගැනීමේ පහසුකම් සලසා ඇත. වර්ෂය තුළ මියගිය සාමාජිකයන් වෙනුවෙන් මුදාහළ ප්‍රතිලාභ ප්‍රමාණය වගුව6.3මගින් දැක්වේ.

#### 6.2.4.2 සේවක අර්ථසාධක අරමුදලේ සක්‍රිය සාමාජිකයන් සඳහා 30% ක පූර්ව ප්‍රතිලාභ ගෙවීම

- වසර 10කට නොඅඩු කාලයක් සඳහා අරමුදලට දායක මුදල් ගෙවා තිබීම
- දැනට සේවයේ නියුක්තව සිටීම
- සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ ඔහුගේ බැරට රුපියල් ලක්ෂ තුනකට නොඅඩු මුදලක් තිබීම යන අවශ්‍යතා සම්පූර්ණ කළ සාමාජිකයන්ට නිවාස හා සෞඛ්‍යය හේතූන් මත මෙම ප්‍රතිලාභ ලබා ගත හැක. වර්ෂය තුළ මුදාහළ ප්‍රතිලාභ ප්‍රමාණය වගුව 6.3 මගින් දැක්වේ. කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් හා කලාප කම්කරු කාර්යාල 10 කින් මෙම සේවය ලබාගැනීමේ පහසුකම් සලසා ඇත.

#### 6.2.4.3 සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය අවසන් වීම මත සම්පූර්ණ ප්‍රතිලාභ ගෙවීම

සාමාජිකයකු පහත සඳහන් හේතූන් මත සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය අවසන් වූ පසු තම ගිණුමට බැර වු මුදල ලබා ගැනීමට හිමිකම් ලබයි.

- වයස සම්පූර්ණ වීමෙන් පසු සේවයෙන් ඉවත් වීම

- විවාහ වීමේ හේතුව මත සේවයෙන් ඉවත් වීම (කාන්තාවක් නම් පමණි)
- සදහටම වැඩ කළ නොහැකි තත්ත්වයක් මත සේවයෙන් ඉවත් වීම
- ශ්‍රී ලංකාවෙන් බැහැරව විදේශයක ස්ථිර පදිංචියට යාම මත සේවයෙන් ඉවත් වීම
- ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත සේවයක නියුත්ත වීම මත සේවයෙන් ඉවත් වීම
- ව්‍යාපාර ආයතන රාජ්‍ය සංස්ථා බවට, රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගමක් බවට පරිවර්තනය කිරීම හෝ සේවක සංඛ්‍යාව අඩුකිරීම, යම් රාජ්‍ය සංස්ථාවක් විසුරුවා හැරීමෙන් පසු හෝ යම් රාජ්‍ය සංස්ථාවක් ව්‍යාපාර ආයතන වසා දැමීම මත සේවයෙන් ඉවත් කිරීම

කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් හා දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් කම්කරු කාර්යාල 35 කින් හා උප කම්කරු කාර්යාල 12 කින් මෙම සේවය ලබාගැනීමේ පහසුකම් සලසා ඇත.

## ප්‍රතිලාභ ගෙවීම්

| | ප්‍රතිලාභය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | 2016 වර්ෂය | 2017 වර්ෂය | 2018 වර්ෂය |
| 6.2.4.1 | මියගිය සාමාජික ප්‍රතිලාභ | 4496 | 4738 | 4944 |
| 6.2.4.2 | 30% විශ්‍රාම පූර්ව ප්‍රතිලාභ | 69482 | 69482 | 29876 |
| 6.2.4.3 | විශ්‍රාම වයසට එළඹී සේවයෙන් ඉවත්වූ පසු සේ.අ.අ. ප්‍රතිලාභ ගෙවීම | 87541 | 87268 | 88690 |
| | විවාහ හේතුමත සේවයෙන් ඉවත්වූ කාන්තා සාමාජිකාවන්ට ප්‍රතිලාභ ගෙවීම | 22708 | 22426 | 22522 |
| | පූර්ණ දුබලතාවයට පත්වීම නිසා සේවයෙන් ඉවත්වීම හේතුවෙන් ප්‍රතිලාභ ගෙවීම | 978 | 1048 | 1038 |
| | විදේශ රටක ස්ථිර පදිංචියට යෑම නිසා ප්‍රතිලාභ ගෙවීම | 1755 | 1959 | 2067 |
| | රාජ්‍ය සේවයේ හෝ පලාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලැබීම නිසා සේවයෙන් ඉවත්වීම හේතුවෙන් ප්‍රතිලාභ ගෙවීම | 10133 | 13488 | 7215 |
| | රාජ්‍ය සංස්ථාවක් / මණ්ඩලයක් වසා දැමීම, වියදම් අඩුකිරීමට සේවකයන් ඉවත් කිරීම හෝ සමාගමක් බවට පරිවර්තනය කිරීම හේතුවෙන් සේවය හැරගිය සේවකයන්ට ප්‍රතිලාභ ගෙවීම | 108 | 2785 | 662 |
| | මුලු ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 197,201 | 203,194 | 157,014 |
| | මුදාහළ ප්‍රතිලාභ ප්‍රමාණය (රු.මිලි.) | 108,393 | 117,477 | 106,399 |

වගුව 6.3 සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 2016 සිට 2018 දක්වා




ප්‍රස්ථාරය 6.2 - ප්‍රතිලාභ අයදුම්පත් ලැබීම් හා තීරණ ලිපි ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යැවීම් - 2018

### 6.2.5 අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය

සේවක අර්ථසාධක අරමුදල යටතේ අනුමත අර්ථසාධක අරමුදල් පවතින ආයතන 123 ක් ලියාපදිංචිව ඇති අතර, සමස්ත සාමාජික සංඛ්‍යාව 134,456 කි. එම අරමුදල්වල දායක මුදල් බැර කිරීම, ප්‍රතිලාභ ගෙවීම ඇතුළුව ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කරමින් නිසි ලෙස ක්‍රියාත්මක නොවන අරමුදල් අධිකරණ ක්‍රියාවලිය තුළින් සේවක අර්ථසාධක අරමුදල යටතට පවරා ගනු ලැබේ.

| | |
|---|---|
| ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව | 70 |
| විසඳී ගොනු පියවා ඇති පැමිණිලි සංඛ්‍යාව | 31 |
| ක්ෂේත්‍ර නිලධරයන් විසින් අධීක්ෂණය කරන ලද පු.අ.අ. සම්බන්ධ වර්තා සංඛ්‍යාව | 170 |
| අධීක්ෂණය සිදු කොට ඇති ආයතන සංඛ්‍යාව | 84 |

වගුව 6 .4 අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය ප්‍රගතිය - 2018

## 6.3 අරමුදල ප්‍රවර්ධනය

අරමුදලෙහි පරිපාලනය වඩාත් සඵලවත් කරගනිමින් සාමාජික ජීවන තත්ත්වය උසස් කර ගැනීමෙහිලා පහත කාර්යයන් ඉටු කරනු ලැබේ.

6.3.1 සේවක අර්ථසාධක අරමුදලෙහි ගිණුම් ශේෂය මත පදනම්ව නිවාස ණය ලබාදීම

6.3.2 සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රවර්ධනය සඳහා ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම

6.3.3 ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා කාර්ය මණ්ඩලය වෙත පුහුණු වැඩමුළු සංවිධානය කිරීම

6.3.1 සේවක අර්ථසාධක අරමුදලෙහි ගිණුම් ශේෂය මත පදනම්ව නිවාස ණය ලබාදීම

සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය උසස් කරීමේ අරමුණින් සේවක අර්ථසාධක අරමුදල් ගිණුම් ශේෂය ඇපයට තබා 75% ක් උපරිමයක් දක්වා නිවාස ණය ලබා ගැනීමේ පසුකම සලසා ඇත. ඒ අනුව වර්ෂය තුළ නිවාස ණය ඉල්ලීම් 9,827ක් සඳහා අනුමැතිය ලබා දී ඇත. අනුමැතිය ලබා දී ඇති මුදල රු. බිලියන 4.68 කි.

### 6.3.2 සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

සේවා සේවක දෙපාර්ශවය තුළ සේවක අර්ථසාධක අරමුදල පිළිබඳව ඇති දැනුවත්භාවය වර්ධනය කිරීම හා ලියාපදිංචිය පුළුල් කිරීමේ අරමුණින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක විය. ඒ අනුව 2018 වර්ෂය තුළ සිංහල හා දමිළ මාධ්‍යයෙන් රූපවාහිනී හා ගුවන්විදුලි දැන්වීමක් ප්‍රචාරය කරන ලදී. තවද දිවයින පුරා සියලුම පලාත් ආවරණය වන පරිදි ජංගම සේවා පවත්වන ලද අතර, ඒ පිළිබඳ තොරතුරු වගුව 6.5 දැක්වේ. මහනුවර, මාතලේ දිස්ත්‍රික්කයන්හි හඳුනාගත් වතු ආශ්‍රිතව ජංගම සේවා පැවැත්වීමෙන් එම සේවා සේවක දෙපාර්ශවයටම සේවා සපයන ලදී.

### 6.3.3 ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා කාර්ය මණ්ඩලය වෙත පුහුණු වැඩමුළු සංවිධානය කිරීම

| පැවැත්වූ කාල සීමාව | වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 2018.03.04 - 2018.12.08 | ජංගම සේවා වැඩසටහන් 18 | 1640 |
| 2018.03.08 - 2018.08.18 | පුහුණු වැඩසටහන් 16 | 1945 |

වගුව 6.5 සේවක අර්ථසාධක අරමුදල පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා පැවැත්වූ ජංගම සේවා වැඩසටහන් හා නිලධාරීන් දැනුවත් කිරීම සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන්

ජංගම සේවා වැඩසටහන් ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය මඟින්ද පුහුණු වැඩසටහන් ශ්‍රී ලංකා මහ බැංකුව හා කම්කරු දෙපාර්තමේන්තුව ඒකාබද්ධවද සංවිධානය කරන ලදී.

## 6.4 වෙනත්

6.4.1 සාමාජික තොරතුරු වල විෂමතා නිවැරදි කිරීම සඳහා සලසා තිබූ සේවය විමධ්‍යගත කිරීම තුළින් කාලය, ශ්‍රමය හා මුදල් ඉතිරි කර ගනිමින් තම අවශ්‍යතා ඉටුකරගැනීමේ පහසුව සාමාජිකයන් වෙත සලසා ඇත.

6.4.2 අධීක්ෂණ දත්ත පද්ධතිය හා ගෙවීම් දත්ත පද්ධතියට ප්‍රවේශ අවස්ථා වර්ධනය කිරීම හා ජාල සම්බන්ධතා පුළුල් කිරීම මඟින් සපයනු ලබන සේවාවන්හි කාර්යක්ෂමතාව වැඩි කිරීමටත් ප්‍රධාන කාර්යාලය වෙත පැමිණෙන සාමාජික ප්‍රමාණය සීමා කිරීමටත් හැකි විය.

# 7. ශ්‍රමිකයාගේ සමාජ ආරක්ෂණය

## 7.1 හැඳින්වීම

ශ්‍රමිකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විවිධ පනත් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. සේවකයන් සේවයේ යෙදීමේදී සේවා යෝජකයන් නියමිත පරිදි කම්කරු නීති අනුග මනය නොකිරීම හේතුවෙන් සේවක අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සිදුවේ. මෙහිදී ව්‍යවස්ථාපිත හිමිකම් ශ්‍රමිකයන් වෙත ලබා දීම සඳහා අවශ්‍ය මූලික නෛතික පියවර ගන්නා ලද නමුත් එකඟතාවයක් ඇති නොවන අවස්ථාවලදී අයිතිවාසිකම් උල්ලංඝනය වීම් වැළැක්වීමටත් අයිතිවාසිකම් බලාත්මක කිරීමටත් අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කිරීම මගින් සේවකයා වෙත යුක්තිය ඉටු කර දීමට ක්‍රියාමාර්ග ගනු ලබයි.

මෙම අධිකරණ ක්‍රියා මාර්ග ගැනීම පිළිබඳ සමස්ත වගකීම දෙපාර්තමේන්තුවේ නීති ක්‍රියා අංශය මගින් දරන අතර, සේවක අර්ථසාධක අරමුදල් පනත පිලිබඳ කටයුතු කිරීමේ බලය දිස්ත්‍රික් සහකාර කොමසාරිස්වරුන් වෙතද, පාරිතෝෂික පනත පිලිබඳ කටයුතු කිරීමේ බලය කලාප නියෝජ්‍ය කොමසාරිස්වරුන් වෙතද විමධ්‍යගත කර ඇත. මෙම ක්‍රියාකාරකම් සෑම කලාප කාර්යාලයකම සේවයේ නියුතු නීති නිලධරයන් විසින් අධීක්ෂණය කරනු ලබයි. (2018 වසර වන විට නීති නිලධරයන් සේවයේ යොදවා ඇත්තේ කලාප පහක පමණි).

## 7.2 කාර්ය භාරය

7.2.1 ව්‍යවස්ථාපිත කම්කරු නීති උල්ලංඝනය වීමකදී ඊට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට අදාල කාර්යයන් ඉටු කිරීම හා එම නඩු මෙහෙයවීම

7.2.2 වාණිජ මහාධිකරණයේ, පලාත්බද මහාධිකරණයේ, මහාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ කම්කරු දෙපාර්තමේන්තුවට එරෙහිව හෝ දෙපාර්තමේන්තුව විසින් පවරනු ලබන නඩු වලදී එම නඩු පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව සමග අවශ්‍ය සම්බන්ධීකරණය පවත්වා ගැනීම

7.2.3 කලාප කාර්යාල අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මගින් සිදු කරනු ලබන අධිකරණමය ක්‍රියාවන් අධීක්ෂණය කිරීම හා අවශ්‍ය උපදෙස් ලබා දීම හා එම අධිකරණමය ක්‍රියාවන්හි ප්‍රගතිය පරීක්ෂා කිරීම;

පසුගිය වසර ගණනාවක අක්‍රිය නඩු විශාල සංඛ්‍යාවක් දිස්ත්‍රික් කාර්යාල තුල එක් රැස්ව පැවතීම හේතුවෙන් සේවකයන් හට යුක්තිය නිසි ලෙස ඉටුවී නොතිබුණු තත්ත්වයක් 2018 වසරේදී නිරීක්ෂණය වීම හේතුවෙන් එම කටයුතු විසඳීම සඳහා නීති ක්‍රියා අංශය මගින් අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

එම තත්ත්වයේදී දිස්ත්‍රික් කාර්යාලය විසින් ගතහැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගත් පසුද සක්‍රිය කල නොහැකි නඩු නීති ක්‍රියා අංශයට ලබාගෙන කමිටුවක් මගින් එක් එක් ගොනුවේ කරුණු අධ්‍යයනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමද 2018 වසර තුලදී අරඹන ලදී.

7.2.4 කලාපය තුල පවත්නා දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාලවල හා අධිකරණ ක්‍රියාමාර්ග වලට යොමු විය යුතු අවස්ථාවලදී හා අක්‍රීය නඩු සක්‍රීය කිරීමේ ක්‍රියාවලියේදී අවශ්‍ය උපදෙස් ලබා දීම සහ අවශ්‍ය අවස්ථාවලදී දෙපාර්තමේන්තුව වෙනුවෙන් නඩු මෙහෙයවීම කලාප කාර්යාලවල සේවයේ නියුතු නීති නිලධරයන් ඉටු කරනු ලැබේ.




ප්‍රස්ථාරය 7.1 - සියලුම දිස්ත්‍රික් කාර්යාල මගින් පවරන ලද සහ විසඳී ඇති නඩු - 2018

| අධිකරණය | 2018 වර්ෂයට ඉදිරියට ගෙන ආ ශේෂය | 2018 වර්ෂයේදී ආරම්භ කරන ලද නඩු | 2018 වර්ෂයේදී අවසන් කරන ලද නඩු |
|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 181 | 24 | 0 |
| අභියාචනාධිකරණය | 336 | 47 | 0 |
| මහාධිකරණ | 173 | 50 | 49 |
| දිසා අධිකරණ සහ වාණිජ මහාධිකරණ | 210 | 17 | 11 |

වගුව 7.1 අධිකරණ අනුව නඩුවල කාර්ය සාධනය - 2018

| 2018.01.01 ඉදිරියට ගෙන ආ ශේෂය | විභාග නඩු සංඛ්‍යාව | ලිඛිත දේශන සැකසූ නඩු සංඛ්‍යාව | මහේස්ත්‍රාත් අධිකරණ උපදෙස් නඩු |
|---|---|---|---|
| 54 | 160 | 92 | 179 |

වගුව 7.2 මහේස්ත්‍රාත් අධිකරණ නඩු- 2018

# 8. පරිපාලනය

## 8.1 හැඳින්වීම

ඕනෑම ආයතනයක පාලන අංශය යනු එම ආයතනයේ අභ්‍යන්තර සේවා ලාභීන් හට සේවා සපයන ප්‍රධානතම අංශයයි. යම් ආයතනයක් ස්ථාපනය කරනුයේ බාහිර සේවා ලාභීන්හට සේවා සැපයීම සඳහා වුවත් එම කාර්යය ප්‍රශස්ත අයුරින් ඉටු වීම රඳා පවතිනුයේ අභ්‍යන්තර සේවාලාභීන්ගේ සේවා තෘප්තිය මතය. එබැවින් පාලන අංශයේ මෙහෙවර දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවයට සෘජුවම බලපායි.

ප්‍රධාන වශයෙන්ම දෙපාර්තමේන්තුවේ මානව සම්පත් අවශ්‍යතාව සම්පූර්ණ කිරීම, සේවකයන්ගේ සේවය ස්ථිර කිරීම, කාර්ය සාධනය ඇගයීම, වැටුප් වර්ධක ලබා දීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත කාලය තුල පැවැත්වීම, ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාවට නැංවීම, විශ්‍රාම වැටුප් අප්‍රමාදව සකස් කර දීම වැනි ආයතනික කටයුතුද නිවාඩු අනුමත කිරීම, විනය ක්‍රියාමාර්ග ගැනීම,දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අවශ්‍යතා සම්පූර්ණ කිරීම වැනි දෛනික පාලන කටයුතු හා දෙපාර්තමේන්තුවේ උත්සව හා වැඩසටහන් සංවිධානය, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සංවිධානය කරන වැඩසටහන් හා සම්බන්ධවී කටයුතු කිරීම වැනි කාර්යයන්ද පාලන අංශය විසින් ඉටු කරනු ලැබේ.

මේ හැරුණු කොට දෙපාර්තමේන්තු නිලධරයන්ගේ භාවිතය සඳහාවන පුස්තකාලයද පාලන අංශය යටතේ පවත්වාගෙන යනු ලැබේ.

## 8.2 කාර්යභාරය

### 8.2.1 පරිපාලන ක්‍රියාකාරකම්

කාර්යමණ්ඩලය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම තුලින් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම පහසු වේ. ඒ සඳහා ඉටු කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

- කාර්යාල කාර්ය සහායකයින් 44 ක් බඳවා ගැනීම.
- මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් 588 ගේ කාර්යසාධන ගෙන්වා ගැනීම (1A,1B,2,3,17).
- නිල ඇඳුම් දීමනා 100% ලබාදීම (මුකරු සේවය, රියදුරු, කා.කා.සේ. අදාල සේවකයින් හට)
- වාර්ෂික වැටුප් වර්ධක 1557ක් ලබාදීම.
- විශ්‍රාම වැටුප් ගොනු 52 ක් හා මිනිස් බල අංශය අහෝසි වීම මත විශ්‍රාම ගැන්විය යුතු නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් සකස් කිරීම.
- වත්කම් බැරකම් ප්‍රකාශ 551 ක් ගෙන්වා ගැනීම.
- මානව හිමිකම් කොමිෂන් සභාව, මහජන පෙත්සම් කාරක සභාව වෙත වාර්තා යැවීම.
- සහකාර කම්කරු කොමසාරිස්, ඉංජිනේරු, නීති නිලධාරී, කම්කරු නිලධාරී, මානව සම්පත් සංවර්ධන නිලධාරී, පර්යේෂණ නිලධාරී, විදුලි කාර්මික, ලඝුලේඛක, රියදුරු සහ කාර්යාල කාර්ය සහයක සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව නිලධාරීන් 2669 ක වැටුප් පරිවර්තන කිරීම.
- වසර මැද කාර්යසාධන (වාර්ෂික) 281ක් ගෙන්වා ගැනීම
- සියලුම කාර්යාලවල නිවාඩු තොරතුරු ගෙන්වා ගැනීම
- දෙපාර්තමේන්තු ප්‍රතිව්‍යුහගතකරණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාලව ප්‍රතිව්‍යුහගතකරණයට අදාල නව තනතුරු අනුමත කර ගැනීම සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමෙන් පසු ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.
- වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු 186 ක් ක්‍රියාත්මක කිරීම.
- නිලධරයන්ගේ විනය පාලනයට අදාල කටයුතු.
- පරිවාස කාලය ඉක්මවූ නිලධරයන් 50 ක් ස්ථිර කිරීමට අදාල කටයුතු සිදු කිරීම.
- විදේශ නිවාඩු, ප්‍රසූත නිවාඩු හා අනෙකුත් විශේෂ නිවාඩු අනුමත කිරීමට අදාල සියලුම කටයුතු.

### 8.2.2 ඉදි කිරීම්

දිවයින පුරා විසිරී සිටින කම්කරු ජනතාවට වඩාත් කාර්යක්ෂම සේවයක් සලසාලීම අරමුණු කර ගනිමින් දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක් පාසා ම දිස්ත්‍රික් කම්කරු කාර්යාල ස්ථාපනය කර ඇත. එම කාර්යාල වඩාත් නවීන පහසුකම් ඇති ව ඉදිකිරීම මගින් සේවා ලාභීන්ට තෘප්තිමත් සේවයක් ලබා ගැනීමට හැකි වනවා මෙන්ම හිතකර වැඩ පරිසරයක් නිර්මාණය කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ට ඵලදායි සේවයක් ලබා දීමට ද අවස්ථාව හිමිවේ.

ඒ අනුව 2018 වර්ෂයේදී නව දිස්ත්‍රික් කම්කරු කාර්යාල දෙකක් ඉදිකර විවෘත කරන ලදී. එනම් පොළොන්නරුව, කදුරුවෙල ඉදි කරන ලද මහල් තුනකින් සමන්විත පොළොන්නරුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලය 2018 මාර්තු මස 30 වන දින විවෘත කරන කරන ලද අතර, පුත්තලම, කුරුණෑගල පාර, සේවා මාවතෙහි ඉදි කරන ලද මහල් දෙකකින් සමන්විත පුත්තලම දිස්ත්‍රික් කම්කරු කාර්යාලය 2018 සැප්තැම්බර් මස 06 වන දින විවෘත කරන ලදී.

මීට අමතරව, විශාල වතු කම්කරු ජනතාවක් වෙසෙන හැටන් ප්‍රදේශයේ දැනට පවතින දිස්ත්‍රික් කම්කරු කාර්යාල ගොඩනැගිල්ල කම්කරු දෙපාර්තමේන්තුවේ ආරම්භයත් සමගම ඉදි කරන ලද ඉතා පැරණි ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බැවින් සේවා ලාභීන්ට වඩා පහසු සේවාවක් ලබා දීමේ අටියෙන් නව දිස්ත්‍රික් කම්කරු කාර්යාල ගොඩනැගිල්ලක් සඳහා 2018 සැප්තැම්බර් 30 දින මුල් ගල් තබන ලදී. එසේම, නාඋල උප කම්කරු කාර්යාලය ඉඩකඩ ප්‍රමාණවත් නොවන කුලී ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන බැවින් මහජනතාවට වඩාත් පහසුවෙන් පැමිණීමට හැකි පරිදි, දඹුල්ලේ නව කම්කරු කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.



ඡායාරූපය 8.1 - පොළොන්නරුව දිස්ත්‍රික් කම්කරු කාර්යාල ගොඩනැගිල්ල අතිගරු ජනාධිපතිතුමාගේ සුරතින් 2018.03.30 දින විවෘත කල අවස්ථාව

### 8.2.3 විශේෂ වැඩසටහන් සංවිධානය කිරීම

#### 8.2.3.1 V2025 Enterprise Sri Lanka ප්‍රදර්ශනය

මුදල් අමාත්‍යංශයේ සංකල්පයක් අනුව 2018 අගෝස්තු 17, 18 හා 19 තෙදින මොණරාගලදී පවත්වන්නට යෙදුනු V2025 Enterprise Sri Lanka ප්‍රදර්ශනයෙහිදී කම්කරු දෙපාර්තමේන්තුවෙහි කාර්යභාරය ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලදී. ඊට අමතරව මෙම ප්‍රදර්ශන කුටියේදී සේවක අර්ථසාධක අරමුදල් ශේෂය පිරික්සීම සඳහා සේවා ලාභීන්ට අවස්ථාව සලසා දෙන ලද අතර, කම්කරු ගැටළුවලට විසඳුම් ලබා දීම සඳහා කම්කරු නිලධරයන්ගේ සහාය ලබා දීමටද කටයුතු කරන ලදී. එසේම කර්මාන්ත ආරම්භ කිරීමට බලාපොරොත්තුවන ව්‍යවසායකයන්හට සහ දැනටමත් කර්මාන්ත ආරම්භ කර ඇති ව්‍යවසායකයන්හට කර්මාන්තමය සුරක්ෂිතතාවය සම්බන්ධ උපදෙස් ලබා දීම සිදු කරන ලදී.



ඡායාරූපය 8.2 - කම්කරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ප්‍රදර්ශන කුටියේ ඡායාරූප කිහිපයක්

### 8.2.3.2 ජංගම සේවා වැඩසටහන - බදුල්ල

වතු කම්කරුවන් විශාල ප්‍රමාණයක් වෙසෙන බදුල්ල දිස්ත්‍රික්කයේ කම්කරු ජනතාවට රාජ්‍ය ආයතන හරහා ඉටු කර ගත යුතු සේවාවන් සියල්ල එක ම ස්ථානයකින් සලසා ගැනීමට ඉඩ හසර ලබා දෙමින් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යංශයේ මූලිකත්වයෙන් 2018 සැප්තැම්බර් මස 22 හා 23 දෙදින බදුල්ල මධ්‍ය මහා විද්‍යාලයේදී ජංගම සේවා වැඩසටහක් සංවිධානය කරන ලදී. එහිදී කම්කරු දෙපාර්තමේන්තුව විසින්

- සේවක අර්ථසාධක අරමුදලේ සාමාජික අංක, සාමාජික නම් හා ජාතික හැඳුනුම්පත් අංකවලට අදාල ගැටලු නිරාකරණය කිරීම.
- ආයතන හා සේවා නියුක්තයන් නව ලියාපදිංචි කිරීම්.
- සේවක අර්ථසාධක අරමුදල සඳහා ලියාපදිංචිය හා සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධ අනෙකුත් කරුණු සඳහා අදාල උපදෙස් ලබා දීම.
- සේවක අර්ථසාධක අරමුදල් ශේෂය පරීක්ෂා කර ගැනීම.
- සේවක අර්ථසාධක අරමුදලේ ඇඟිලි සලකුණු සඳහා ලියාපදිංචිය.
- කාර්මික ආරවුල් සම්බන්ධව, වෘත්තීය සමිතිවලට අදාලව, සාමූහික ගිවිසුම් පිළිබඳව ඉදිරිපත්වන ගැටළු නිරවුල් කිරීම හා අදාල උපදෙස් ලබා දීම.
- කාන්තාවන් හා ළමයින් සේවයේ යෙදවීම සම්බන්ධ පැමිණිලි භාර ගැනීම හා පැමිණිලි පරීක්ෂාව.
- නව කර්මාන්ත ලියාපදිංචි කිරීම.
- කර්මාන්තමය සුරක්ෂිතතාව හා වෘත්තීය සෞඛ්‍යයට අදාල දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, උපදෙස් ලබාදීම හා ගැටළු නිරාකරණය කිරීම ආදී වැඩසටහන් ගණනාවක් සිදු කරන ලදී.



ඡායාරූපය 8.3 - සේවා ලාභීන් ලියාපදිංචි කටයුතු සිදුකිරීම

### 8.2.4 පුස්තකාලය හා තොරතුරු සේවාව

සේව්‍ය සේවක ප්‍රජාවගේ අභිවර්ධනයට අදාලව හඳුනාගත් අවශ්‍යතාවයන් හා ගැලපෙන පරිදි විෂයානුබද්ධ තොරතුරු රැස්කිරීමටත්, අවශ්‍යතා අනුව එම දැනුම විස්තීරණය කිරීමට මග පෑදීමටත්, දෙපාර්තමේන්තුවේ සේවකයන්ට සහ පොදු මහජනතාවට කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීමටත් කම්කරු දෙපාර්තමේන්තුව විසින් පුස්තකාලයක් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව, පාඨකයන්ගේ දැනුම, අවබෝධය සහ රසාස්වාදය උදෙසා පොත් හා සඟරා 173ක් වර්ෂය තුලදී අළුතින් මිලදී ගැනීමට කටයුතු කර ඇත.

### 8.2.5 කම්කරු කෞතුකාගාරය

එසේම කම්කරු දෙපාර්තමේන්තුව විසින් කම්කරු කෞතුකාගාරයක් පවත්වාගෙන යනු ලබන අතර එහි ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ ආරම්භයේ සිට විකාශය වූ අයුරු ප්‍රදර්ශනය කිරීමත් කම්කරු ක්ෂේත්‍රය හා බැඳී පවතින පැරණි අණ පනත් හා කම්කරු ක්ෂේත්‍රය හා බැඳී පවතින ලේඛනයන් සංරක්ෂණය කිරීමත් සිදු කරනු ලැබේ.



ඡායාරූපය 8.4 - කම්කරු කෞතුකාගාරය

# 9. මූල්‍ය කළමනාකරණය

## 9.1 හැඳින්වීම

කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරකම් සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා සහ අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීම සඳහා භෞතික සම්පත් මෙන්ම මූල්‍ය සම්පත්ද අත්‍යවශ්‍ය සාධකයකි. ඒ අනුව, වාර්ෂික අයවැය මගින් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලබන මූල්‍ය සම්පත් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, කාර්යක්ෂමව, ඵලදායීව හා පිරිමැසුම්දායීව පරිපාලනය කිරීම මුදල් අංශය විසින් සිදු කරනු ලැබේ.

## 9.2 කාර්යභාරය

දෙපාර්තමේන්තුවේ මූල්‍ය පරිපාලනය කාර්යක්ෂමව සහ විනිවිදභාවයෙන් සිදු කිරීම උදෙසා මුදල් අංශය පහත පරිදි ක්‍රියාත්මක වේ.

- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන සැලැස්ම සැකසීම හා එය ක්‍රියාත්මක කිරීම.
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ලබා ගන්නා ලද භාණ්ඩ හා සේවා නිසි පරිදි බෙදාහැරීම.
- උප කාර්යාල සඳහා අග්‍රිම නිකුත් කිරීම හා එම කාර්යාලවල මූල්‍ය අධීක්ෂණය.
- මාසික අර්ධ වාර්ෂික හා වාර්ෂික ගිණුම් වාර්තා සැකසීම හා අදාල පාර්ශවයන් වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම.
- බාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන සියලුම ලැබීම් හා ගෙවීම් කටයුතු නීතිරීති ප්‍රකාරව මෙහෙයවීම.
- දෙපාර්තමේන්තුව සතු ප්‍රාග්ධන වත්කම් සමීක්ෂණය හා අපහරණ කටයුතු.
- දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පඩිනඩි, ණය අත්තිකාරම් හා දීමනා ගෙවීම.

2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත වාර්ෂික අයවැය මගින් වෙන්කරන ලද පුනරාවර්තන ප්‍රතිපාදනයන්ගෙන් 99.78%ක ප්‍රතිශතයක්ද ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් 82.03%ක ප්‍රතිශතයක්ද දෙපාර්තමේන්තුව විසින් සිය ක්‍රියාකාකම් සඳහා කාර්යක්ෂමව යොදවා ඇත.

| | | |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | ප්‍රතිපාදනය (රු) | 1,619,100,000 |
| | වියදම (රු) | 1,614,473,945 |
| ප්‍රාග්ධන වියදම් | ප්‍රතිපාදනය (රු) | 2,211,000,000 |
| | වියදම (රු) | 1,813,415,443 |

වගුව 9.1 - 2018 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සමස්ත මූල්‍ය ප්‍රගතිය

| වියදම් වර්ගය | 2018 අයවැය ප්‍රතිපාදන | 2018 සත්‍ය වියදම | සත්‍ය වියදම ප්‍රතිපාදනයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම | 58,400,000 | 47,610,510 | 81.5% |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 2,133,950,000 | 1,748,948,052 | 82.0% |
| එකතුව | 2,192,350,000 | 1,796,558,562 | 81.9% |

වගුව 9.2 - 2018 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් වර්ගීකරණය

| වියදම් වර්ගය | 2018 අයවැය ප්‍රතිපාදන | 2018 සත්‍ය වියදම | සත්‍ය වියදම ප්‍රතිපාදනයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 1,241,445,000 | 1,240,122,699 | 99.9% |
| ගමන් වියදම් | 73,687,000 | 73,644,659 | 99.9% |
| සැපයීම | 64,431,000 | 63,494,140 | 98.5% |

| | | | |
|---|---|---|---|
| නඩත්තු සේවා | 18,280,000 | 18,099,327 | 99.0% |
| ඉදිකිරීම් සේවා | 1,298,000 | 1,274,023 | 98.2% |
| වෙනත් සේවා | 195,181,000 | 193,095,984 | 98.9% |
| මාරු කිරීම් | 24,766,790 | 24,731,910 | 99.9% |
| වෙනත් | 11,210 | 11,202 | 99.9% |
| එකතුව | 1,619,100,000 | 1,614,473,945 | 99.7% |

වගුව 9.3 - 2018 වර්ෂයේ පුනරාවර්තන වියදම් වර්ගීකරණය

# 10. සංඛ්‍යා ලේඛන කටයුතු

## 10.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ දිශානතිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, පවතින කම්කරු නීති සහ අණපනත් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම හා ක්ෂේත්‍රය පිළිබඳව අනාගත පුරෝකථනය සඳහා කම්කරු ක්ෂේත්‍රයට අදාලව දත්ත එක් රැස් කර විශ්ලේෂණය කිරීම අත්‍යවශ්‍ය කාරණයකි. එම කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අංශය සංවිධානය වී ඇත.

## 10.2 කාර්යභාරය

ඒ අනුව, සංඛ්‍යා ලේඛන අංශය විසින් පහත කාර්යයන් සිදු කරයි.

- 10.2.1 සේවක අර්ථසාධක අරමුදලට දායක වූ ආයතන පාදක කර ගනිමින් වාර්ෂික රැකීරක්ෂා සමීක්ෂණය සහ පඩිපාලක සභා සඳහා වාර්ෂිකව නියැදි සමීක්ෂණ සිදුකිරීම.
- 10.2.2 කම්කරු ක්ෂේත්‍රයට අදාල මාසිකව අවම වැටුප් දර්ශකාංකය පිළියෙල කිරීම සහ කම්කරු සංඛ්‍යාති ප්‍රකාශනය වාර්ෂිකව එළි දැක්වීම.
- 10.2.3 කම්කරු දෙපාර්තමේන්තුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් දෙපාර්තමේන්තුවලට සහ ශ්‍රී ලංකා මහ බැංකුවට අවශ්‍ය කම්කරු සංඛ්‍යාති ලබා දීම.
- 10.2.4 ජාත්‍යන්තර කම්කරු සංවිධානය ඇතුළු වෙනත් සංවිධානවලට සහ දත්ත අවශ්‍ය ආයතන හා පුද්ගලයින් සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු ලබා දීම.
- 10.2.5 කම්කරු දෙපාර්තමේන්තුවේ සහ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ විවිධ අවශ්‍යතාවයන් සඳහා දත්ත විශ්ලේෂණය සහ වගුගත කිරීමේ කාර්යයන් වලදී අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.

ඉහත සඳහන් ක්‍රියාකාරකම් වලට අතිරේකව පහත කටයුතුද සිදු කරයි

- කම්කරු දෙපාර්තමේන්තුවේ සහ කම්කරු අමාත්‍යාංශයේ දත්ත හා තොරතුරු වගු ගත කිරීමේ සහ විශ්ලේෂණය කිරීමේ කාර්යයන්හිදී අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම.
- කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය මගින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන ශ්‍රී ලංකා සේවක සඟරාව සඳහා දත්ත හා තොරතුරු ලබා දීම.
- දිවයිනේ පවතින කම්කරු කාර්යාල වලට අයත් කොට්ඨාශ දිවයිනේ පරිපාලන ඒකක අනුව හඳුනාගෙන ඒ අනුව සම්මත කේත හඳුන්වාදීම.
- ජාත්‍යන්තර වර්ගීකරණයට අනුව ශ්‍රී ලංකා කර්මාන්ත වර්ගීකරණය (SLSIC - Rev4) සහ රැකියා වර්ගීකරණය (SLSCO-11) අනුව මෙම අංශය විසින් සිදුකරන සමීක්ෂණ සඳහා තොරතුරු රැස්කිරීම හා එම කේත හඳුන්වාදීම.

| වැඩසටහන් / ක්‍රියාකාරකම | | 2018 වසර තුළ සිදු කල රාජකාරි |
|---|---|---|
| 1. | වාර්ෂික රැකිරක්ෂා සමීක්ෂණය 2017 | මුද්‍රණයෙන් සහ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කිරීම |
| 2. | වාර්ෂික රැකිරක්ෂා සමීක්ෂණය 2018 | 2018 සමීක්ෂණයෙන් දත්ත විශ්ලේෂණය කර අවසන් වාර්තාව සකස් කිරීම |
| 3. | කම්කරු සංඛ්‍යාති 2017 වාර්ෂික ප්‍රකාශනය | මුද්‍රණයෙන් සහ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කිරීම |
| 4. | ශ්‍රී ලංකා සේවක සඟරාව කාර්තුමය ප්‍රකාශනය 2018 | ප්‍රකාශනය සඳහා වෙනත් ආයතනවලින් දත්ත එක් රැස්කර ලබාදීම. |
| 5. | සාමාන්‍ය ඉපැයීම් සහ වැඩකල පැය ගණන පිළිබඳ සමීක්ෂණය 2017 | අවසන් වාර්තාව මුද්‍රණයෙන් සහ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කිරීම |
| 6. | සාමාන්‍ය ඉපැයීම් සහ වැඩකල පැය ගණන පිළිබඳ සමීක්ෂණය 2018 | 2017 මාර්තු සහ සැප්තැම්බර් සමීක්ෂණ කටයුතු අවසන් කිරීම |

| | | |
|---|---|---|
| 7. | අවම වැටුප් අනුපාත දර්ශකාංකය ගණනය කිරීම | අදාල කාලය සඳහා පඩි පාලක සභා අනුව මාසික අවම වැටුප් දර්ශකාංකය ගණනය කර එම තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම |
| 8. | සේවක අර්ථසාධක අරමුදල් නව ලියාපදිංචි කිරීම් පරිගණක ගත කිරීම | මේ සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කර ඇති අතර දත්ත ඇතුලත් කර යාවත්කාලීන කිරීමේ කාර්යය සිදු කිරීම |

වගුව 10.1 -ඉටු කරනු ලැබූ කාර්යන් - 2018

# 11. දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මගින් ඉලක්කයන් වෙත මෙහෙයවීම හා මානව සම්පත් සංවර්ධනය

## 11.1 හැඳින්වීම

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම හා උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම, ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය හා අනෙකුත් අමාත්‍යාංශ විසින් ඉල්ලුම් කරනු ලබන දත්ත හා වාර්තා සැපයීම සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශයේ සැලසුම් හා ප්‍රගති සමාලෝචන කාර්ය භාරය වේ.

දෙපාර්තමේන්තුවේ අංශ හා දිස්ත්‍රික් කාර්යාල වල කාර්යයන් අධීක්ෂණය හා එමගින් ලබා ගන්නා දත්ත විශ්ලේෂණය කර ප්‍රගතිය පවත්වා ගැනීම පිණිස අවශ්‍ය නිර්දේශ ලබා දීම මෙම අංශයේ අධීක්ෂණ කාර්යය වශයෙන් ඉටු කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වන පුහුණුව ලබා දීම බාහිර ආයතන විසින් පවත්වන පුහුණු පාඨමාලා වෙත නිලධරයන් යොමු කිරීම, විශ්ව විද්‍යාල උපාධි හා පශ්චාත් උපාධි සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සහ විදේශ පුහුණු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කාර්යය ඉටු කිරීම මෙම අංශය විසින් ඉටු කරනු ලබන මානවසම්පත්සංවර්ධන කාර්යභාරය වේ.

## 11.2 දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මගින් ඉලක්කයන් වෙත මෙහෙයවීම

කම්කරු දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කිරීම සඳහා සියළුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල හා දෙපාර්තමේන්තුවේ සියලු අංශ ක්‍රියාත්මක වන ආකාරය සහ ඉලක්ක කරා යොමු වීම අධීක්ෂණය මගින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ප්‍රවර්ධනය, දෙපාර්තමේන්තුව විසින් ජාතික ආර්ථික සංවර්ධනයට සැපයෙන දායකත්වය ඉහල දැමීම සඳහා අත්‍යවශ්‍ය කාර්යයක් වේ. එම අරමුණ ඉෂ්ඨ කර ගැනීම සඳහා දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාල අධීක්ෂණය සඳහා පැවති ක්‍රමවේදය 2018 වර්ෂයේදී වඩාත් විධිමත් වැඩසටහනක් ලෙස සකස් කර ක්‍රියාත්මක කරන ලද අතර, පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී.

- සේවකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් තහවුරු කිරීම හා කාර්මික සාමය ඇති කිරීම සඳහා, ආයතන (ශ්‍රමික) පරීක්ෂණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම.
- දිස්ත්‍රික් / උප කාර්යාලවල කාර්යයන් ඉටු කිරීමේදී සිදුවන ප්‍රමාදයන් හඳුනාගෙන එම ප්‍රමාදයන් අවම කිරීම තුලින් කාර්යක්ෂම මහජන සේවයක් ලබාදීමට එම කාර්යාල මෙහෙයවීම.
- කාර්යක්ෂමව තම රාජකාරී ඉටු කරන කාර්යාල සහ නිලධාරීන් හඳුනාගෙන ඔවුන් දිරිගැන්වීම හා තව දුරටත් වර්ධනය විය යුතු කාර්යාල හා නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දීම.
- සිය ඉලක්කයන් සාර්ථකව ළඟා කර ගන්නා ලද කාර්යාලවල එම සාර්ථකත්වයට හේතු වූ ක්‍රියා පටිපාටි හඳුනාගෙන ඒවා අනෙකුත් කාර්යාල වෙතද දැනුවත් කිරීම තුලින් සියලුම කාර්යාල දෙපාර්තමේන්තු ඉලක්ක කරා යොමු කිරීම

### 11.2.1 දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාල අධීක්ෂණ ක්‍රියාවලිය

#### 11.2.1.1. අදියර

01. පූර්ව සූදානම් කිරීම සඳහා දැනුම් දීම පරීක්ෂා කිරීම සිදු කරන දිනට සති 02 කට පෙර, පරීක්ෂාවට අවශ්‍ය ගොනු හා වාර්තා සූදානම් කිරීම් සඳහා ලිඛිත උපදෙස් ලබා දීම සිදු කිරීම.

02. දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාල පරීක්ෂා කිරීම
    නියමිත දිනදී අදාල කාර්යාලයේ සූදානම් කල ගොනු හා වාර්තා කටයුතු පරීක්ෂාකර අදාල ආකෘති අනුව තොරතුරු ලබා ගැනීම.

03. විශ්ලේෂිත දත්ත හා නිර්දේශ සහිත වාර්තාව යොමු කිරීම
    පරීක්ෂාවේදී රැස් කල තොරතුරු විශ්ලේෂණය කර ක්‍රියාත්මක වීමේ කාර්යක්ෂමතා / අකාර්යක්ෂමතා

පෙන්වාදී ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳ නිර්දේශ දැක්වෙන වාර්තාවක් කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස්, සියලු කම්කරු කොමසාරිස්වරුන්ට හා කම්කරු කොමසාරිස් ජනරාල් වෙත පිටපත් සහිතව දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාල වෙත යොමු කිරීම.

04. ප්‍රගතිය කලාප මට්ටමින් සමාලෝචනය කිරීම
නිර්දේශ වාර්තාව ලබාදී මාස 2-3 ක් අතර කාලයකදී, දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාල අත් පත් කොට ගෙන ඇති ප්‍රගතිය ඉදිරිපත් කිරීම සඳහා එම කාර්යාලවලට ප්‍රගතිසමාලෝචන රැස්වීමේදී අවස්ථාව ලබා දීම. එහිදී, ඒ ඒ කාර්යාලවල පවත්නා වර්තමාන තත්ත්වයන්, ඒ ඒ නිලධරයා පිළිබඳ ඇගයුම් හා වර්ධනය කල යුතු අංශ පිළිබඳ අදහස් හා යෝජනා ඍජුව ඒ ඒ කාර්යාලවල සහකාර කම්කරු කොමසාරිස් ප්‍රමුඛ නිලධාරීන් වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම රැස්වීම අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල්වරුන් සහ කොමසාරිස්වරුන්ගේ සහභාගීත්වය සහිතව කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් කලාප මට්ටමින් පවත්වනු ලැබේ.

**11.2.1.2 අධීක්ෂණය කරන ලද ක්‍රියාකාරකම්**

01. කම්කරු නිලධරයන්ගේ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු
ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සැලසුම් කිරීම හා අනුමැතිය ලබා ගැනීම, ඒ සඳහා ආයතන තෝරා ගැනීමේදී ප්‍රමුඛතාවය ලබා දිය යුතු ආයතන හා එම ආයතන සහකාර කම්කරු කොමසාරිස් විසින් ලබා දීම, ක්ෂේත්‍ර පරීක්ෂණවල ගුණාත්මකභාවය වර්ග කිරීම, කම්කරු නිලධරයන් විසින් වාර්තා නියමිත දිනයන්ට ලබාදීම හා එම වාර්තාවල නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවයද අධීක්ෂණය කරන ලදී.

02. සේවක අර්ථසාධක අරමුදල අය කිරීම්හි ප්‍රතිලාභ ගෙවීම්
ක්ෂේත්‍ර පරීක්ෂණ හා පැමිණිලි පරීක්ෂණ මගින් ගණනය කරන ලද නොගෙවන ලද හිඟ සේවක අර්ථසාධක අරමුදල් අයකර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමටත් අධීක්ෂණ ක්‍රියාවලියේදී කටයුතු සැලසුම් කරන ලදී. ඒ අනුව, එම කටයුතු පහත ආකාරයට සිදු කරන ලදී.

- පොදු සාක්ෂි ලේඛනය අනුව අයකර ගැනීමට කටයුතු කිරීමට ඇති හිඟ ගොනු
  2008 - 2015 කාලය තුල අය වියයුතු එහෙත් මෙතෙක් අයකර ගැනීමට පියවර ගෙන නොමැති හා ගෙවීම් සිදු කර ඇතත් එම ගෙවීම් තහවුරු කරගෙන නොමැති ගොනු පරීක්ෂාකර අයකර ගැනීමට ඇති ගොනු කඩිනමින් අයකර ගැනීම සඳහා පියවරයන් පැහැදිලි කොට උපදෙස් ලබා දෙන ලදී.

- සේවක අර්ථසාධක අරමුදල් අධීක්ෂණ පද්ධතිය අනුව අයකර ගැනීම.
  2015 වර්ෂයේ සිට අයකර ගැනීමේ පියවරයන් පද්ධතිය මගින් අධීක්ෂණය කරන ලදී. නඩු පවරා නොමැති හා මුළු මුදල ගෙවා නොමැති අය කර ගැනීමේ නිවේදන යවා ඇති හිඟ අයකිරීම් තත්ත්වය පරීක්ෂා කොට පද්ධතිය යාවත්කාලීන කිරීම තුලින්, අයකර ගැනීමට ඇති ගොනු සම්බන්ධයෙන් පමණක් ඍජුව අධීක්ෂණ කිරීම මගින්, අයකර ගැනීමේ කටයුතු කාර්යක්ෂම කර ගැනීමට උපදෙස් ලබා දෙන ලදී.

  හිඟ සේවක අර්ථසාධක අරමුදල් අයකර ගැනීමට නිවේදන යොමු කිරීමට ගතවන කාල සීමා අධීක්ෂණ පද්ධතිය ආශ්‍රයෙන් ලබාගෙන විශ්ලේෂණය කිරීමෙන් එක් එක් නිලධාරියා හා කාර්යාලය මට්ටමෙන්, ප්‍රමාදයන්ට හේතු හඳුනාගෙන ඒවා නිවැරදි කිරීම සඳහා පියවර ගන්නා ලදී.

  හිඟ ගණනය කිරීම් සිදුකර ඇතත් මෙතෙක් නිවේදන යොමුකර නොමැතිවීමට හේතු පරීක්ෂා කර එම හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.

- සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම.
  ප්‍රතිලාභ ගෙවීම සඳහා මාස 03 ක් තුල භාරගෙන ඇති ගොනු ප්‍රමාණය සහ ඊට ගතවී ඇති කාලය මාසිකව විශ්ලේෂණය කඩිනමින් ප්‍රතිලාභ ගෙවීමට නොහැකි වීමට හේතු හඳුනාගෙන, කාර්යක්ෂමව ප්‍රතිලාභ ගෙවීම් ක්‍රියාවලියක් ඇති කිරීමටත් කටයුතු කරන ලදී.

- පෙත්සම් ලේඛනය හා පැමිණිලි මොඩියුලය
  ඒ ඒ දිස්ත්‍රික් හා උප කාර්යාල වෙත ලැබී ඇති පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය සහ විසඳීමේ කටයුතු

ප්‍රමාද වී ඇති ගොනු ප්‍රමාණයන් හඳුනාගෙන ඒවා සඳහා වහාම පියවර ගැනීමට අදාල උපදෙස් හා නිර්දේශ ලබාදීම.

දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල වෙත LISA (Labour Inspection System Application) පද්ධතියේ පැමිණිලි මොඩියුලය මගින් පැමිණිලි කළමනාකරණ කටයුතු අධීක්ෂණය සඳහා අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම් සිදු කරන ලදී. එහිදී LISA පැමිණිලි මොඩියුලය භාවිතා කර පැමිණිලි නිසි පරිදි කටයුතු කලමනාකරණය සිදු කරන කාර්යාල හඳුනාගන්නා ලද අතර, එසේ නොමැති කාර්යාල වෙත අවශ්‍ය උපදෙස්, පුහුණුව හා මග පෙන්වීම් ලබා දෙන ලදී.

- විවෘත වරෙන්තු සහිත නඩු හා අක්‍රීය නඩු
  දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල වල වසර ගණනාවක් පුරා අක්‍රීය, විවෘත වරෙන්තු තත්ත්වයේ ඇති නඩු සක්‍රීය කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා කලාප භාර නීති නිලධාරීගේ සහ උපදෙස් පරිදි කටයුතු කර සක්‍රීය කල නොහැකි ගොනු දෙපාර්තමේන්තුවේ නීති ක්‍රියා අංශය වෙත යොමු කිරීම සඳහා උපදෙස් ලබාදෙන ලදී. එමෙන්ම ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී.

- පොදු තැන්පත් ගිණුම
  පැමිණිලි හා නඩු මගින් අයවී ඇති සේවක අර්ථසාධක අරමුදල් සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් සේවකයන් වෙත ගෙවා නොමැතිව හා ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් ගතකර නොමැතිව පොදුතැන්පත් ගිණුමේ එක්රැස්වී තිබූ අතර, එම මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යැවීමට සහ අදාල ප්‍රතිලාභීන් වෙත ගෙවීමට අදාල පියවර ගැනීම අධීක්ෂණය කිරීම මගින් සහ මෙම වර්ෂයේදී තැන්පත්වන මුදල් අප්‍රමාදව ගෙවීම් කිරීමට පියවර ගැනීම තුලින් ප්‍රතිලාභීන් වෙත මුදල් ගෙවීම් කටයුතු කාර්යක්ෂමව සිදුකිරීමට උපදෙස් ලබාදී ක්‍රියාත්මක වීම අධීක්ෂණය කරන ලදී.

### 11.2.1.3 අධීක්ෂණය අනුව ඉදිරි ඉලක්ක සැකසීම

මෙම අධීක්ෂණ ක්‍රමවේදය අනුව සියලුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල පරීක්ෂා කර ඒ ඒ කාර්යාලයේ ප්‍රගතිය සම්බන්ධ විශ්ලේෂණාත්මක වාර්තා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී. එම ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී එක් කාර්යාලයක් විසින් එක් කාර්යයක් සඳහා ඉහළ ප්‍රගති මට්ටමක් අත්කර ගෙන ඇතත් තවත් කාර්යයක් සඳහා අපේක්ෂිත මට්ටමක ප්‍රගතියක් අත්කර ගෙන නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව, ඉහත සියළු කාර්යයන් සම්බන්ධයෙන් ඉලක්ක සකස් කර එම ඉලක්ක කරා 2019 වර්ෂයේදී ළඟා වීම සඳහා දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මෙහෙයවීම පිළිබඳ කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු දැනුවත් කරන ලදී. ඒ අනුව, 2019 වර්ෂයේදී සියලුම කාර්යාල හා නිලධාරීන් ඒ ඒ ඉලක්කයන් කරා ළඟාවි ඇත්ද යන්න හා ඒ අනුව කාර්ය සාධනය මැනීම පිළිබඳව අවධානය යොමු කිරීමට හැකියාව ලැබේ.

## 11.3 මානව සම්පත් සංවර්ධනය

දෙපාර්තමේන්තුව විසින් සපයන සේවාවල ගුණාත්මක භාවය තීරණය වනුයේ දෙපාර්තමේන්තු නිලධරයන් වෙත තම කාර්ය භාරය පිළිබඳව පවත්නා දැනුම හා ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමට ඇති අවබෝධය මතය. එහෙයින් දෙපාර්තමේන්තුවේ සියළුම මට්ටම්වල නිලධරයන් හට අවශ්‍ය කරන්නා වූ දැනුම හා එම ලැබිය යුතු දැනුමේ නව්‍යතාවන් නිරන්තරව දැනුවත් කිරීම සිදු කිරීම සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශයේ අනෙක් ප්‍රධාන වගකීමකි.

දෙපාර්තමේන්තුව විසින් පුහුණුව ලබා දීමේදී නිලධරයන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව සම්පත්දායකයන් ගෙන්වා පුහුණුව ලබා දීම මගින්ද වෙනත් ආයතන විසින් පවත්වන පාඨමාලා සඳහා සහභාගී වීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම මෙන්ම විදේශ පුහුණුවීම් සඳහා යොමු කිරීමට අවස්ථා ලද විට ඊට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හා සම්බන්ධීකරණය සිදු කිරීම මගින් මෙම පුහුණු කාර්යයන් සිදු කරනු ලැබේ.

ඒ අනුව, පුහුණුව සඳහා යොමුවන ප්‍රධාන පාඨමාලා පහත පරිදිය

1. නිලධරයන් විසින් ඉල්ලීම් කොට, හැදෑරීමට සුදුසුකම් සපුරන විශ්ව විද්‍යාල, සහතිකපත්, ඩිප්ලෝමා, මූලික උපාධි හෝ පශ්චාත් උපාධි පාඨමාලා

2. වෙනත් ආයතන මගින් පවත්වන වෘත්තීය ප්‍රගමනය සඳහා වන පාඨමාලා
3. පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම මත විවිධ මට්ටම්වල නිලධරයන් වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන පුහුණු
4. විදේශ පුහුණු

ඉහත 1 හා 2 පාඨමාලා වෙත නිලධරයන් යොමු කිරීමේදී එම පාඨමාලා වෘත්තීය ප්‍රගමනයට දක්වන දායකත්වය හා ලැබී ඇති මූල්‍ය ප්‍රතිපාදන සීමා තුල එම පාඨමාලා හැදෑරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සලසනු ලබයි.

මේ හැරුනු කොට කලාප ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ නියෝජ්‍ය හා සහකාර කම්කරු කොමසාරිස් රැස්වීම් මගින්ද සේවා සැපයීමේදී ප්‍රායෝගිකව ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීම හා කාර්යයන් ඉටු කිරීමේදී නිලධරයන් මුහුණ දෙන ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීමද සිදු කරයි.






ඡායාරූපය 11.1 සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන්

# පැවැත්වූ පුහුණු වැඩසටහන් - 2018

| | වැඩසටහනෙහි නම | ආයතනය | නිලධාරි කාණ්ඩය | සහභාගී වූ නිලධාරි සංඛ්‍යාව | පිරිවැය රු. | පුහුණු කාලය |
|---|---|---|---|---|---|---|
| පශ්චාත් උපාධි | නීතිය | ICBT CAMPUS | නීති නිලධාරි | 1 | 217,000.00 | පැය 12ට වැඩි |
| | ආර්ථික විද්‍යාව | කැළණිය විශ්ව විද්‍යාලය, කොළඹ විශ්ව විද්‍යාලය | කම්.කො.,ගණකාධිකාරී,නි.කම්.කො,ස.කම්.කො.ණකාධිකාරී,නි.කම්.කො,ස.කම්.කො. | 11 | 441,000.00 | |
| | සමාජ විද්‍යාව | කැළණිය විශ්ව විද්‍යාලය | ස.කම්.කො.,කම්.නි. | 9 | 300,000.00 | |
| | කම්කරු සබඳතා හා මානව සම්පත් කළමනාකරණය | කොළඹ විශ්ව විද්‍යාලය | කම්.නි.,ජ්‍යෙ.කම්.නි | 5 | 500,000.00 | |
| | ව්‍යාපාර පරිපාලනය | වයඹ විශ්ව විද්‍යාලය | ස.කම්.කො. | 1 | 100,000.00 | |
| | | | | | **1,558,000.00** | |
| උපාධි | නීතිය | ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය | ස.කම්.කො.,කම්.නි. | 13 | **176,237.00** | පැය 12ට වැඩි |
| ඩිප්ලෝමා | ඉංග්‍රීසි | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, Miloda Academy of Financial Studied, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | ස.කම්.කො.,කම්.නි. | 4 | 115,000.00 | පැය 12ට වැඩි |
| | කොන්ත්‍රාත් කළමනාකරණය සහ ප්‍රසම්පාදන කළමනාකරණය | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | ස.කම්.කො. | 1 | 90,000.00 | |
| | කම්කරු නීති හා කාර්මික සම්බන්ධතා | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | කම්.නි. | 2 | 154,000.00 | |
| | යාන්ත්‍රික ඉංජිනේරු සැලසුම්කරණ | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය | යාන්ත්‍රික ඉංජිනේරු | 1 | 39,000.00 | |
| | | | | | **398,000.00** | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සහතික පත්‍ර පාඨමාලා | Speedcraft Training with toastmasters | ශ්‍රී ලංකා පදනම් ආයතනය | අති.කම්.කො.ජ | 1 | 15,000.00 | පැය 12ට වැඩි |
| | Advanced Administration & Security | Winsys Networks | රා.ක.ස | 2 | 160,000.00 | |
| | Active & Passive Fire Protection Systems in High Rise Buildings | ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | තාක්ෂණ නිලධාරී | 1 | 10,000.00 | |
| | දත්ත විශ්ලේෂණය | ශ්‍රී ලංකා පදනම් ආයතනය | සහකාර අධ්‍යක්ෂක / කම්.නි | 2 | 40,000.00 | |
| | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ගණකාධිකාරී /රා.ක.ස | 2 | 16,000.00 | |
| | අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | රා.ක.ස | 1 | 6,000.00 | |
| | භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවලිය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | රා.ක.ස | 1 | 8,000.00 | |
| | සාමාන්‍ය ඉංග්‍රීසි | British Council | මහජන සම්බන්ධතා නිලධාරී | 1 | 44,500.00 | |
| | පරිගණක සහතිකපත්‍ර පාඨමාලාව | කොළඹ විශ්ව විද්‍යාලය - මානව සම්පත් අභිවර්ධන ආයතනය | නීති නිලධාරී / රා.ක.ස / සේ.අ.අ. ලිපිකරු | 3 | 75,000.00 | |
| | ඵලදායී සේවයක් සඳහා කාර්යක්ෂම ලේකම්වරියක් | ශ්‍රී ලංකා පදනම් ආයතනය | රා.ක.ස | 1 | 10,000.00 | |
| | රාජ්‍ය මූල්‍ය කළමණාකරණය තුල ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ශ්‍රී ලංකා පදනම් ආයතනය | රා.ක.ස | 1 | 6,500.00 | |
| | රාජ්‍ය නිලධාරීන්ගේ නිවාඩු හා ලේඛන කළමනාකරණය | වෘත්තීය සංවර්ධන ආයතනය | රා.ක.ස | 2 | 25,000.00 | |
| | මූලික විමර්ශනය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | නි.කම්.කො / ස.කම්.කො | 6 | 36,000.00 | |
| | විනය කාර්ය පටිපාටිය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | නි.කම්.කො. / ස.කම්.කො. | 4 | 32,000.00 | |
| | ලිපිගොනුකරණය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | රා.ක.ස | 1 | 3,000.00 | පැය 12ට අඩු |
| | විශ්‍රාම වැටුප් සම්බන්ධ වැඩමුළුව | නිපුනතා සංවර්ධන අරමුදල | රා.ක.ස | 2 | 10,000.00 | |
| | ජාතික විගණන පනත පිලිබඳ සම්මන්ත්‍රණය | ශ්‍රී ලංකා පදනම් ආයතනය | අති.කම්.කො.ජ / ප්‍රධාන ගණකාධිකාරී / කම්.කො. / සිවිල් ඉංජිනේරු / ප්‍රධාන අභ්‍යන්තර විගණක | 11 | 22,000.00 | |
| | ආතති කලමනාකරණය | ශ්‍රී ලංකා පදනම් ආයතනය | කම්.කො / නි.කම්.කො. / කර්.පරීක්ෂක ඉංජිනේරු / ස.කම්.කො / මා.සම්.සං.නි. / රා.ක.ස | 8 | 28,000.00 | |
| | | | | | **547,000.00** | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සැ.පර්.පු.ප්‍ර. අංශය විසින් සංවිධානය කල වැඩසටහන් | රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වන දෙමළ භාෂා සහතිකපත්‍ර පාඨමාලාව - 1,2 | කම්කරු දෙපාර්තමේතුව | කා.කා.ස/ රියදුරු | 300 | 316,600.00 | පැය 12ට වැඩි |
| | නවක රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | කම්කරු දෙපාර්තමේන්තුව | රා.ක.ස | 266 | 101,401.00 | |
| | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව | කම්කරු දෙපාර්තමේන්තුව | කම්.කො / ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී / ඉංජිනේරු / නි.කම්.කො / ස.කම්.කො / පරිපාලන නිලධාරී / තොරතුරු තාක්ෂණ නිලධාරී / ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී / රා.ක.ස නිලධාරී | 62 | 104,185.00 | |
| | කාර්යාල කාර්ය සහයක සේවාරම්භක පුහුණු වැඩසටහන | කම්කරු දෙපාර්තමේන්තුව | කා.කා.ස | 35 | 45,750.00 | |
| | වෘත්තීය සෞඛ්‍ය හා කර්මාන්ත සුරක්ෂිතතාව පිළිබඳ කම්කරු නිලධාරීන් සඳහා වන දෙදින නේවාසික පුහුණු වැඩසටහන | අතුරුගිරිය ජාතික වැවිලි කළමණාකරන ආයතනය | කම්කරු නිලධාරී | 100 | 331,702.80 | |
| | සේ.අ.අ. හා LISA සම්බන්ධ පුහුණු වැඩමුළුව | කම්කරු දෙපාර්තමේන්තුව | රා.ක.ස | 240 | 245,385.00 | |
| | කම්කරු නීතිය පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | නි.කම්.කො / ස.කම්.කො / නීති නිලධාරී / කම්.නි | 200 | 1,518,785.50 | |
| | CLEAR - ළමා පැමිණිලි පිළිබඳව LISA වැඩසටහනට ඇතුලත් කිරීමේ ක්‍රමවේදය හදුන්වා දීම හා ඒ පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම | ප්‍රධාන කාර්යාලය, LISA පරිගණක ඒකකය | නි.කම්.කො / ස.කම්.කො / කම්.නි / තො.තා.නි / රා.ක.ස නිලධාරී | 10 | 1950.00 | පැය 12ට අඩු |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | CLEAR - ළමා පැමිණිලි පිළිබඳව LISA වැඩසටහනට ඇතුලත් කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දීම සහ LISA වැඩසටහන භාවිතයේදී ඇතිවන ගැටළු නිරාකරණය කර ගන්නා ආකාරය පිළිබඳ දැනුවත් කිරීම (දකුණ, උතුරු මැද,සබරගමුව,බස්නාහිර 01,මධ්‍යම, උතුර, නැගෙනහිර, බස්නාහිර 02,03, වයඹ, ඌව කලාපයන්ට අයත් කාර්යාල වල කලමනාකරණ සහකාර නිලධාරීන්) | ප්‍රධාන කාර්යාලය, LISA පරිගණක ඒකකය | රා.ක.ස නිලධාරී | 99 | 69975.00 | |
| | | | | | **2735734.30** | |
| | | | | **1,698** | **5,414,971.30** | |

වගුව 11.1 - පැවැත්වූ පුහුණු වැඩසටහන් - 2018

| වැය ශීර්ෂය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | 2018.12.31 දිනට වියදම (රු) | 2018.12.31 දිනට ශේෂය (රු) | වියදම ප්‍රතිපාදනයන්ගේ ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|---|
| 221-01-01-2401 | 5,000,000.00 | 4,875,205.52 | 124,794.48 | 97.50 |
| 221-02-02-2401 | 150,000.00 | 55,000.00 | 95,000.00 | 36.67 |
| 221-02-03-2401 | 500,000.00 | 169,100.00 | 330,900.00 | 33.82 |
| 221-02-04-2401 | 3,000,000.00 | 2,973,139.30 | 26,860.70 | 99.10 |
| **එකතුව** | **8,650,000.00** | **8,072,444.82** | **577,555.18** | **93.32** |

වගුව 11.2 - ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් සඳහා 2018.12.31 දිනට සමස්ත වියදම - 2018

# 12. සේවා සැපයීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම

සේවාලාභීන්ට සේවය ලබා දීමේදී තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් පරිගණක පද්ධති ඔස්සේ එම සේවා ලබා දීම මගින් සේවය ලබාදීමේ පහසුව වැඩි දියුණු කිරීම කෙරෙහි දෙපාර්තමේන්තුව දැඩි අවධානය යොමු කර ඇත. මේ වන විට සේවක අර්ථසාධක අරමුදල ක්‍රියාත්මක කිරීම සඳහා පරිගණක පද්ධතියක් භාවිතා වන අතර ආයතන (ශ්‍රමික) පරීක්ෂණ වල දත්ත රැස්කිරීම, ඒ මගින් ආයතන පරීක්ෂණවල ක්‍රියාකාරී මට්ටම අධ්‍යයනය හා සිදුකල යුතු වැඩි දියුණු කිරීම් හා කළමනාකරණ තීරණ ගැනීම සඳහා LISA (Labour Inspection System Application) දත්ත පද්ධතිය 2015 වසරේ සිට ක්‍රියාත්මකව පවතින අතර තව දුරටත් වැඩි දියුණු කිරීම් කල යුතුව පවතී.

මෙම පරිගණක පද්ධති දෙකම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර ක්‍රියාවලිය පහසු කිරීම සඳහා සකසා තිබුණද සේවාලාභීන් සමඟ ඍජු සබඳතා පැවැත්වීම සඳහා වැඩි දියුණු කල යුතුව ඇත. එමගින් තම ජංගම දුරකථනය ඔස්සේ තම සේවා අවශ්‍යතා සලසා ගැනීම සඳහා සම්බන්ධ වීමට අවශ්‍ය පහසුකම් සැපයීම ආරම්භ කිරීම අරමුණු කොට මූලික සාකච්ඡා සිදු කරමින් පවතී.

මේ හැරුණු කොට මහජනතාවට සේවා ලබා ගැනීමට අවශ්‍ය අයදුම්පත් ආකෘති හා පනත්, සේවා යෝජකයින් විසින් අවධානය යොමු කල යුතු පඩි පාලක සභා තීරණ ආදී අවශ්‍ය ලේඛන බාගත කරගත හැකි පරිදි දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි පල කර ඇත.

ඒ අනුව, 2018 වසරේදී වෙබ් අඩවිය හරහා දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සේවා පහත පරිදි වේ.

| අ.අ. | දිනය | සේවාව | ඉලක්කගත කණ්ඩායම |
|---|---|---|---|
| 1 | 2018.08.06 | පඩි පාලක සභා තීරණ ත්‍රෛභාෂාවන්ගෙන් බාගත කල හැකි පරිදි පල කිරීම | බාහිර සේවා ලාභීන් |
| 2 | 2018.10.02 | සියළු සේවා සඳහා බඳවා ගැනීමේ පටිපාටි පල කිරීම | අභ්‍යන්තර හා බාහිර සේවා ලාභීන් |
| 3 | 2018.10.18 | අදාලවන කම්කරු කාර්යාලය සොයා ගැනීම ග්‍රාම නිලධාරී වසම සටහන් කිරීම මගින් සිදු කල හැකිවන පරිදි සෙවුම් පහසුකම ලබා දීම | බාහිර සේවා ලාභීන් |
| 4 | 2018.12.02 | සියළු ආකෘති පත්‍ර (නිවාස ණය ආකෘති පත්‍ර ඇතුළුව) ත්‍රෛභාෂාවන්ගෙන් බාගත කර ගත හැකි වන පරිදි පල කිරීම | බාහිර සේවා ලාභීන් |
| 5 | 2018.12.12 | සියළු සංඛ්‍යාලේඛන තොරතුරු (කම්කරු සංඛ්‍යාති, වාර්ෂික රැකී රක්ෂා සමීක්ෂණය ආදිය) ත්‍රෛභාෂාවන්ගෙන් බාගත කර ගත හැකි වන පරිදි පල කිරීම | අභ්‍යන්තර හා බාහිර සේවා ලාභීන් |
| 6 | 2018 වර්ෂය පුරා | පහත තොරතුරු යාවත්කාලීන කිරීම,<br>■ ප්‍රධාන කාර්යයාලයේ අංශ මගින් සපයන සේවා<br>■ ත්‍රෛභාෂාවන්ගෙන් ලැබෙන ප්‍රශ්න සඳහා ත්‍රෛභාෂාවන්ගෙන් පිළිතුරු<br>■ සියළු කම්කරු කාර්යාලයන්ගේ ඇමතුම් තොරතුරු සහ ගූගල් සිතියම මගින් කාර්යාල පිහිටි ස්ථාන සොයා ගැනීමේ පහසුකම | අභ්‍යන්තර හා බාහිර සේවා ලාභීන් |
| 7. | 2018 වර්ෂය පුරා | තොරතුරු ලබා දීම,<br>■ පුහුණු වැඩසටහන්<br>■ විවෘත / සීමිත විභාග තොරතුරු හා ප්‍රතිඵල<br>■ ශිෂ්‍යත්ව<br>■ ලංසු කැඳවීම්<br>■ වෙනත් විශේෂ අවස්ථා | අභ්‍යන්තර හා බාහිර සේවා ලාභීන් |

වගුව 11.3 - වෙබ් අඩවිය හරහා දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සේවා - 2018

# 13. අභ්‍යන්තර විගණනය

අනෙකුත් සියලුම රාජ්‍ය ආයතන මෙන්ම කම්කරු දෙපාර්තමේන්තුව විසින්ද සිය සියලු ක්‍රියාකාරකම් මුදල් රෙගුලාසි, රජය විසින් කලින් කලට නිකුත් කරන ලද චක්‍රලේඛ සහ දෙපාර්තමේන්තුව විසින්ම නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව විධිමත් පරිදි සිදු කල යුතු වේ. ඒ අනුව එම කටයුතු සම්පත්වල ඉහල උපයෝගිතාවයක් සහිතව මනා විනිවිදභාවයකින් සහ ප්‍රශස්ත මට්ටමින් සිදුවේද යන්න අධීක්ෂණය සඳහා කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ඍජු අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන අංශය පිහිටුවා ඇත.

2018 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

- 2018 වර්ෂයට අදාලව සකස් කරන ලද විගණන සැලැස්ම අනුව දිස්ත්‍රික් කම්කරු කාර්යාල 07ක් හා දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය, සේවක අර්ථසාධක අරමුදලේ ගබඩාව (සැපයුම් අංශය) පරීක්ෂා කර විගණන වාර්තා ඉදිරිපත් කර ඇත.

- රජයේ විගණන අංශය මගින් දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යාල පරීක්ෂා කර නිකුත්කර තිබූ විගණන විමසුම් 26 ක් සඳහා පිළිතුරු සපයා ඇති අතර, එයට 2017 වර්ෂයට අදාල සේවක අර්ථසාධක අරමුදලේ සහ දෙපාර්තමේන්තුවේ කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ විගණකාධිපති වාර්තාවල කෙටුම්පත්ද ඇතුලත්ය.

- වර්ෂය තුල කාර්තුමය වශයෙන් විගණන හා කළමනාකරණ රැස්වීම් 04ක් පවත්වා ඇත.

**Labour Secretariat**
**Narahenpita, Colombo 05**
**Phone : (+94)11 2581142 / (+94)11 2581143**
**Fax : (+94)11 2581145**
**Email : contacts@labourdept.gov.lk**



PRINTEC | 0112 815 816